# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## වාර්ෂික වාර්තාව

**2024**

පටුන


| | |
|---|---|
| විශ්වවිද්‍යාල ලාංඡනය | 04 |
| දැක්ම | 04 |
| මෙහෙවර | 04 |
| හරයාත්මක අගයයන් | 05 |
| විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ ඉලක්කය | 05 |
| විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර | 05 |
| උපකුලපතිතුමාගේ පණිවිඩය | 06 – 07 |
| විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීම | 08 - 09 |
| 1. පාලනය සහ කළමනාකරණය | 10 |
| 1.1 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් මණ්ඩලය | 10 - 11 |
| 1.2 විශ්වවිද්‍යාල පාලක සභාව | 12 - 13 |
| 1.3 පාලක සභා අනු කමිටු | 13 |
| 1.4 විශ්වවිද්‍යාලයීය සනාතන සභාව | 14 |
| 1.5 සනාතන සභා අනු කමිටු | 15 |
| 1.6 සංවිධාන ව්‍යුහය | 16 |
| 2. 2024 වර්ෂයේ විශේෂ අවස්ථා | 17 |
| 3. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාත්මක තොරතුරු | 18 |
| 3. 1 අධ්‍යයන කාර්යසාධනය | 18 |
| 3.1.1 අධ්‍යයනාංශ අනුව උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව | 18 |
| 3.1.2 ප්‍රථම උපාධි පාඨමාලා | 19 |
| 3.1.3 2024 වර්ෂයේ උපාධිධාරීන් පිළිබඳ විස්තර | 19 |
| 3.1.4 පීඨ අනුව අධ්‍යයන ශ්‍රේණි සඳහා දායකත්වය | 19 |
| 3.1.5 2024 වර්ෂයේ දී සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම පිළිබඳ විස්තර | 20 |
| 3.1.6 ශිෂ්‍ය පිරිවැය (2024) | 20 |
| 3.1.7 2024 වර්ෂයේ දී සිසුන් අතර නේවාසිකාගාර පහසුකම් බෙදී ඇති ආකාරය | 20 |
| 3.1.8 පශ්චාද් උපාධි පාඨමාලා | 21 |
| 3.1.9 2024 වර්ෂයේදී සක්‍රිය පාඨමාලා පිළිබඳ විස්තර | 21 |
| 3.1.10 බාහිර උපාධි පාඨමාලා | 21 |
| 3.2 කාර්යමණ්ඩල තොරතුරු | 22 |
| 3.2.1 අධ්‍යයන, අධ්‍යයන සහායක සහ විධායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 22 |
| 3.2.2 පරිපාලන සහ මූල්‍ය නිලධාරීන් පිළිබඳ විස්තර | 22 |
| 3.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩය පිළිබඳ විස්තර | 23 |
| 3.2.4 වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ සිදුවූ සමස්ත වෙනස්වීම් | 23 |
| 3.2.5 කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම | 24 |
| අ) අධ්‍යයනාංශ මට්ටමෙන් අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම | 24 |
| ආ) පීඨ මට්ටමෙන් අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම | 25 |
| ඇ) පුස්තකාලය සඳහා කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම | 25 |

| | |
|---|---|
| ඇ) විධායක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම | 26 |
| 3.3 භෞතික යටිතල පහසුකම් | 27 |
| 3.3.1 විශ්වවිද්‍යාලය විසින් ඉඩම් සහ ගොඩනැගිලි උපයෝජනය පිළිබඳ විස්තර | 27 |
| 3.3.2 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති | 28 |
| 3.4 පුස්තකාල ග්‍රන්ථ එකතුව පිළිබඳ විස්තර 2023/2024 | 28 |
| **4. ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර යටතේ 2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය** | 29 |
| 4.1 උපාධිධාරීසේවා නියුක්තිය ඉහළ නැංවීම | 29 |
| 4.1.1. වෘත්තීය මගපෙන්වීම සහ උපදේශනය | 29 |
| 4.1.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාවයේ පිළිබඳ මධ්‍යස්ථානය | 29 |
| 4.1.3 ශාරීරික අධ්‍යාපනය | 30 - 32 |
| 4.2 පර්යේෂණ සහ ප්‍රකාශන වැඩිදියුණු කිරීම | 33 |
| 4.2.1 සී.ඩී.එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකය (CDSKARU) | 33 |
| 4.2.2 2024 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලද පර්යේෂණ පත්‍රිකා / ඉදිරිපත් කිරීම් | 34 - 36 |
| 4.3 නවෝත්පාදන සහ නිර්මාණාත්මක කාර්යයන් | 37 |
| 4.3.1 පර්යේෂණ, නිර්මාණාත්මක කෘති සහ දැනුම ව්‍යාප්තිය සඳහා වූ මධ්‍යස්ථානයේ කාර්යසාධනය | 37 |
| 4.3.2 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය | 38 - 39 |
| 4.3.3 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනී නාලිකාව | 40 |
| 4.3.4 විශ්වවිද්‍යාලීය ව්‍යාපාරික සම්බන්ධක ඒකකය | 41 |
| 4.4 විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකය | 41 |
| 4.4.1 තත්ත්ව සහතික මධ්‍යස්ථානය | 41 |
| 4.4.2 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය | 42 |
| 4.5 ජාතික සහ ජාත්‍යන්තර දායකත්ව සහ සහයෝගීතා | 43 |
| 4.5.1 ජාත්‍යන්තර සහයෝගීතා | 43 |
| 4.5.2 කර්මාන්ත සහයෝගීතාවයන් | 44 |
| 4.5.3 සමාජ සංහිදියාව සඳහා වන මධ්‍යස්ථානය | 44 |
| 4.6 මූල්‍ය තිරසරභාවය | 44 |
| **5. තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ විශ්වවිද්‍යාල කාර්යසාධනය අනුගතවීම** | 45 - 47 |
| **6. විගණන කමිටු වාර්තාව – 2024** | 48 |
| **7. 2024 දෙසැම්බර් 31 වන දින අවසන් වූ වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන** | 49 - 82 |
| **8. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව** | 83 - 90 |
| **9. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව -පිළිතුරු** | 91 - 95 |

## විශ්වවිද්‍යාල ලාංඡනය

විශ්වවිද්‍යාලයීය ලාංඡනයේ දක්වා ඇති ප්‍රධාන රූපය වන්නේ "සීනි මල" වන අතර එය ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මල් රටාවන්ගෙන් වඩාත් කැපී පෙනෙන එකකි. එම නිර්මාණයේ රාමුව රවුම් හැඩයක් ගනියි. මහනුවර ඇම්බැක්ක දේවාලයේ සහ රුහුණු කතරගම දේවාලයේ ලී කැටයම්වල දක්නට ලැබෙන මෙම සාම්ප්‍රදායික මල් නිර්මාණයේ නිරූපණය සාම්ප්‍රදායික කලා ආකෘතීන්ගේ විශිෂ්ටත්වයෙන් පෝෂණය වන ඉතා සංකීර්ණ කලා නිර්මාණ බිහි කිරීමට විශ්වවිද්‍යාලයට ඇති ශක්‍යතාව සංකේතවත් කරයි. ලාංඡනයේ ඇති දුඹුරු සහ ලා කහ වර්ණ සෞන්දර්ය කලාවන් නියෝජනය කරයි. විශ්වවිද්‍යාලයේ නම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලාංඡනයේ අභ්‍යන්තර සහ පිටත කව අතර ඇතුළත් කර තිබේ.

### දැක්ම ප්‍රකාශනය

මානව වර්ගයාගේ සංස්කෘතික ජීවිතය පොහොසත් කිරීම

### මෙහෙවර ප්‍රකාශනය

**මෙහෙවර පිළිබඳ පුළුල් විග්‍රහය**

නිර්මාණාත්මක කලා සහ ඒ ආශ්‍රිත ශික්ෂාවන්හි ලෝකයේ වඩාත්ම යාවත්කාලීන දැනුම, අදාළ විෂයයන්හි පර්යේෂණ සහ නිර්මාණාත්මක භාවිතයන්හි විශිෂ්ටත්වය සඳහා කීර්තිමත්භාවයක් දරන සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් හරහා අපි සමාජය වෙත ලබා දෙන්නෙමු. එමගින් දේශීය සහ විදේශීය සිසුන් යන දෙපාර්ශවයෙන් ම වඩාත්ම ඉල්ලුමක් ඇති නිර්මාණාත්මක කලා විශ්වවිද්‍යාලය බවට අප විශ්වවිද්‍යාලය පත්වනු ඇත. නිර්මාණාත්මක කර්මාන්ත සහ අධ්‍යාපන ක්ෂේත්‍රය යන දෙකෙහිම ප්‍රමුඛයින් බවට පත්වීමට හැකියාව ඇති උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය තුළින් උසස් තත්ත්වයේ වෘත්තික පර්යේෂකයින් අපි බිහි කරන්නෙමු. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් හරහා පර්යේෂණ සහ නවෝත්පාදන මඟින් අපගේ දැනුම නිෂ්පාදනය සුවිගත සහරා, කලා ප්‍රදර්ශන සහ චිත්‍රපට උළෙල වැනි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වේදිකාවල ප්‍රකාශයට පත් කර ප්‍රදර්ශනය කරනු ලැබේ. මූල්‍යමය වශයෙන් සාර්ථක වන අතරම නිර්මාණාත්මක භාවිතයේදී සමාජීය වශයෙන් කැපී පෙනෙන ලෙස කටයුතු කළ හැකි ආකාරය පිළිබඳව නිර්මාණාත්මක කර්මාන්ත සහ ජනමාධ්‍ය සඳහා නිදසුන් දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ පමණක් නොව ලොව පුරා කර්මාන්තය සහ අධ්‍යාපනය සඳහා නව ප්‍රවණතා සඳහා මඟපෙන්වන්නෙකු සහ ප්‍රතිපත්ති සම්පාදකයෙකු මෙන් ම 2030 වන විට ආසියාවේ නිර්මාණාත්මක කලාවන් සඳහා ඉහළ රුචිකත්වයක් දක්වන උසස් අධ්‍යාපන ආයතනය බවට අපි පත්වෙමු.

## හරයාත්මක අගයයන්

i. නවෝත්පාදන සඳහා උනන්දු කරවන අතර සම්ප්‍රදාය සුරැකීම
ii. නිර්මාණාත්මක භාවිතය, පර්යේෂණ සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය
iii. භාව ප්‍රකාශන ඥානය සඳහා අනුබල දීම.
iv. කලාත්මක අනන්‍යතාවය සහ සහයෝගීත්වය ඇතිකිරීම.

## විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ ඉලක්කය

2030 වර්ෂය වන විට ආසියාවේ නිර්මාණාත්මක කලාවන් සඳහා කැප වූ ඉතා ඉහළ ඉල්ලුමක් සහිත සහ මූල්‍යමය වශයෙන් ශක්තිමත් උසස් අධ්‍යාපන ආයතනය බවට පත්වීම.

## විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර

1. උපාධිධාරී සේවා නියුක්තිය
2. පර්යේෂණ සහ ප්‍රකාශන
3. නවෝත්පාදන සහ නිර්මාණාත්මක කාර්යයන්
4. ජාතික සහ ජාත්‍යන්තර දායකත්වය සහ සහයෝගීත්වය
5. මූල්‍යමය තිරසරභාවය
6. ජාත්‍යන්තර දෘෂ්ටිය

## උපකුලපතිතුමාගේ පණිවුඩය



සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ හයවන උපකුලපතිවරයා වශයෙන් මා 2023 ඔක්තෝබර් 12 වන දින මගේ රාජකාරි ආරම්භ කළේ විවිධ ක්ෂේත්‍රයන්හි ගැටලු රැසකට මුහුණ දෙමින් පැවති අභියෝගාත්මක කාලයක ය. මේ වන විට රට මුහුණ දෙමින් සිටින ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ආයතන පවතින තත්ත්වයෙන් ම පවත්වා ගැනීමට, ඉගැන්වීමේ සහ ඉගෙනුම් අරමුණු සඳහා සහ අනෙකුත් කාර්යයන් සඳහා අරමුදල් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සියලුම අධ්‍යාපන ආයතනවලට අනිවාර්ය කර තිබේ. මෙම ගැටලු අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම ඇතුළුව 2023 දී වර්ෂයේදී පැවති අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ වර්ජනය සහ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල හිඟය ඉගැන්වීමේ ගුණාත්මකභාවයට සෘජුවම බලපාන සැලකිය යුතු ගැටළු වේ. මගේ නායකත්වය තුළින් අවධානය යොමු කරනු ලබන්නේ මෙම ගැටළු කළමනාකරණය සහ උපාධිධාරී රැකියා නියුක්තියෙහි සාර්ථකත්වය අත්කර ගැනීම සහ 21 වන සියවසේ කුසලතාවන්ගෙන් සිසුන් සන්නද්ධ කිරීම වේ.

මේ සඳහා පහත දැක්වෙන පරිදි කෙටි කාලීන මෙන් ම දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග රැසක් සැලසුම් කර ක්‍රියාත්මක වෙමින් පවතියි.

**කෙටි කාලීන හා දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග**

- විවිධ සංස්කෘතික කලා ව්‍යාපෘති පැවැත්වීම සඳහා ලංකා සංචාරක මණ්ඩලය, කොළඹ මහ නගර සභාව වැනි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශවයන් සමඟ පවතින කර්මාන්ත හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සහ නව හවුල්කාරිත්වයන් ස්ථාපිත කිරීම.

- විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකයේ සහයෝගීතාවන් වැඩි දියුණු කිරීම.
  2024 වර්ෂයේදී අපි මහරගම තරුණ මධ්‍යස්ථානයේ රාජ්‍ය නාට්‍ය උළෙල සහ නෙළුම් පොකුණ විවෘත රඟහලේ රාජ්‍ය සංගීත සම්මාන උළෙල සාර්ථකව ආවරණය කළෙමු.

- ශිෂ්‍යයින් සතු සුදුසුකම් ගෝලීය වශයෙන් පිළිගැනීම සඳහා උපදෙස් ලබාදීමේ භාෂාව ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම මඟින් සිසුන් සඳහා 21 වන සියවසේ කුසලතා ලබා දීම.

- ජාතික හා ජාත්‍යන්තර සංස්කෘතික ව්‍යාපෘති සහ පර්යේෂණ සහයෝගීතාවයන් (ඕස්ට්‍රේලියානු පරිත්‍යාගශීලියෙකුගෙන් ලැබුණු අරමුදල් භාවිතයෙන්) තුළින් මඩකලපුවේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය සමඟ සහයෝගීත්වයෙන් පර්යේෂණ ව්‍යාපෘති 3 ක් සහ සංස්කෘතික උත්සව 2 ක් සම්පූර්ණ කරන ලදී.

- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පර්යේෂණ වල නිරත සිසුන් ස්වේච්ඡාවෙන් අධීක්ෂණය කරන ජාත්‍යන්තර ශාස්ත්‍රඥයින් සමඟ ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතාවන් පැවැත්වීම.

- ක්ෂේත්‍රයේ කීර්තිමත් පුද්ගලයින් කිහිපදෙනෙකු ස්වේච්ඡා පදනමින් බාහිර මහාචාර්යවරුන් ලෙස පත් කර තිබේ.

- නවීන හා නව්‍ය පර්යේෂණ ව්‍යාප්ති උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

- පර්යේෂණ වාර්තා චිත්‍රපට 3ක් සංවර්ධනය කිරීම, නිර්මාණය කිරීම සහ නිෂ්පාදනය කිරීම
  1. “ගැට/උඩරට බෙරය” නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය
  2. "අං කෙළිය" චාරිත්‍රය
  3. ආන්තිකකරණය කරන ලද මුසල්මානු සංගීතය සහ ඒ පිළිබඳ දූරවබෝධයන් (ශ්‍රී ලංකාවේ)

- කඩදාසි පාදක මෙහෙයුම් වලින් ඩිජිටල් මෙහෙයුම් වෙත මාරුවීම මඟින් බලශක්තිය (තාප, ජල විදුලිබල, පුනර්ජනනීය සිට මිනිස් බලශක්තිය දක්වා සියලු වර්ගවල බලශක්ති) සුරැකීම.

**දීර්ඝ කාලීන ක්‍රියාමාර්ග**

- උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ඉහළ නැංවීම
- විශ්වවිද්‍යාලය තුළ පවතින ඉඩකඩ ගැටලුව මඟහරවා ගැනීම සඳහා සුදුසු ඉඩම් සහ ගොඩනැගිලි අත්පත් කර ගැනීම ඇතුළුව ඉගැන්වීම් සහ ඉගෙනීම සඳහා භෞතික හා මානව සම්පත් සහ පහසුකම් සපයා ගැනීම
- කාර්ය මණ්ඩල පර්යේෂණ කුසලතා සහ පර්යේෂණ කටයුතුවල නියැලීම වැඩි දියුණු කිරීම

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ සහ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන් ඇතුළත්ව විද්‍යාර්ථීන් සමඟ කටයුතු කිරීමට මම අපේක්ෂා කරමි.

**මහාචාර්ය රොහාන් නෙත්සිංහ**
**නිර්මාණ කලා අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය**
PhD (Monash University); MFA (Donetsk Conservatory (USSR), GradDipEd (Sec), BEd (H1) (Monash University); Dip in TAE, Dip in VET Prac, Dip VET (Chisholm TAFE, Australia).
**උපකුලපති**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**

## විශ්වවිද්‍යාලය පිළිබඳ හැඳින්වීම

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ දෘශ්‍ය හා රංගන කලාවන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම මෙන් ම මෙම අධ්‍යයන ක්ෂේත්‍රයන්හි පිළිගත් උසස් අධ්‍යාපන සුදුසුකම් පිරිනැමීම සඳහා ය. මෙම ප්‍රධාන අරමුණ සපුරා ගැනීමේදී දක්ෂ බුද්ධිමතුන් සංවර්ධනය කිරීම, පර්යේෂණ සහ නව නිපැයුම් පුළුල් කිරීම සහ කර්මාන්තය සහ ප්‍රජාව සමඟ සහයෝගීතාවය ශක්තිමත් කිරීම තුළින් දෘශ්‍ය හා රංගන කලාවන්හි අධ්‍යාපනයේ උසස් බව සහ විවිධත්වය පොහොසත් කිරීමට විශ්වවිද්‍යාලය උත්සාහ කරයි.

ශ්‍රී ලංකාව සතුව ක්‍රි.පූ. 3 වන සියවස දක්වා දිවෙන අනර්ඝ කලාත්මක උරුමයක් පවතින අතර මුල් කාලීන සිතුවම් හා මූර්ති බෞද්ධ විහාරස්ථාන හා පූජා විධි තුළ මුල් බැස ඇත. බොහෝ කලකට පසුව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී බටහිර ස්වාභාවික සිතුවම් හඳුන්වාදීම සිදු විය. සාම්ප්‍රදායික කලා ආකෘතීන් සංරක්ෂණය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් බ්‍රිතාන්‍යයන් විසින් 1893 දී ලංකා කාර්මික පාසැල ආරම්භ කළ අතර, පසුව 1906 දී ලංකා කාර්මික විද්‍යාලය ලෙස නම් කරන ලදී. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විධිමත් කලා අධ්‍යාපනය සඳහා අඩිතාලම සපයමින් චිත්‍රකර්මය, පින්තාරු කලාව, ඡායාරූපකරණය, මූර්ති ශිල්පය, රෙදි විවීම, සම් වැඩ සහ මැටි වැඩ පිළිබඳ පාඨමාලා පිරිනමන ලදී.

1949 දී, ලංකා කාර්මික විද්‍යාලයේ කලා හා ශිල්ප අධ්‍යයනාංශය ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියෙකු සහ අධ්‍යාපනඥයෙකු වන ජේ.ඩී.ඒ. පෙරේරාගේ නායකත්වය යටතේ කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ පිහිටි හේවුඩ් මන්දිරය වෙත ගෙන යන ලදී. මේ වන විට එහි කලාත්මක උරුමය සුරකිමින් මෙම ස්ථානයේ දෘශ්‍ය කලා පීඨය සහ ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරය පිහිටුවා තිබේ. 1952 දී මෙම අධ්‍යයනාංශය රජයේ කලා ආයතනය ලෙස උසස් කරන ලද අතර ඊට සංගීතය සහ නර්තනය ඇතුළත් කිරීම සඳහා එහි විෂය මාලාව පුළුල් කරන ලදී. 1953 දී එය රජයේ ලලිත කලායතනය ලෙස නම් කරන ලද අතර අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ස්වාධීන අධ්‍යයනාංශයක් බවට පත්විය. ශිෂ්‍යයින් තුළ මෙම විෂයන් කෙරෙහි වන උනන්දුව වර්ධනය වීම හේතුවෙන් සංගීත හා නර්තන වැඩසටහන් පසුව කොළඹ 07, ඇල්බට් චන්ද්‍රවංකය වෙත ගෙන යන ලදී. 1960 දී මෙම ආයතනය ජාතික කලායතනය ලෙස නම් කර සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට ගන්නා ලදී. 1965 වන විට මෙම ආයතනය තවදුරටත් වෙනස් විද්‍යාල තුනක් ලෙස පුළුල් කරන ලදී:

1. රජයේ චිත්‍ර විද්‍යාලය
2. රජයේ සංගීත විද්‍යාලය
3. රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය

1974 වර්ෂයේ දී මෙම විද්‍යාල ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයට අනුබද්ධ සෞන්දර්ය අධ්‍යයන ආයතනයට 1978 දී ඒකාබද්ධ කරන ලද යාපනයේ රාමනාදන් ඇකඩමිය ඊට අන්තර්ගත කරන ලදී. සෞන්දර්ය අධ්‍යයන ආයතනය කලාව හා මූර්ති, සංගීතය සහ නර්තන හා මුද්‍රා නාට්‍ය සඳහා අධ්‍යයනාංශ වලින් සමන්විත විය. 1978 දී ආයතනය ප්‍රථම වරට ලලිත කලාවේදී උපාධිය ප්‍රදානය කළ අතර සිසුන් 63 දෙනෙකු එම කණ්ඩායමට ඇතුළත් විය. 1980 දී සෞන්දර්ය අධ්‍යයන ආයතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කළ අතර රාමනාදන් ඇකඩමිය යාපනය විශ්ව විද්‍යාලයට මාරු කරන ලදී. එම වසරේදී ම තවත් සෞන්දර්ය අධ්‍යයන මධ්‍යස්ථානයක් වූ හොරණ ශ්‍රීපාලි කලායතනය සෞන්දර්යය අධ්‍යයන ආයතනයට ඒකාබද්ධ කරන ලද අතර එය 1993 දී කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී. 1974 වර්ෂයේ සිට සෞන්දර්ය අධයයන ආයතනය කලාව පිළිබඳ උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය ලෙස ස්ථාපිත විය.

විශේෂිත සෞන්දර්ය අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුමට ප්‍රතිචාර ලෙස සෞන්දර්ය අධ්‍යයන ආයතනය 2005 දී විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ශ්‍රී ලංකාවේ 15 වන රාජ්‍ය විශ්වවිද්‍යාලය බවට පත්විය. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 2005 ජූලි 8 වන දිනැති අංක 1400/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2005 ජූලි 1 වන දින නිල වශයෙන් ආරම්භ කරන ලදී. මූලික වශයෙන් ආරම්භ කරන ලද විද්‍යාල තුන පහත පරිදි ප්‍රතිව්‍යුහගත කරන ලදී:

- දෘශ්‍ය කලා පීඨය
- සංගීත පීඨය
- නර්තන හා නාට්‍ය කලා පීඨය

අද වන විට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පීඨ තුනකින්, අධ්‍යයනාංශ 24 කින්, පශ්චාද් උපාධි පීඨයකින් සහ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයකින් සමන්විත වේ. ප්‍රථම උපාධි, පශ්චාද් උපාධි සහ දුරස්ථ අධ්‍යයන අවශ්‍යතා සඳහා ඉල්ලුම වැඩිවීමත් සමග මෙම විශ්වවිද්‍යාලය එහි පාඨමාලා පුළුල් කර ඇත.

අභියෝග මධ්‍යයේ වුවද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය දෘශ්‍ය හා රංගන කලාවන් සඳහා පමණක් කැප වූ ශ්‍රී ලංකාවේ එකම විශ්වවිද්‍යාලය වන අතර කලාව, සංගීතය, නැටුම් සහ නාට්‍ය යන කලාත්මක විෂයයන් සංරක්ෂණය, නවෝත්පාදනය සහ ප්‍රවර්ධනය කිරීමේ එහි මෙහෙවර තහවුරු කරයි. ඉගැන්වීම, පර්යේෂණ සහ කර්මාන්ත සහයෝගීතාවයේ විශිෂ්ටත්වය තුළින් සමාජය තුළ සෞන්දර්යය සඳහා ගැඹුරු අගය කිරීමක් වර්ධනය කරන අතරම ජාතික හා ජාත්‍යන්තර කලාත්මක පසුතලය වැඩිදියුණු කිරීමෙහි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අඛණ්ඩව නිරත වෙමින් සිටියි.

# 1. පාලනය සහ කළමනාකරණය

## 1.1 විශ්වවිද්‍යාලයේ නිලධාරී මණ්ඩලය

**කුලපති**

සම්මානිත මහාචාර්ය සුනිල් ආරියරත්න



**උපකුලපති**

මහාචාර්ය රොහාන් නෙත්සිංහ



**පීඨාධිපතිවරු**

**පශ්චාද් උපාධි අධ්‍යයනාංශය**

මහාචාර්ය කෝලිත භානු දිසානායක
(2024.02.11 දින දක්වා)



මහාචාර්ය
කේ.ඩබ්ලිව්.කේ.එම්.එම්.ඩබ්ලිව්. අයි.
ෆර්ඩිනැන්ඩු
(2024.02.12. දින සිට)



**දෘශ්‍ය කලා පීඨය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවීන්ද්‍ර
(2024.12.10 දින දක්වා)



ආචාර්ය අයි.එම්.ටී.ඉලංගසිංහ මහතා
(2024.12.11 දින සිට)



**සංගීත පීඨය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. සරත් ප්‍රනාන්දු මහතා



**නර්තන හා නාට්‍ය කලා පීඨය**

මහාචාර්ය කේ.එම්.එස්.කුමාරතුංග මහතා



**ලේඛකාධිකාරී**

ඩී.එන්.ගුරුසිංහ මිය
ලේඛකාධිකාරී (වැ.බ.)
(2024.03.31 දක්වා)



පී.ජී.එස්.පී.නානායක්කාර මිය
ලේඛකාධිකාරී (වැ.බ.)
(2024.04.01 දින සිට 2024.09.01 දින දක්වා)



ආචාර්ය චානි ඉඹුල්ගොඩ
ලේඛකාධිකාරී
(2024.09.02 දින සිට)



**පුස්තකාලයාධිකාරී**

ආචාර්ය ජී.ආර්.පද්මසිරි මහතා



**මූල්‍යාධිකාරී**

ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. වන්නිනායක මහතා



## 1.2 විශ්වවිද්‍යාලීය පාලක සභාව

විශ්වවිද්‍යාලයීය පාලක සභාව එහි විධායක බලමණ්ඩලය සහ පාලන අධිකාරිය වන අතර 2024 වර්ෂයේ දී එහි සංයුතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| **උපකුලපති (සභාපති)** | මහාචාර්ය රොහාන් නෙත්සිංහ |
| **පීඨාධිපතිවරු** | *<u>පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය</u>*<br>මහාචාර්ය කෝලිත භානු දිසානායක (2024.02.11 දින දක්වා)<br>මහාචාර්ය කේ.ඩබ්ලිව්.කේ.එම්.එම්.ඩබ්ලිව්. අයි. ෆර්ඩිනෑන්ඩු (2024.02.12 දින සිට)<br>*<u>දෘශ්‍ය කලා පීඨය</u>*<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවීන්ද්‍ර මහතා (2024.12.10 දින දක්වා)<br>ආචාර්ය අයි.එම්.ටී.ඉලංගසිංහ මහතා (2024.12.11 දින සිට)<br>*<u>සංගීත පීඨය</u>*<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ .සරත් ප්‍රනාන්දු මහතා<br>*<u>නර්තන හා නාට්‍ය කලා පීඨය</u>*<br>මහාචාර්ය කේ.එම්.එස්.කුමාරතුංග මහතා |
| **සනාතන සභා නියෝජිතයින්** | මහාචාර්ය වජිර නලින්ද ජයතිලක මහතා (2024.07.14 දින දක්වා)<br>ආචාර්ය ඩී.ඩබ්ලිව්. සල්ගමුව මහතා<br>ආචාර්ය එච්.එම්.එස්.එස්. හේරත් මහතා (2024.07.25 දින සිට) |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජිකයින්** | මහාචාර්ය නිමල් කීර්ති දංගල්ල මහතා<br>වෛද්‍ය චන්ද්‍රවංශ පතිරාජ මහතා<br>ප්‍රසන්ත ලාල් ද අල්විස් මහතා (ජනාධිපති උපදේශක)<br>ටී.ධර්මරාජ් මහතා<br>සුරේෂ් ඩොමිනික් මහතා<br>අජිත ද කොස්තා මහතා (2024.01.19 දින දක්වා)<br>මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා (2024.07.25 දක්වා) |

| | |
|---|---|
| **ලේඛකාධිකාරී**<br>(පාලක සභාවට නිල බලයෙන් පත්වන ලේකම්) | ඩී.එන්.ගුරුසිංහ මිය<br>ලේඛකාධිකාරී (වැ.බ.)<br>(2024.03.31 දින දක්වා )<br><br>පී.ජී.එස්.පී. නානායක්කාර මිය<br>ලේඛකාධිකාරී (වැ.බ.)<br>(2024.04.01 දින සිට 2024.09.01 දින දක්වා)<br><br>ආචාර්ය චානි ඉඹුල්ගොඩ මිය<br>ලේඛකාධිකාරී<br>(2024.09.02 දින සිට) |

## 1.3 පාලක සභා අනු කමිටු

| | | |
|---|---|---|
| 01. | මූල්‍ය කමිටුව | (සභාපති - උපකුලපති) |
| 02. | විගණන කමිටුව | (සභාපති - වි.වි.ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජික, ටී.ධර්මරාජ් මහතා , වරලත් ගණකාධිකාරී ) |
| 03. | ඉඩම් සහ ගොඩනැගිලි කමිටුව | (සභාපති – උපකුලපති) |
| 04. | නිවාඩු සහ ප්‍රදාන කමිටුව | (සභාපති – උපකුලපති) |
| 05. | බැදුම්කර ප්‍රතිසාධන සමාලෝචන කමිටුව | (සභාපති – උපකුලපති) |
| 07. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනී නාලිකාවේ කළමනාකරණ මණ්ඩලය | (සභාපති – උපකුලපති) |
| 08. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මුද්‍රණාලයේ කළමනාකරණ මණ්ඩලය | (සභාපති – උපකුලපති) |

## 1.4 විශ්වවිද්‍යාලයීය සනාතන සභාව

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරි පාලනය සහ උපදේශනය, අධ්‍යාපනය, පර්යේෂණ සහ පරීක්ෂණ සම්බන්ධයෙන් මහපෙන්වීම සපයනු ලබන්නේ විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසිනි.

| | |
|---|---|
| **උපකුලපති (සභාපති)** | මහාචාර්ය රොහාන් නෙත්සිංහ |
| **පීඨාධිපතිවරු** | |
| | *පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය*<br>මහාචාර්ය කෝලිත භානු දිසානායක මහතා<br>(2024.02.11 දින දක්වා) |
| | මහාචාර්ය කේ. ඩබ්ලිව්. කේ.එම්.එම්.ඩබ්ලිව්.අයි ෆර්ඩිනැන්ඩු මහතා<br>(2024.02.12 දින සිට) |
| | *දෘශ්‍ය කලා පීඨය*<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවින්ද්‍ර මහතා<br>(2024.12.10 දින දක්වා) |
| | ආචාර්ය අයි.එම්.ටී. ඉලංගසිංහ මහතා<br>(2024.12.11 දින සිට) |
| | *සංගීත පීඨය*<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ.එස්.ප්‍රනාන්දු මහතා |
| | *නර්තන හා නාට්‍ය කලා පීඨය*<br>මහාචාර්ය කේ.එම්.එස්.කුමාරතුංග මහතා |
| **සියලුම අධ්‍යයනාංශ ප්‍රධානීන්** | |
| **සියලුම ස්ථිර මහාචාර්යවරු** | |
| **පුස්තකාලයාධිකාරී** | ආචාර්ය ජී.ආර්.පද්මසිරි මහතා |
| **පීඨ නියෝජනය කරන ආචාර්යවරු දෙදෙනෙකු බැගින්** | |
| **ලේඛකාධිකාරී (නිල බලයෙන් සනාතන සභාවේ ලේකම්)** | ඩී.එන්.ගුරුසිංහ මිය, ලේඛකාධිකාරී (වැ.බ)<br>(2024.03.31 දක්වා) |
| | පී.ජී.එස්.පී. නානායක්කාර මිය, ලේඛකාධිකාරී (වැ.බ.)<br>(2024.04.01 දින සිට 2024.09.01 දින දක්වා) |
| | ආචාර්ය වානි ඉඹුල්ගොඩ මිය, ලේඛකාධිකාරී<br>(2024.09.02 දින සිට) |

## 1.5 සනාතන සභා අනු කමිටු

| | | |
|---|---|---|
| 01. | පුස්තකාල කමිටුව | (සභාපති – උපකුලපති) |
| 02. | ප්‍රවේශ කමිටුව | (සභාපති – උපකුලපති) |
| 03. | විභාග අක්‍රමිකතා කමිටුව | (සභාපති – උපකුලපති) |
| 04. | ගරු උපාධි කමිටුව | (සභාපති – උපකුලපති) |
| 05. | උපාධි ප්‍රධානෝත්සව කමිටුව | (සභාපති – උපකුලපති) |
| 06. | විෂයමාලා ඇගයීම් කමිටුව | (සභාපති – උපකුලපති) |
| 07. | පර්යේෂණ සහ නිර්මාණාත්මක කාර්ය කළමනාකරණ කමිටුව | (සභාපති – උපකුලපති) |
| 08. | ආචාරධර්ම කමිටුව | (සභාපති / පීඨාධිපති – පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය) |
| 09. | අභියාචනා මණ්ඩල | (සභාපති / පීඨයේ ජ්‍යෙෂ්ඨතම පීඨාධිපති) |

## 1.6 සංවිධාන ව්‍යුහය




### කෙටි යෙදුම් ලැයිස්තුව

CODL - විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය
SDC - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
CGU - වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය
CQA - තත්ත්ව සහතික මධ්‍යස්ථානය
PEU – ශාස්ත්‍රීය අධ්‍යාපන ඒකකය
CIR – ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථානය
CSR – සමාජ සහජීවනය සඳහා වන මධ්‍යස්ථානය
C de S KR –සී.ඩී.එස් කුලතිලක සංරක්ෂණ හා පර්යේෂණ
CGEE - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ හා සමානාත්මතාවය පිළිබඳ මධ්‍යස්ථානය
UBL – විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකය
CRCWKD – පර්යේෂණ , නිර්මාණාත්මක කාර්ය සහ දැනුම් ව්‍යාප්ති මධ්‍යස්ථානය
CCA – සංකල්පීය මානව විද්‍යා මධ්‍යස්ථානය

## 2. 2024 වර්ෂයේ විශේෂ අවස්ථා

**විශ්වවිද්‍යාලයේ දෙවන ලේඛකාධිකාරී පත්කිරීම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනසූරි උපාධියක් හිමි වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සංගමයේ සහ සාමාජිකයෙකු වන ආචාර්ය වානි ඉඹුල්ගොඩ මහත්මිය 2024 සැප්තැම්බර් 2 වන දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෙවන ලේඛකාධිකාරී ලෙස වැඩ භාර ගත්තාය. මෙය විශ්වවිද්‍යාලයේ පරිපාලන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන අතර පාලනයේ සහ ආයතනික සංවර්ධනයේ විශිෂ්ටත්වය සඳහා එහි කැපවීම ශක්තිමත් කරයි.

**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට සහ දෘශ්‍ය කලා පීඨයට නව පීඨාධිපතිවරු පත්කිරීම**

ජාතික හා ජාත්‍යන්තර සම්මානලාභී ශ්‍රී ලාංකික නාට්‍ය වෘත්තිකයෙකු සහ චිත්‍රපට නිෂ්පාදකයෙකු වන නර්තන හා නාට්‍ය කලා පීඨයට අනුයුක්ත මහාචාර්ය කේ.ඩබ්ලිව්.කේ.එම්.එම්.ඩබ්ලිව්.අයි. ෆර්ඩිනැන්ඩු මහතා 2024 පෙබරවාරි 12 වන දින උපාධි අධ්‍යයන පීඨයේ 3 වන පීඨාධිපති ලෙස පත් කරන ලදී. මහාචාර්ය ෆර්ඩිනැන්ඩු මහතා පීඨයට සිය අත්දැකීම් රැසක් මෙන් ම විශේෂඥතාව මුසු කරයි.

කීර්තිමත් කලාකරුවෙකු වන දෘශ්‍ය කලා පීඨයට අනුයුක්ත ආචාර්ය අයි.එම්.ටී. ඉලංගසිංහ මහතා 2024 දෙසැම්බර් 11 වන දින දෘශ්‍ය කලා පීඨයේ 7 වන පීඨාධිපති ලෙස පත් කරන ලදී. දෘශ්‍ය කලා ක්ෂේත්‍රයේ ඔහුගේ කීර්තිමත් වෘත්තීය ජීවිතය පීඨයේ අධ්‍යයන හා නිර්මාණාත්මක කටයුතු තවදුරටත් වැඩිදියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ගෝලීය වශයෙන් පිළිගැනීම**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 2024 වර්ෂයෙ දී අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් (APHEN-ICH) සුරක්ෂිත කිරීම සඳහා ආසියා පැසිෆික් උසස් අධ්‍යාපන ජාලයේ සාමාජිකත්වය ලබා ගනිමින් සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් අත්කර ගත්තේය. තිරසර සංවර්ධන අරමුණු (SDG) 4 (ගුණාත්මක අධ්‍යාපනය), SDG 11 (තිරසාර නගර සහ ප්‍රජාවන්) සහ SDG 17 (ඉලක්ක සඳහා හවුල්කාරිත්වයන්) සමඟ අනුගත වෙමින් සාම්ප්‍රදායික කලා ආකෘතීන් සහ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් (ICH) ආරක්ෂා කිරීමට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙහි කැපවීම මෙම පිළිගැනීම තුළින් ඉස්මතු කර දක්වයි.

**පිළිගැනීම සහ ගෞරවාන්විත කුසලතා**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සිය වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවයේදී කීර්තිමත් නාට්‍ය අධ්‍යක්ෂකයෙකු, කලාකරුවෙකු සහ නාට්‍ය රචකයෙකු වන පරාක්‍රම නිරිඇල්ල මහතා සහ ප්‍රවීණ සංගීතඥ හේමපාල පෙරේරා මහතා වෙත ගෞරව ආචාර්ය උපාධි ප්‍රදානය කරන ලදී. මෙම සුවිශේෂී පිළිගැනීම, නාට්‍ය හා සංගීත ක්ෂේත්‍රයන්ට ඔවුන්ගේ ගැඹුරු දායකත්වයට ගෞරව දක්වමින් කලාවේ විශිෂ්ටත්වය සැමරීමට සහ ආරක්ෂා කිරීමට විශ්වවිද්‍යාලය දක්වන කැපවීම අවධාරණය කරයි.

## 3. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාත්මක තොරතුරු

### 3. 1 අධ්‍යයන කාර්යසාධනය

#### 3.1.1 අධ්‍යයනාංශ අනුව උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව

| පීඨය | අධ්‍යයනාංශය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වසර | | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර |
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | 19 | 17 | 17 | 15 | 16 |
| | මූර්ති කලා | 10 | 7 | 10 | 11 | 6 |
| | දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ | 12 | 13 | 16 | 14 | 9 |
| | සෙරමික් | 12 | 13 | 10 | 7 | 9 |
| | බහු ශික්ෂණාත්මක නිර්මාණ | 15 | 14 | 15 | 11 | 11 |
| | රෙදිපිළි හා ඇගලුම් කලා | 12 | 10 | 13 | 11 | 11 |
| | ඉතිහාසය සහ කලා සිද්ධාන්ත | 10 | 11 | 7 | 9 | 6 |
| | බහුමාධ්‍ය කලා | 13 | 15 | 14 | 18 | 15 |
| | මුද්‍රණ කලා | 11 | 11 | 10 | 7 | 8 |
| **දෘශ්‍ය කලාවේදී (ගෞරව) උපාධි; මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **114** | **111** | **112** | **103** | **91** |

| පීඨය | අධ්‍යයනාංශය | පළමුවන වසර | | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර |
|---|---|---|---|---|---|---|
| නර්තන හා නාට්‍ය කලා පීඨය | උඩරට නර්තන | 360* | 346* | 86 | 90 | 70 |
| | පහතරට නර්තන | | | 79 | 50 | 39 |
| | සබරගමු නර්තන | | | 16 | 32 | 21 |
| | වාද්‍ය සංගීත | | | 15 | 14 | 08 |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | | | 25 | 31 | 20 |
| | නර්තන, රංග කලා ඉතිහාසය හා සිද්ධාන්ත | | | 47 | 50 | 70 |
| | නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නැටුම | | | 58 | 66 | 42 |
| | තොරතුරු තාක්ෂණය ** | | | | | |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් (DELT)** | | | | | |
| **ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි - නර්තන හා නාට්‍ය ; මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **360** | **346** | **326** | **333** | **270** |

| පීඨය | අධ්‍යයනාංශය | පළමුවන වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර | |
|---|---|---|---|---|---|---|
| සංගීත පීඨය | උත්තර භාරතීය සංගීත | 294* | 63 | 89 | 118 | 80 |
| | දක්ෂිණ භාරතීය සංගීත | | 22 | 18 | 07 | 07 |
| | බටහිර සංගීත | | 52 | 54 | 46 | 39 |
| | මානව වංශ සංගීත විද්‍යා | | 37 | 56 | 54 | 46 |
| | ව්‍යවහාරික සංගීත සහ ජන සන්නිවේදන | | 35 | 30 | 27 | 29 |
| | සංගීත විද්‍යා | | 54 | 23 | 20 | 21 |
| **ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි - සංගීත ; මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | **294** | **263** | **270** | **272** | **222** |

සටහන්:- * ශිෂ්‍යයින් සඳහා ප්‍රථම වසර පොදු පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දෙන ලදී.
** DELT සහ DIT පාඨමාලා සඳහා වෙනම සිසුන් බඳවා නොගන්නා ලදී. පීඨයන්හි සියලුම අධ්‍යයනාංශවල සිසුන් විසින් මෙම විෂයයන් හදාරන ලදී.

### 3.1.2 ප්‍රථම උපාධි පාඨමාලා

- දෘශ්‍ය කලාවේදී (ගෞරව ) උපාධිය
- ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධිය - නර්තන හා නාට්‍ය කලා
- ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධිය - සංගීතය

### 3.1.3 2024 වර්ෂයේ උපාධිධාරීන් පිළිබඳ විස්තර

| පීඨය | අවසන් පරීක්ෂණ සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධි ලැබූ සිසුන් සංඛ්‍යාව | උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වූ සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 91 | 90 | 01 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 279 | 270 | 09 |
| සංගීත පීඨය | 225 | 211 | 14 |
| එකතුව | 595 | 571 | 24 |

### 3.1.4 පීඨ අනුව අධ්‍යයන ශ්‍රේණි සඳහා දායකත්වය

| | පළමු පන්තිය | දෙවන පෙළ ඉහළ පන්තිය | දෙවන පෙළ පහළ පන්තිය | සමත් |
|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | 2 | 46 | 37 | 5 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 26 | 216 | 27 | 1 |
| සංගීත පීඨය | 20 | 118 | 49 | 24 |









### 3.1.5 2024 වර්ෂයේ දී සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම පිළිබඳ විස්තර

| පීඨය | මහපොළ ශිෂ්‍යත්වලාභීන් | | ශිෂ්‍යාධාරලාභීන් | |
|---|---|---|---|---|
| | අංකය | ගෙවන ලද මුදල | අංකය | ගෙවන ලද මුදල (රු) |
| දෘශ්‍ය කලා පීඨය | 127 | 1,462,300.00 | 183 | 6,100,000.00 |
| <u>නර්තන හා නාට්‍ය කලා පීඨය</u> | | | | |
| නර්තන පාඨමාලාව | 111 | 2,152,500.00 | 511 | 18,296,000.00 |
| නාට්‍ය පාඨමාලාව | 45 | 413,300.00 | 112 | 448,000.00 |
| සංගීත පීඨය | 124 | 1,462,000.00 | 292 | 1,808,000.00 |
| එකතුව | **407** | **5,490,100.00** | **915** | **20,552,000.00** |

### 3.1.6 ශිෂ්‍ය පිරිවැය (2024)

| | |
|---|---|
| සම්පූර්ණ පුනරාවර්තන පිරිවැය | Rs. 1,560,250,868/- |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 3,487 |
| වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය | Rs. 447,447.91 |

### 3.1.7 2024 වර්ෂයේදී සිසුන් අතර නේවාසික පහසුකම් බෙදී ඇති ආකාරය

| නේවාසිකාගාරයේ නම | නේවාසික පහසුකම් ලබා අඇති ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| දෙහිවල කාන්තා නේවාසිකාගාරය | 355 | 1,657 |
| රාජගිරිය කාන්තා නේවාසිකාගාරය | 910 | |
| දෙහිවල පිරිමි නේවාසිකාගාරය | 392 | |

සටහන: නේවාසිකාගාරවල උපරිම ධාරිතාවය සිසුන් 1,124 වුවද වැඩිපුර සිසුන් 141 ක් ඒවායේ නවාතැන් පහසුකම් ලබාගෙන සිටිති.

**විශ්වවිද්‍යාලය වෙත ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයාඇති මූල්‍ය සහය**

දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව –

- සංගීත පීඨය - 172
- නර්තන හා නාට්‍ය කලා පීඨය
  - නර්තන - 169
  - නාට්‍ය - 16
- දෘශ්‍ය කලා පීඨය - 48

ලංගම වාර ප්‍රවේශපත්‍ර ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව –

- සංගීත පීඨය - 10
- නර්තන හා නාට්‍ය කලා පීඨය
  - නර්තන පාඨමාලාව - 22
  - නාට්‍ය පාඨමාලාව -කිසිවෙකුත් ලබාගෙන නොමැත
- දෘශ්‍ය කලා පීඨය - 31

**3.1.8 පශ්චාත් උපාධි පාඨමාලා**

- දර්ශනපති උපාධිය (M.Phil)
- දර්ශනශූරී උපාධිය (Ph.D.)

**3.1.9 2024 වර්ෂයේදී සක්‍රිය පාඨමාලා පිළිබඳ විස්තර**

| පාඨමාලාවේ නම | 2024 වර්ෂයේ දී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2024 වර්ෂයේ දී උපාධිය සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | ඇගයීම සඳහා නිබන්ධිකා ඉදිරිපත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| දර්ශනපති | 01 | 02 | 02 |
| දර්ශනශූරී | 00 | 01 | 05 |
| සෞන්දර්ය කලා පර්යේෂණ පිළිබඳ කෙටි පාඨමාලා (4 වන කණ්ඩායම) | 34 | - | - |

**පශ්චාත් උපාධි පාඨමාලා තුළින් උපයන ලද ආදායම : රු.** 1,644,000/=

**3.1.10 බාහිර උපාධි පාඨමාලා**

| පාඨමාලාවේ නම | අධ්‍යයන වර්ෂය | 2024 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද පාඨමාලා (ශිෂ්‍ය සංඛ්‍යාව) | 2024 වර්ෂයේ දී ආරම්භ කරන ලද පාඨමාලා (ශිෂ්‍ය සංඛ්‍යාව) |
|---|---|---|---|
| චිත්‍ර කලාව හා පින්තාරු ඩිප්ලෝමාව | 2022/2023 | 41 | |
| චිත්‍ර කලාව හා පින්තාරු ඩිප්ලෝමාව | 2023/2024 | | 25 |
| නර්තනය පිළිබඳ ඩිප්ලෝමාව | 2023/2024 | 66 | |
| | 2024/2025 | | 62 |

**බාහිර පාඨමාලා තුළින් උපයන ලද ආදායම :රු.** 9,840,280/=

## 3.2 කාර්යමණ්ඩල තොරතුරු

### 3.2.1 අධ්‍යයන, අධ්‍යයන සහයක සහ විධායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යා |
|---|---|---|---|---|---|
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U - AC 5 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16* | 174 | 19 |
| සහය මහාචාර්ය | U - AC 4 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | | |
| කථිකාචාර්ය/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I/II) | U - AC 3 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 138 | | |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී | U- EX 3 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 2 | 0 |
| විධායක නිධාරී (මධ්‍ය මට්ටම) | U - EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 16 | 03** |
| විධායක නිධාරී (මධ්‍ය මට්ටම) | U - EX 2 (a) | ජ්‍යෙෂ්ඨ මට්ටම | - | | |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U -MO 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | - | - | |
| වෛද්‍ය නිලධාරී | U -MO 1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| විධායක නිලධාරී (ප්‍රාථමික මට්ටම) | U-EX 1 | තෘතීය මට්ටම | 05 | 13 | 06** |
| අධ්‍යයන සහයක - 2 වන ඛණ්ඩය | U- AS 2 | තෘතීය මට්ටම | 09 | 16 | 07 |
| අධ්‍යයන සහයක - 1 වන ඛණ්ඩය | U- AS 1 | තෘතීය මට්ටම | 25 | 50 | 25 |

* උපකුලපති ඇතුළත්ව

** APER උසස්වීම් 2 (2 ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී)

### 3.2.2 පරිපාලන සහ මූල්‍ය නිලධාරීන් පිළිබඳ විස්තර

| තනතුර | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සේවයේ නිරත සේවක | පුරප්පාඩු සංඛ්‍යා | තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| ලේඛකාධිකාරී | U-EX3(I) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 | ස්ථිර |
| මූල්‍යාධිකාරී | U-EX3 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 | ස්ථිර |
| වැඩ ඉංජිනේරු | U-EX 1 / U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ නියෝජ්‍ය ලේඛකාධිකාරී | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 10 | 1 | ස්ථිර |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී / නියෝජ්‍ය මූල්‍යාධිකාරී | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 4* | 0 | ස්ථිර |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්කතර විගණක/ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 | ස්ථිර |
| සහකාර ලේඛකාධිකාරී | U-EX1 | තෘතීය මට්ටම | 5 | 4 | 1 | ස්ථිර |
| සහකාර ලේඛකාධිකාරී - නීති හා ප්‍රලේඛන අංශය | U-EX1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| සහකාර අභ්‍යන්තර විගණක | U-EX1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| සහකාර මූල්‍යාධිකාරී | U-EX1 | තෘතීය මට්ටම | 4* | 1 | 1* | ස්ථිර |
| ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී | U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| භාරකරු (චිත්‍ර ප්‍රදර්ශන ශාලාව) | U-EX1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| ව්‍යාපෘති කළමනාකරු | U-EX1 , U-EX2 | තෘතීය මට්ටම /ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| වෛද්‍ය නිලධාරී | U-MO1 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 | ස්ථිර |
| අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපනය) | U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 | ස්ථිර |
| **එකතුව** | | | **33** | **23** | **10** | |
| * APER උසස්වීම් (නිලධාරීන් 2) | | | | | | |

### 3.2.3 අනධ්‍යයන කාර්ය මණ්ඩය පිළිබඳ විස්තර

| සේවා බණ්ඩය | වැටුප් කේතය | දැනට සිටින සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|---|---|
| ප්‍රාථමික මට්ටමl | | | | | |
| ප්‍රාථමික සේවා බණ්ඩය– පුහුණු | PL – 1 | 42 | 113 | 43* | ස්ථිර |
| ප්‍රාථමික සේවා බණ්ඩය– අර්ධ පුහුණු | PL – 2 | 05 | | | ස්ථිර |
| ප්‍රාථමික සේවා බණ්ඩය– නුපුහුණු | PL – 3 | 19 | | | ස්ථිර |
| ද්විතියික මට්ටම | | | | | |
| කළමනාකරණ සහකාර | U - MN 1 | 80 | 117 | 16** | ස්ථිර |
| මාණ්ඩලික සහකාර/ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U - MN 4 | 25 | | | ස්ථිර |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික | U - MT 1 | 09 | 17 | 08 | ස්ථිර |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන | U - MT 1 | 00 | 03 | 03 | ස්ථිර |
| සහය නිලධාරී – 2 වන බණ්ඩය | U - MN 2 | 01 | 02 | 01 | ස්ථිර |
| සහය නිලධාරී – 2 වන බණ්ඩය – තාක්ෂණික නොවන | U - MN 3 | 02 | 03 | 01 | ස්ථිර |
| සහය නිලධාරී – 2 වන බණ්ඩය - තාක්ෂණික | U - MN 3 | 03 | 03 | 00 | ස්ථිර |

* ආරක්ෂක නියාමකයින් ප්‍රාථමික සේවා නුපුහුණු අංශයට ඇතුළත් වේ. නමුත් ඔවුන්ගේ උසස්වීම්වලට අදාළ වැටුප් පරිමාණය ද්විතීයික අදියර යටතේ පවතී. එබැවින්, කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන බණ්ඩයට ආරක්ෂක නියාමකයින් 04 ක් ඇතුළත් වේ.

** පිළිගැනීමේ නිලධාරි සහ දුරකථන ක්‍රියාකරු තනතුර සඳහා සේවක සංඛ්‍යාව 04ක් අනුමත කරන ලද අතර ඉන් 02ක් පුරප්පාඩු වී පවතියි. නමුත් එම තනතුරු දරන නිලධාරියාටම පෞද්ගලික වන බැවින් එම පුරප්පාඩු 02 මුළු සංඛ්‍යාවට ඇතුළත් කර නොමැත.

### 3.2.4 වර්ෂය තුළ කාර්ය මණ්ඩලයේ සිදුවූ සමස්ත වෙනස්වීම්

2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ එහි කාර්ය මණ්ඩල ව්‍යුහයේ විවිධ කාණ්ඩ තුළ විවිධ වෙනස්කම් සිදුවිය. කාර්ය මණ්ඩල වෙනස්වීම් පහත පරිදි බෙදා දැක්විය හැකිය:

| | අධ්‍යයන | අධ්‍යයන සහායක | පරිපාලන සහ මූල්‍ය | අනධ්‍යයන |
|---|---|---|---|---|
| නව පත්වීම් | - | - | 03 | |
| සේවයේ ස්ථිරකිරීම් | 05 | - | 04 | 10 |
| උසස්වීම් | 19 | 04 | 04 | 15 |
| සප්ත වාර්ෂික නිවාඩු | 08 | - | 01 | |
| අධ්‍යයන නිවාඩු (දේශීය) | 09 | - | - | |
| අධ්‍යයන නිවාඩු (විදේශීය) | 01 | - | - | |
| අධ්‍යයන නිවාඩු දීර්ඝකිරීම | 01 | - | - | |
| සප්ත වාර්ෂික නිවාඩු අවසන් වී රාජකාරියට වාර්තා කිරීම | 06 | - | 01 | |
| අධ්‍යයන නිවාඩු අවසන් වී රාජකාරියට වාර්තා කිරීම | 09 | - | - | |
| මරණ | - | - | - | |
| මාරුවීම් (වෙනත් විශ්වවිද්‍යාල වලින්) | - | - | - | |
| විශ්‍රාමයාම් | 01 | - | 01 | 02 |
| සේවයෙන් ඉවත්වීම් | 01 | - | - | 06 |
| තනතුර අත්හැරයාම් | 01 | - | - | |

### 3.2.5 කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම

සියලුම පීඨ සහ අංශවල සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලය තුළ අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම අත්‍යවශ්‍ය වේ. 2024 වර්ෂයේ දී විවිධ පීඨ, අධ්‍යයනාංශ , අංශ සහ ඒකක හරහා කාර්ය මණ්ඩල ව්‍යාප්තිය පහත පරිදි වේ:

**(අ) අධ්‍යයනාංශ මට්ටමෙන් අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම**

| පීඨය | අධ්‍යයනාංශය | අධ්‍යයන කාර්යමණ්ඩලය | අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | තාවකාලික පදනම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | තාවකාලික උපදේශක/ නිදර්ශක | ආරාධිත දේශකවරු | ආරාධිතඋපදේශ කවරු |
|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | 07 | - | 01 | - | 10 | - |
| | මූර්ති කලා | 06 | - | - | - | 06 | - |
| | දෘශ්‍ය සන්නිවේදන නිර්මාණ | 04 | - | 02 | - | 10 | - |
| | සෙරමික් | 04 | 01 | 01 | - | 14 | - |
| | බහු ශික්ෂණාත්මක නිර්මාණ | 05 | - | 02 | - | 10 | - |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | 03 | - | 01 | - | 19 | - |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | 04 | - | 02 | - | 21 | - |
| | බහුමාධ්‍ය කලා | 04 | - | 01 | - | 10 | - |
| | මුද්‍රණ කලා | 04 | - | 02 | - | 17 | - |
| **එකතුව** | | **41** | **01** | **12** | **-** | **117** | **-** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | **අධ්‍යයනාංශය** | - | - | | | | |
| | උඩරට නර්තන | 16 | 02 | 02 | 04 | 17 | 13 |
| | පහතරට නර්තන | 08 | 02 | 01 | - | 22 | 11 |
| | සබරගමු නර්තන | 07 | 01 | 02 | - | 17 | 13 |
| | වාද්‍ය සංගීත | 04 | - | 02 | - | 09 | 02 |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | 09 | 02 | 02 | 02 | 16 | 03 |
| | නර්තන හා රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත | 07 | - | - | - | 13 | 03 |
| | නාට්‍ය කලා, මුද්‍රා නාට්‍ය හා නූතන නැටුම් | 12 | 02 | - | - | 17 | 02 |
| | තොරතුරු තාක්ෂණය | 03 | 06 | - | - | - | - |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම | 02 | - | 01 | 03 | 10 | - |
| | පීඨාධිපති කාර්යාලය | - | - | - | 01 | - | - |
| **එකතුව** | | **68** | **15** | **10** | **10** | **121** | **47** |
| සංගීත පීඨය | **අධ්‍යයනාංශය** | | | | | | |
| | උතත්ර භාරතීය සංගීත | 22 | 9 | | - | 15 | 48 |
| | දක්ෂිණ භාරතීය සංගීත | 01 | 2 | 1 | - | 10 | 29 |
| | බටහිර සංගීත | 05 | - | 1 | - | 35 | 23 |
| | මානව වංශ සංගීත විද්‍යා | 06 | 3 | | - | 8 | 12 |
| | ව්‍යවහාරික සංගීතය සහ ජන සන්නිවේදන | 04 | 1 | 2 | - | 45 | 11 |
| | සංගීත විද්‍යා | 03 | - | 2 | - | 13 | 12 |
| | පීඨාධිපති කාර්යාලය | - | 01 | | - | | |
| **එකතුව** | | **41** | **16** | **06** | **-** | **126** | **135** |

**(ආ) පීඨ මට්ටමෙන් අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම**

| පීඨය/ ඒකකය/ අංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය/ කථිකාචාර්ය (ස්ථිර නොවූ) | කථිකාචාර්ය (පරිවාස) | උපදේශක | සහායවාදක | ප්‍රදර්ශක | බාහිර කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර ( II ශ්‍රේණිය) | සහකාර පරිගණක ඵල කලමනාකරු ( II ශ්‍රේණිය) | ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක ( I ශ්‍රේණිය) | ශාරීරික අධ්‍යාපන උපදේශක ( I ශ්‍රේණිය) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දෘශ්‍ය කලා පීඨය | - | 2 | 1 | 20 | 3 | 15 | 1 | - | - | 117 | - | - | - | |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | - | 8 | 0 | 31 | 17 | 12 | 12 | 2 | 1 | 121 | - | - | 1 | |
| සංගීත පීඨය | - | 5 | - | 28 | 1 | 2 | 5 | 6 | 9 | 126 | 1 | - | | |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | | | | | | | | | | | | | - | 2 |

**(ඇ) පුස්තකාලය සඳහා කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම**

| | පුස්තකාලයාධිකාරී | නියෝජ්‍ය පුස්තකාලයාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී |
|---|---|---|---|
| පුස්තකාලය | 1 | 1 | 1 |

**(ඈ) විධායක සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සේවයේ යෙදවීම**

| පීඨය/ අංශය | පරිපාලන | අනධ්‍යයන | |
|---|---|---|---|
| | | කළමනාකරණ සහකාර සහ සමාන්තර ශ්‍රේණි | ප්‍රාථමික ශ්‍රේණි |
| දෘශ්‍ය කලා පීඨය | 1 | 14 | 11 |
| නාට්‍ය හා නර්තන කලා පීඨය | 1 | 16 | 05 |
| සංගීත පීඨය | 1 | 14 | 05 |
| උපකුලපති කාර්යාලය | 1 | 02 | 02 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 1 | 02 | 01 |
| මූල්‍ය අංශය | 5 | 14 | 03 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | 05 | 01 |
| අනධ්‍යයන ආයතන අංශය | 1 | 03 | 01 |
| විභාග අංශය | 1 | 06 | 01 |
| අධ්‍යායන සහ ශිෂ්‍ය කටයුතු අංශය | 1 | 07 | 01 |
| සාමාන්‍ය පාලන අංශය | 2 | 05 | 06 |
| සංයුක්ත කළමනාකරණ හා ජාත්‍යන්තර සහයෝගීතා අංශය | 1 | 01 | 00 |
| මූලධන කාර්ය අංශය | 1 | 01 | 01 |
| පර්යේෂණ සහ නිර්මාණ කටයුතු සංවර්ධන අංශය | 1 | 02 | 01 |
| අභ්‍යන්තර විගණන අංශය | 1 | 01 | 01 |
| නීති සහ ප්‍රලේඛන අංශය | 0 | 01 | 00 |
| විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | 1 | 04 | 01 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | 1 | 02 | 00 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 1* | 00 | 00 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | 00 | 00 |
| විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය | 3** | 00 | 02 |
| නඩත්තු අංශය | 1*** | 02 | 14 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1**** | 01 | 01 |
| පුස්තකාලය | 0 | 07 | 05 |
| ආරක්ෂක අංශය | - | 03 | 07 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය | - | 01 | 00 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය රූපවාහිනිය | - | 02 | 00 |

* ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වෙත වැඩසටහන් කළමනාකරු / SDC වශයෙන් කටයුතු කිරීමට රාජකාරි පවරා තිබේ.

** උපදේශකවරයෙකු සහ බාහිර වෛද්‍ය නිලධාරියෙකු සේවා අවශ්‍යතාවය මත පත් කර තිබේ.

*** උපදේශකයෙකු පත් කර තිබේ.

**** ශාරීරික අධ්‍යාපන උපදේශකයෙකු (I ශ්‍රේණිය) අධ්‍යක්ෂවරයාගේ රාජකාරි ආවරණය කරයි.

## 3.3 භෞතික යටිතල පහසුකම්

විශ්වවිද්‍යාලය එහි භෞතික යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම තුළින් අධ්‍යයන හා අනධ්‍යයන කටයුතු සඳහා හිතකර පරිසරයක් සකසා දීමට කැපවී සිටියි. විශ්වවිද්‍යාලය ප්‍රධාන ස්ථාන කිහිපයක් පුරා විහිදී ඇති අතර එම සෑම එකක් ම සමස්ත අධ්‍යයන අත්දැකීමට දායකත්වය සපයයි. කෙසේ නමුත් විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සහ සංගීත පීඨයේ හා නර්තන හා නාට්‍ය කලා පීඨයේ පළමු සහ දෙවන වසර අධ්‍යයන කටයුතු සඳහා කලින් භාවිතා කරන ලද කොහුවල පරිශ්‍රය මෑතකදී එහි මුල් හිමිකරුවන්ට භාරදීම හේතුවෙන් විශ්වවිද්‍යාලය සැලකිය යුතු අන්දමෙන් ඉඩකඩ පිළිබඳ අභියෝගවලට මුහුණ දී තිබේ. එමෙන් ම දෙහිවල ප්‍රදේශයෙන් පෞද්ගලික දේපළ කුලියට දීම අත්හිටුවීම මෙම ගැටලුවට තවදුරටත් උග්‍ර වී තිබේ. මෙම අභියෝගයට පිළිතුරු ලෙස රත්මලානේ පිහිටි මහවැලි අධිකාරිය සතු ඉඩම් විශ්වවිද්‍යාලයට පැවරීම සඳහා පහසුකම් සැලසීමට රජය පියවර ගෙන තිබේ. අවාසනාවන්ත ලෙස මෙම පැවරීම වසර තුළ සිදු නොවූ අතර විශ්වවිද්‍යාලය ඉඩකඩ පිළිබඳ ගැටළුවට අඛණ්ඩව මුහුණ දෙමින් සිටියි. මෙම අභියෝග පැවතියද සියලුම සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ඵලදායී සහ සහායක ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලය එහි යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව සඳහා අඛණ්ඩව ප්‍රමුඛතාවය ලබා දෙයි.

### 3.3.1 විශ්වවිද්‍යාලය විසින් ඉඩම් සහ ගොඩනැගිලි උපයෝජනය පිළිබඳ විස්තර

| පිහිටීම | අක්කර/ වර්ගඅඩි |
|---|---|
| **ඉඩම් සහ ගොඩනැගිලි** | |
| **ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි ඉඩම** | **හෙක්. 0.952** |
| පරිපාලන ගොඩනැගල්ල | වර්ග මීටර 2205 |
| නර්තන හා නාට්‍ය කලා පීඨ ගොඩනැගිල්ල | වර්ග මීටර 4871 |
| සංගීත පීඨ ගොඩනැගිල්ල | වර්ග මීටර 6934 |
| පණ්ඩිත් අමරදේව ගොඩනැගිල්ල | වර්ග මීටර 1722 |
| පොත්හල | වර්ග අඩි 432.92 |
| **හෝර්ටන් පෙදෙස පරිශ්‍රය** | **හෙක්. 0.6277** |
| දෘශ්‍ය කලා පීඨය | වර්ග මීටර 10302 |
| **රාජගිරිය පරිශ්‍රය** | **හෙක්.0.4355** |
| නේවාසිකාගාර ගොඩනැගිල්ල | වර්ග මීටර 6255 |
| **දෙහිවල පරිශ්‍රය** | **හෙක්.0.3197** |
| පිරිමි නේවාසිකාගාර ගොඩනැගිල්ල | වර්ග මීටර 2308 |
| කාන්තා නේවාසිකාගාර ගොඩනැගිල්ල | වර්ග මීටර 3340 |

### 3.3.2 යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

| අනුඅංකය | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.) | 2024.12.31 දිනට වියදම (රු.මි) | 2024.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **01** | නර්ත සහ නාට්‍ය කලා පීඨය සඳහා අර්ධ - ස්ථිර දිගුව | මි. 4.8 (වැට් රහිතව) | නැත | කාර්යයන් 30% ක් අවසන් කර තිබේ. |
| **02** | ඇල්බට් චන්ද්‍රවංශ සහ හෝටන් පෙදෙස පරිශ්‍රයන්හි ගොඩනැඟිලි තුළ බෙදීම් සහ අලුත්වැඩියා කටයුතු | මි. 3.8 (වැට් රහිතව) | මි.1.5 | කාර්යයන් 50% ක් අවසන් කර තිබේ. |
| **03** | නර්තන සහ නාට්‍ය පීඨයේ වහළ මතුපිට ප්‍රතිසංස්කරණ කටයුතු | මි. 7.6 (වැට් රහිතව) | මි.2.8 | කාර්යයන් 60% ක් අවසන් කර තිබේ. |
| **04** | චිත්‍ර ඇඳීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු - දෘශ්‍ය කලා පීඨය | මි. 7.6 (වැට් රහිතව) | නැත | කාර්යය ප්‍රදානය කර ඇත. |
| **05** | දත්ත ජාලකරණය- **FM** සහ අමරදේව ගොනැගිල්ල | මි.10.7 (වැට් රහිතව) | නැත | අවසන් අදියරේ නිමවෙමින් පවතියි. |
| **06** | දත්ත ජාලකරණය- මහගමසේකර ගොනැගිල්ල **FVA** | මි. 14.8 (වැට් රහිතව) | නැත | කේබල් කිරීම අවසන් කර ඇත. උපකරණ වලින් 80% වැඩබිම වෙත ලබා දී ඇත. |

### 3.4 පුස්තකාල ග්‍රන්ථ එකතුව පිළිබඳ විස්තර 2023 /2024

| | **2023** | **2024** |
|---|---|---|
| ග්‍රන්ථ එකතුව | 59,391 | 60,225 |
| වාර සඟරා එකතුව | නැත | නැත |
| නව අත්කරගැනීම් | 516 | 834 |

# 4. ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර යටතේ 2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය

## 4.1 උපාධිධාරීසේවා නියුක්තිය ඉහළ නැංවීම

### 4.1.1. වෘත්තීය මගපෙන්වීම සහ උපදේශනය

2023 වර්ෂයේදී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සිසුන්ගේ වෘත්තීය සංවර්ධනය, ශිෂ්‍ය සහාය සහ අධ්‍යයන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන ආරම්භක පියවර රැසක් ගන්නා ලදී.

2021/22 නවක කණ්ඩායම සඳහා විශ්වවිද්‍යාල ජීවිතය, අධ්‍යයන අපේක්ෂාවන් සහ පවතින උපකාරක සේවා පිළිබඳව සිසුන් හුරු කරවීම සඳහා නම්‍යකරණ වැඩසටහනක් පවත්වන ලදී. සිසුන්ගේ අභිලාෂයන් වඩා හොඳින් අවබෝධ කර ගැනීමට සහ ඔවුන්ට ඵලදායී ලෙස මඟ පෙන්වීමේ අරමුණින් ප්‍රථම වසර සිසුන් සඳහා උපාධි අපේක්ෂක හඳුන්වාදීමේ වෘත්තීය මාර්ගෝපදේශ සමීක්ෂණයක් පවත්වන ලදී. මීට අමතරව රැකියා නියුක්තිය පිළිබඳ ප්‍රවණතා සහ වෘත්තීය ගමන් මග තක්සේරු කිරීම සඳහා 2017/18 අධ්‍යයන වර්ෂයේ උපාධිධාරීන් සඳහා උපාධිධාරී රැකියා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. ව්‍යුහගත අධ්‍යයන ලබාදීමෙහි වැදගත්කම හඳුනා ගනිමින් සිදුවීම් කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා වන විෂය නිර්දේශය සාර්ථකව සම්පූර්ණ කර විෂයමාලා ඇගයීම් මණ්ඩලය විසින් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. තවද පීඨ තුන පුරාම අධ්‍යයනාංශ මට්ටමින් සීමාවාසික අවස්ථා පිළිබඳ පුළුල් තොරතුරු රැස් කිරීමට උත්සාහ කරන ලද අතර එමගින් සිසුන්ට කර්මාන්ත වෙත නිරාවරණයට සහ ප්‍රායෝගික ඉගෙනීමට පහසුකම් සැලසේ.

විශ්වවිද්‍යාලය එහි වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශන සේවා ද ශක්තිමත් කළ අතර සියලුම සිසුන්ට උචිත වෘත්තීය උපදේශන සැසි සහ පෞද්ගලික සහ අධ්‍යයන ගැටළු සඳහා සාමාන්‍ය උපදේශන සහාය ලබා දෙන ලදී. මේ අනුව යමින් ප්‍රථම වසරේ සහ තෙවන වසරේ සිසුන් සඳහා අත්‍යවශ්‍ය වෘත්තීය සැලසුම් කුසලතා වලින් සන්නද්ධ කිරීම සඳහා විශේෂිත වෘත්තීය මාර්ගෝපදේශ පාඨමාලා සඳහා අවශ්‍ය ලේඛන සංවර්ධනය කරන ලදී. අධ්‍යයන දායකත්වයන් අතරට දෙවන වසරේ සිසුන් සඳහා වෘත්තීය ව්‍යවසායකත්වය සහ සමාජ කුසලතා (DHTV 22062) පිළිබඳ දේශන පැවැත්වීම, වෘත්තීය සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය කුසලතා පෝෂණය කිරීම ඇතුළත් විය. මීට අමතරව, මානසික යහපැවැත්ම සහ වෘත්තීය ආශ්‍රිත අභියෝග පිළිබඳව සිසුන්ට පුළුල් මග පෙන්වීමක් ලබා දීම සඳහා උපදේශන පොත් පිංචක් නිර්මාණය කරන ලදී.

මෙම මූලික ක්‍රියාමාර්ග මගින් විශ්වවිද්‍යාලය සිසුන්ගේ අධ්‍යයන ගමන්මග , වෘත්තීය අභිලාෂයන් සහ පුද්ගල සංවර්ධනයට සහාය වීම සඳහා වන සිය කැපවීම නැවත තහවුරු කරමින් පරිපූර්ණ අධ්‍යාපන අත්දැකීමක් සහතික කළේය.

### 4.1.2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාවයේ පිළිබඳ මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාලය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාවයේ පිළිබඳ මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ගත මෙන් ම සාධාරණ පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ය. මෙම මධ්‍යස්ථානය ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ විෂමතා පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම සහ ගෞරවය සහ ඇතුළත් කිරීමේ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. නිර්මාණශීලීත්වය භාවිතා කරමින් පර්යේෂණ සහ උපදේශනය සඳහා වේදිකාවක් සැපයීමෙන් ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සියලු පුද්ගලයින්ට සාර්ථක වීමට සමාන අවස්ථා ඇති බව සහතික කරමින් වෙනස්ව සැලකීමේ භාවිතයන් සහ ආකල්ප අභියෝගයට ලක්කිරීම සහ අඩුකිරීම ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය පිළිබඳ මධ්‍යස්ථානය විසින් අරමුණු කරගෙන සිටියි. රැකියා ස්ථානයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සමානාත්මතාවයේ පිළිබඳ මධ්‍යස්ථානය, සමාජයේ සහ ඉන් ඔබ්බට ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ අභියෝග හමුවේ කටයුතු කිරීමට සහ ඒවාට මුහුණ දිය හැකි සමාජීය වශයෙන් වගකිවයුතු පුරවැසියන් බවය පත්වීමට සිසුන් සූදානම් කිරීමේ විශ්වවිද්‍යාලයේ පුළුල් මෙහෙවරට ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ හා සමානත්වය පිළිබඳ මධ්‍යස්ථානය දායක වේ.

### 4.1.3 ශාරීරික අධ්‍යාපනය

2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය ක්‍රීඩා සහ ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමේදී ව්‍යුහගත ක්‍රීඩා පරිචයන්, අන්තර් විශ්වවිද්‍යාල තරඟ සහ කාර්ය මණ්ඩල ඉසව් හරහා සිසුන්, කාර්ය මණ්ඩලය සහ විවිධ පාර්ශ්වයන් සම්බන්ධ කර ගැනීමේදී සැලකිය යුතු ප්‍රගතියක් හිමි කර ගත්තේය. වැඩ කිරීමට සූදානම්, ඔරොත්තු දෙන සහ උද්‍යෝගිමත් ශිෂ්‍ය අත්දැකීම් පෝෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම, විවධ ක්‍රීඩා , මිත්‍රශීලී තරඟ සහ ශූරතා සංවිධානය කිරීම සහ සහභාගී වීම තුළින් පෙන්නුම් කෙරිණි.

**අන්තර් විශ්වවිද්‍යාල ශූරතා සහ ජයග්‍රහණ**

- විශ්වවිද්‍යාල කණ්ඩායම් ක්‍රිකට්, බැඩ්මින්ටන්, දැල්පන්දු, එල්ලේ, අත්පන්දු, කරාතේ, ජවන හා පිටිය, ටයිකොන්ඩෝ, බීච් වොලිබෝල්, කැරම්, මාර්ග ධාවන තරඟ සහ පිහිනුම් වැනි ක්‍රීඩා සඳහා තරඟ කරමින් අන්තර් විශ්වවිද්‍යාල ශූරතා රැසකට පුළුල් පරාසයක සිට සහභාගී විය.
- මෙම ශූරතාවලියේ ප්‍රධාන ජයග්‍රහණවලට ඇතුළත් වූයේ:
  - o ගම්පහ වික්‍රමාරච්චි විශ්ව විද්‍යාල ශූරතාවලියේදී කරාතේ කිලෝග්‍රෑම් 50 ට අඩු කුමිතේ කාණ්ඩයේ රන් පදක්කම.
  - o මොරටුව විශ්වවිද්‍යාල ශූරතාවලියේදී ටයිකොන්ඩෝ කිලෝග්‍රෑම් 58-63 බර පංතියේ ලෝකඩ පදක්කම.
  - o ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලයේ සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කණ්ඩායම්වලට එරෙහිව බීච් වොලිබෝල් සහ කැරම් මූලික වටයේ ජයග්‍රහණ.
  - o විශ්වවිද්‍යාල චෙස් කණ්ඩායමේ සාමාජිකාවක වන ආර්. හිරුණිකා ලක්ෂානි, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ සඳහා තේරී පත් වූ අතර සහභාගී වූවන් 128 දෙනාගෙන් ඉහළම කාන්තා චෙස් ක්‍රීඩිකාවන් 8 දෙනා අතරට ශ්‍රේණිගත කරන ලදී.

මෙම ජයග්‍රහණ සිසුන්ගේ උත්සාහවන්තභාවය, කැපවීම සහ කුසලතාවයට මෙන්ම විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායම් සහ කාර්ය මණ්ඩලය විසින් සපයනු ලබන සහයෝගය සහ මග පෙන්වීමට සාක්ෂි දරයි.

**ක්‍රීඩා පුහුණුවීම්:**

- අර්ධකාලීන ක්‍රීඩා උපදේශකයින් යටතේ පුහුණුවීම්: විශ්වවිද්‍යාලය විසින් විවිධ විෂය පරාස ඔස්සේ අර්ධකාලීන ක්‍රීඩා උපදේශකයින්ගේ මග පෙන්වීම යටතේ නිතිපතා ක්‍රීඩා පුහුණුවීම් පවත්වන ලදී:
  - o දැල් පන්දු (කාන්තා), අත් පන්දු (පිරිමි/කාන්තා), ක්‍රිකට් (පිරිමි), කරාතේ (පිරිමි/කාන්තා), චෙස් (පිරිමි/කාන්තා), ටයිකොන්ඩෝ (පිරිමි/කාන්තා), බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා), කැරම් (පිරිමි/කාන්තා) සහ ජවන හා පිටිය (කාන්තා). මෙම පුහුණුවීම් සිසුන්ට ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ විවිධ මට්ටම්වල තරඟ කිරීමට අවස්ථා ලබා දුන්නේය.
- ශාරීරික අධ්‍යාපන ඒකකයේ අධීක්ෂණය යටතේ පුහුණුවීම්: අර්ධකාලීන උපදේශකයින්ට අමතරව, ශාරීරික අධ්‍යාපන ඒකකය විශේෂිත ක්ෂේත්‍රවල ක්‍රීඩා පුහුණුවීම් සංවිධානය කළේය:
  - o බීච් වොලිබෝල් (පිරිමි), එල්ලේ (පිරිමි/කාන්තා), මාර්ග ධාවන තරඟ (පිරිමි), පිහිනුම් (පිරිමි/කාන්තා), සහ ස්වායු සහ ශාරීරික යෝග්‍යතා වැඩසටහන්. මෙම ක්‍රියාකාරකම් සිසුන්ගේ ශාරීරික යෝග්‍යතාවය, කණ්ඩායම් හැඟීම සහ තරඟකාරී ක්‍රීඩා වලදී පුද්ගල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන ඇත.

**ක්‍රීඩා පුහුණුවීම් සඳහා බිම් වෙන්කරවා ගැනීම:**

- විශ්වවිද්‍යාලය විවිධ ක්‍රීඩා පුහුණුවීම් සඳහා සහාය වීම සඳහා විවිධ බාහිර ස්ථාන භාවිතා කරන ලදී:

    - o ක්‍රිකට්, බැඩ්මින්ටන් සහ ජවන හා පිටිය ක්‍රීඩා සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය සහ ක්‍රීඩා පිටිය.
    - o නෙට්බෝල් සහ වොලිබෝල් සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය
    - o ජවන හා පිටිය ඉසව් සඳහා ටොරින්ටන් පිටිය.
    - o බැඩ්මින්ටන් පුහුණුව සහ තරඟ සඳහා රාජකීය ගෘහස්ථ ක්‍රීඩාංගනය සහ එන්සීසී ගෘහස්ථ ක්‍රීඩාංගනය.

ක්‍රීඩා සංවර්ධනය උදෙසා හිතකර පරිසරයක් සකසමින් සිසුන් වෙත ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු පහසුකම් සැලසීමට මෙම බාහිර ස්ථාන විශ්වවිද්‍යාලය වෙත අවස්ථාව ලබා දෙන ලදී.

**සුහද තරඟාවලි:**

- වසර පුරාම විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායම් අනෙකුත් විශ්වවිද්‍යාල සහ පාසල්වල කණ්ඩායම් සමඟ සුහද තරඟ සඳහා සහභාගී විය. මෙබඳු මිත්‍රශීලී තරඟ තරඟකාරී අත්දැකීම් සහ කණ්ඩායම් සහජීවනය ගොඩනැගීමට උපකාරී විය. සම්බන්ධ වූ ක්‍රීඩා අතරට පහත ක්‍රීඩා අයත් වේ:

    - o කලම්බු ඉන්ටර්නැෂනල් ස්කූල්, කොළඹ ක්‍රෝස්, ශාන්ත ජෝසප් සහ රත්දොළුව සීසී වැනි කණ්ඩායම් සමඟ ක්‍රිකට් තරඟ.
    - o එල්ලේ, වොලිබෝල්, ටයිකොන්ඩෝ, ධාවන පථ සහ පිටිය, චෙස්, බැඩ්මින්ටන්, නෙට්බෝල් සහ කරාතේ යන ක්‍රීඩා ද විවිධ ප්‍රතිවාදීන්ට එරෙහිව මිත්‍රශීලී තරඟ ඇතුළත් වූ අතර සිසුන්ගේ අත්දැකීම් වැඩි දියුණු කර අනාගත තරඟාවලි සඳහා ඔවුන් සූදානම් කරන ලදී.

**අන්තර් පීඨ තරඟාවලි:**

- විශ්වවිද්‍යාලය අන්තර් පීඨ ශූරතාවලි සඳහා සත්කාරක විශ්වවිද්‍යාලය වශයෙන් අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි සහ ක්‍රීඩාශීලීත්වය සඳහා දිරිගන්වමින් කටයුතු කරන ලද අතර ඒ සඳහා පහත ශූරතාවලි ඇතුළත් විය.

    - o විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැවති අන්තර් පීඨ චෙස් ශූරතාවලිය (2024 මාර්තු 19).
    - o ක්‍රීඩා අමාත්‍යාංශ ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවති අන්තර් පීඨ වොලිබෝල් ශූරතාවලිය (2024 දෙසැම්බර් 19).
    - o විද්‍යාල පරිශ්‍රයේදී පැවති අන්තර් පීඨ දැල්පන්දු ශූරතාවලිය (2024 දෙසැම්බර් 19).
    - o නර්තන හා නාට්‍ය කලා පීඨයේ මැද මිදුලේදී පැවති අන්තර් පීඨ බැඩ්මින්ටන් ශූරතාවලිය (2024 දෙසැම්බර් 20).

මෙම ශූරතා තරඟාවලියන් සිසුන්ට තම පීඨ නියෝජනය කිරීමට සහ තරඟකාරී පසුබිමක තම දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට විශිෂ්ට වේදිකාවක් සපයන ලදී.

**ආරාධිත තරඟාවලි :**

- විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා කණ්ඩායම්වලට නම් දැරූ බාහිර තරඟාවලි කිහිපයකට සහභාගී වීමට ද ආරාධනා ලැබිණි.
    - o වෙස්: චෙස් කණ්ඩායම් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විද්‍යාල (SLIIT) ආරාධිත චෙස් ශූරතාවලිය, මොරටුව විශ්වවිද්‍යාලයේ 6 වන මෝරා කිංග්ස් ජාත්‍යන්තර චෙස් ශූරතාවලිය සහ 14 වන ඇතුගල්පුර ජාත්‍යන්තර චෙස් ශූරතාවලිය සඳහා සහභාගී විය.
    - o බැඩ්මින්ටන්: බැඩ්මින්ටන් කණ්ඩායම් 2024 ෂට්ලර්ස් ෆෙස්ට් ජාත්‍යන්තර බැඩ්මින්ටන් ශූරතාවලිය, ඇම්බැසඩර්ස් කුසලාන බැඩ්මින්ටන් ශූරතාවලිය සහ එයාර් බැඩ්මින්ටන් තරඟාවලිය සඳහා තරඟ කළහ.
    - o දැල්පන්දු: දැල්පන්දු කණ්ඩායම SLIIT ආරාධිත නෙට්බෝල් ශූරතාවලියට සහභාගී විය.
    - o විශේෂයෙන් ම චෙස් කණ්ඩායම ඇතුගල්පුර ජාත්‍යන්තර චෙස් ශූරතාවලියේදී උසස් අධ්‍යාපන කාණ්ඩයේ 4 වන ස්ථානය ලබා ගත්තේය.

මෙම තරඟාවලි සිසුන්ට ඉහළ මට්ටමේ තරඟකාරිත්වයට නිරාවරණය වීමට ඉඩ සැලසූ අතර ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ විශාල වේදිකාවල සිට විශ්වවිද්‍යාලය නියෝජනය කිරීමට උපකාරී විය.

**කාර්ය මණ්ඩල තරඟ**

කාර්ය මණ්ඩල තරඟය:

2024 දෙසැම්බර් 30 වන දින විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන, අනධ්‍යයන සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා කාර්ය මණ්ඩල බැඩ්මින්ටන් ශූරතාවලියක් ද සංවිධානය කළේය. මෙම සංකල්පය මඟින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය අතර කණ්ඩායම් ගොඩනැගීම සහ ප්‍රජා හැඟීම වර්ධනය කිරීම අරමුණු කර ගැණිනි.

2024 දී විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා වැඩසටහන සිසුන්ගේ සහ කාර්ය මණ්ඩල සහභාගීත්වය සහ තරඟකාරී ඉසව්වල හැකියා ප්‍රදර්ශනය යන දෙඅංශයෙන්ම කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. අවස්ථාව ලබාදෙන ක්‍රීඩාවල විවිධත්වය, නිතිපතා පුහුණු සැසි සහ අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි වල සාර්ථකත්වය, එහි සිසුන් සඳහා පුළුල් පරාසයක අධ්‍යාපනික අත්දැකීමක් පෝෂණය කිරීමට විශ්වවිද්‍යාලයේ කැපවීම සහ සේවකයින්ගේ යහපැවැත්ම කෙරෙහි දක්වන සැලකිල්ල පිළිබිඹු කරයි.



## 4.2 පර්යේෂණ සහ ප්‍රකාශන වැඩිදියුණු කිරීම

### 4.2.1 සී.ඩී.එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකය (CDSKARU)

සී.ඩී.එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකය (CDSKARU) 2024 දී ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ එහි මෙහෙවර සාර්ථකව ඉදිරියට ගෙන ගොස් ඇත. සාම්ප්‍රදායික දැනුම වටා පර්යේෂණ සංස්කෘතිය වර්ධනය කිරීම සහ ජාත්‍යන්තර පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා දායක වීම කෙරෙහි අවධානය යොමු කළ වැඩමුළු දෙකක් සංවිධානය කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම් අතරට ඇතුළත් විය. මහාචාර්ය ඉරංගා සමින්දනී ගේ නායකත්වය යටතේ මෙම ඒකකය ICH ජාත්‍යන්තර පර්යේෂණ සාරාංශ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කළ අතර සංගීතය පිළිබඳ පර්යේෂණ සඟරාව සහ විශ්වවිද්‍යාලයේ ඩිජිටල් ගබඩාව සඳහා පීය සහභාගීත්වය දිරිමත් කළේය. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය( NCAS) විසින් සංවිධානය කරන ලද 2024 සමාජ විද්‍යාව පිළිබඳ 6 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයට ද මෙම ඒකකය දායකත්වය සැපයීය. තවද, ද්‍රව්‍ය සත්‍යාපනය කිරීමට සහ සුරක්ෂිත කිරීමට මේ වන විට ගනු ලබන උත්සාහයන් සමග CDSKARU එහි ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව සංරක්ෂණය කිරීම සහ පුළුල් කිරීම සඳහා කටයුතු කළේය. විශේෂයෙන් ම, පණ්ඩුල මහතා විසින් පරිත්‍යාග කරන ලද චිත්‍රපට එකතුවක් ප්‍රධාන පුස්තකාලයට එකතු කරන ලද අතර JCDSKAR 3 වන වෙළුම ප්‍රකාශනය සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

විශේෂ අවස්ථා

| කාර්යය | මාතෘකාව |
|---|---|
| **පර්යේෂණ දැනුම සංවර්ධනය සඳහා වැඩමුළු** | නර්තන හා නාට්‍ය කලා පීඨය විසින් සංවිධානය කරන ලද සෞන්දර්ය යනු චිකිත්සාවකි |
| | හින්දුස්ථානි රග සහ රගංග<br>ඉලක්කය: **:** පර්යේෂණයේ දී ස්වර ප්‍රස්ථාර පිළිබඳ සාක්ෂරතාව වැඩිදියුණු කිරීම |
| **CDSKAR** සඟරාව | අංක 01, 3 වන වෙළුම සඳහා ලිපි රැස් කිරීම මෙහිදී සඟරා සමාලෝචනයේ දී කර්තෘගේ හා සමාලෝචකගේ අනන්‍යතාවය එකිනෙකාට නිරාවරණය නොවේ. |
| වෙනත් ප්‍රකාශන සඳහා දායකත්වය | JRM **සංස්කාරක මණ්ඩල සාමාජික**<br>ICH **ජාත්‍යන්තර පර්යේෂණ පිළිබඳ සාරාංශයේ ප්‍රධාන සංස්කාරක** |
| | *සංස්කරණ සහකාර වශයෙන් JRM වෙත දායකත්වය සැපයීම* |
| **සමාජවිද්‍යා පිළිබඳ 6වන ජාත්‍යන්තර පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය** | *ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ කමිටු සාමාජික - නිලූකා තිලකරත්න* |
| ශ්‍රව්‍ය දෘශ්‍ය **(AV)** සංරක්ෂණය | |

| | |
|---|---|
| ශ්‍රව්‍ය දෘශ්‍ය අත්පොත සඳහා ප්‍රවේශය | ඒකකයේ ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම සඳහා සාකච්ඡා, ක්‍රියාත්මක කිරීම සහ පුළුල් එකතු කිරීම් සිදු කර තිබේ. 203 වන පාලක සභාව විසින් ස්ථාපිත කමිටුව සමග ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය සත්‍යාපනය කිරීම සහ සංරක්ෂණය සඳහා රැස්වීමක් කැඳවීමට පියවර ගැනීම. මහාචාර්ය ඉරංගා සමින්දනි විසින් එකතු කරන ලද චිත්‍රපට එකතුවක් ප්‍රධාන පුස්තකාලයට පණ්ඩුල මහතා විසින් පරිත්‍යාග කරන ලදී. |
| | රැස්කරන ලද චිත්‍රපට එකතුවක් පණ්ඩුල ගොඩවත්ත මහතා විසින් *(186 A/V)* සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයයේ ප්‍රධාන පුස්තකාලය වෙත නැවත ප්‍රදානය කරන ලදී . |

**4.2.2 2024 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලද පර්යේෂණ පත්‍රිකා / ඉදිරිපත් කිරීම්**

2024 වර්ෂය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පීඨ සාමාජිකයින් විසින් විවිධාකාරයෙන් සැලකිය යුතු පර්යේෂණ දායකත්වයන් දක්වා තිබේ. මෙම පර්යේෂණ පත්‍රිකා සහ ඉදිරිපත් කිරීම් බහු විෂයයන් ආවරණය කරන අතර, අධ්‍යාපනය, සංගීතය, නැටුම්, නාට්‍ය, කෘතිම බුද්ධිය සහ තවත් බොහෝ ක්ෂේත්‍ර හරහා දැනුම දියුණු කිරීමට විශ්වවිද්‍යාලයේ කැපවීම පිළිබිඹු කරයි.

**මහාචාර්ය රොහාන් නෙත්සිංහ**

1. **සහයෝගීත්ව ඉගැන්වීම තුළින් සංස්කෘතික අවබෝධයන් ප්‍රවර්ධනය කිරීම: ගුරු අධ්‍යාපනයේ අතථ්‍ය බෙර වාදන අවස්ථා**
   *සඟරාව : අන්තර් සංස්කෘතික අධ්‍යාපනය, 1-15*
   *(Q1 ශ්‍රේණිගත කිරීම, Routledge සඟරාව) 2024*

2. **ශ්‍රී ලාංකික බිහිරි හෝ ශ්‍රවණාබාධ ඇති අයගේ සංඥා භාෂා භාවිතය**
   *සඟරාව : බිහිරි අධ්‍යයන සහ බිහිරි අධ්‍යාපන සඟරාව, 29(2), 187-198*
   *(Q2 ශ්‍රේණිගත කිරීම, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය) 2024*

3. **වෘත්තීයමය ඉගෙනීම: අතථ්‍ය සම්බන්ධතා හරහා අන්තර් සංස්කෘතික දෘෂ්ටි හුවමාරුව**
   *සඟරාව: අධ්‍යාපනික පර්යේෂණවල ගැටළු, 34(1), 77-96*
   *(Q2 ශ්‍රේණිගත කිරීම, WA අධ්‍යාපන පර්යේෂණ සඟරාව)* ***2024***

**කමනි සමරසිංහ මහත්මිය**

1. **සංගීත හැඟීම් වර්ගීකරණය: සාහිත්‍ය සමාලෝචනයකි**
   *සඟරාව: සංගීතය පිළිබඳ පර්යේෂණ සඟරාව, 2(2), 14-28 2024*

2. **ශ්‍රී ලංකාවේ සංගීත උරුමය ආරක්ෂා කිරීම: ඩබ්ලිව්. බී. මකුල්ලොලුවගේ ඓතිහාසික ක්ෂේත්‍ර පටිගත කිරීම් ප්‍රතිසංස්කරණය සහ ඩිජිටල්කරණය**
   *55 වන ජාත්‍යන්තර ශබ්ද සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛනාගාර සංගමය (සෞන්දර්ය අධ්‍යයන ආයතනය A) වාර්ෂික සමුළුව - වැලෙන්සියා, ස්පාඤ්ඤය*
   *2024 සැප්තැම්බර් 23-26*

3. **“කලා හා සංස්කෘතීන්ගේ සහජීවනය: ප්‍රකාශනය, සම්බන්ධතාවය සහ යහපැවැත්ම පෝෂණය කිරීම” යන තේමාව යටතේ පැවති ජාත්‍යන්තර සංගීත සමුළුව පිළිබඳ සමාලෝචනයක්**
*සඟරාව: සංගීතය පිළිබඳ පර්යේෂණ සඟරාව, 2(1)* 2024

4. **සංසන්දනාත්මක විශ්ලේෂණයක් ශ්‍රී ලංකා-සබරගමුව පහන් මඩු චාරිත්‍ර පිළිබඳ භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රය**
*සඟරාව: ශ්‍රී ලංකා සෞන්දර්ය අධ්‍යයන සඟරාව, 2(2)2024*

5. **විලියම් බණ්ඩා මකුල්ලොලුවගේ දායකත්වයන් පිළිබඳ චරිතාපදාන අධ්‍යයනයක්**
*සඟරාව: ආසියානු-යුරෝපීය සංගීත පර්යේෂණ සඟරාව, 14, 77-86 2024*

6. **ලංකාවේ (ශ්‍රී ලංකාවේ) වැදි සංගීතය පිළිබඳ ආර්නෝල්ඩ් බේක්ගේ පටිගත කිරීම් නැවත අධ්‍යයනය කිරීම: 1938-2024**

*තායිවානයේ සංගීතය සහ සුළු ජාතීන් පිළිබඳ ICTMD අධ්‍යයන කණ්ඩායම සමඟ ඒකාබද්ධ දිනයක් සමඟ දේශීය සංගීතය සහ නර්තනය පිළිබඳ ICTMD අධ්‍යයන කණ්ඩායමේ 2 වන සම්මන්ත්‍රණය 2024*

7. **ශ්‍රී ලංකාවේ අංකෙලිය පත්තිනි චාරිත්‍රානුකූල ක්‍රීඩාවේ සමාජ-සංස්කෘතික වැදගත්කම සහ ප්‍රජා ගතිකත්වය ගවේෂණය කිරීම**
*සඟරාව: අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය පිළිබඳ සඟරාව, 3(1), 1-13 2024*

8. **ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජන සංගීතය ආරක්ෂා කිරීම හා සංරක්ෂණය**
සඟරාව: ශ්‍රී ලංකා සෞන්දර්ය අධ්‍යයන සඟරාව, 2(1), 1-4
2024

9. **ඔරොත්තු දීමේ රිද්ම: ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාසයන්ට ප්‍රතිචාරයක් ලෙස සාම්ප්‍රදායික බෙර නිෂ්පාදනය**

*බංග්ලාදේශයේ ඩකා විශ්වවිද්‍යාලයේ, මහා දකුණු ආසියාවේ සංගීතය සහ අනුබද්ධ කලාවන් පිළිබඳ ICTMD අධ්‍යයන කණ්ඩායමේ 3 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2024*

**වසන්ත කුමාර මහතා**

1. **ප්‍රාථමික අධ්‍යාපනයේ සංගීතය ඉගැන්වීම පිළිබඳ ශ්‍රී ලාංකික ගුරුවරුන්ගේ සංජානන මත පදනම් වූ ගවේෂණාත්මක අධ්‍යයනයක්**
*සම්මන්ත්‍රණය: ඉංග්‍රීසි භාෂා අධ්‍යයනයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, ඉංජිනේරු සහ කළමනාකරණ විශ්ව විද්‍යාලය, ජයිපූර්, රාජස්ථාන්, ඉන්දියාව*
2024

2. **සංගීත ක්‍රියාකාරකම් භාවිතා කරමින් ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අදියර 2 හි සිසුන්ගේ සංජානන කුසලතා වර්ධනය කිරීම**
සම්මන්ත්‍රණය: 4 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය 2024, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
2024

**ආචාර්ය චම්මික මල්ලවආරච්චි**

1. ***STEM උපාධි අපේක්ෂකයින් සහ කෘතිම බුද්ධිය පිළිබඳ නිපුණතාවය: කෘතිම බුද්ධි සාක්ෂරතා සංජානනය***
*ව්‍යාපාර, නවෝත්පාදන සහ සමාජය පිළිබඳ 4 වන ජාත්‍යන්තර අතථ්‍ය සමුළුව, මැලේසියාව,*
*2024*

**ආචාර්ය සුමුදු ඇඹෝගම**

1. තාක්ෂණය පදනම් කරගත් ESL උපදේශන ද්‍රව්‍ය සංවර්ධනය: ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාල සන්දර්භයකින් තීක්ෂ්ණ බුද්ධිය සහ නිර්දේශ
*IRTEC-2024*
*2024*

2. ජනප්‍රිය සිංහල ගීතිකා වල මාතෘත්වය සහ මාතෘත්වය නියෝජනය කිරීම
*සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ සංගීත පර්යේෂණ සභාරාව*
*2024*

**මහාචාර්ය සෞම්‍ය ලියනගේ**

1. ***ජාතික ඡායාරූප සංගමයේ ඩිප්ලෝමා සම්මාන උළෙලේදී ප්‍රධාන දේශනය පවත්වන ලදී***
*2024 ඔක්තෝබර් 26, ශ්‍රී ලංකාව, සෙත්සිරිපාය බත්තරමුල්ල*
*2024*

2. ***Put Yourself in Another Person's Shoes" (යම් සිද්ධියක් දෙස වෙනත් තැනැත්තෙකුගේ කෝණයකින් බැලීම)*** **යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය: වෛද්‍ය වෘත්තිකයන්ට නළු නිළියන්ගෙන් ඉගෙන ගත හැකි දේ**
*කොළඹ වෛද්‍ය සම්මේලනය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය*
*2024 දෙසැම්බර් 7*

3. **'යුද්ධයේ තුවාල' 'Wounds of War': සමාජ පරිවර්තනයේ මණ්ඩල රඟහල මැදිහත්වීම්**
*නේපාලයේ කත්මණ්ඩු නුවර මණ්ඩල රඟහල විසින් ප්‍රකාශයට පත් කරන ලද පොතක් සඳහා ලියන ලද පරිච්ඡේදය*
*2024*

4. **තාගෝර් සහ සරච්චන්ද්‍ර: ජාතිකවාදය සහ ධර්මිෂ්ඨ සමාජයක් නිර්මාණය කිරීම යන මාතෘකාව යටතේ පරිච්ඡේදය**
*ස්වාමි විවේකානන්ද මධ්‍යස්ථානය (ඉන්දියානු සංස්කෘතික මන්දිරය), කොළඹ*
*2023 නොවැම්බර්–2024*

5. **දේවත්වයෙන් පරිහානියට (Divinity to Diminishing) යන මාතෘකාව යටතේ පර්යේෂණ පත්‍රිකාව.**
*මානුෂීය වැඩසටහන හරහා ගුරුවරුන්ගේ වෙනස්වන භූමිකාව විශ්ලේෂණය කිරීම*
*කොළඹ වෛද්‍ය සම්මේලනය (APMEC, දෙසැම්බර් 2024)*
*2024*

6. **Echoes of Joy: 'Happiness through Movement and Sound' ප්‍රීතියේ දෝංකාරය: 'චලනය සහ ශබ්දය තුළින් සතුට'**
*කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ භාවනා මධ්‍යස්ථානය විසින් විඥානය, සතුට සහ භාවනාව පිළිබඳ සංවිධානය කරන ලද පූර්ව-කොංග්‍රස් වැඩමුළුවේදී මණ්ඩල සාමාජික සහ වැඩමුළු ඉදිරිපත් කිරීම: 2024 දෙසැම්බර් 10*

7. **අංගම් පොර ශිල්ප ක්‍රම: මූර්තිමත් ප්‍රසංගය හරහා රංගන ශිල්පියෙකුගේ ශරීර මනස සංවර්ධනය කිරීම යන මාතෘකාව යටතේ වැඩමුළු ඉදිරිපත් කිරීමේ සම-කර්තෘ**
*කාර්ය සාධන අධ්‍යයන ජාත්‍යන්තරය (Psi 2024), රාජකීය මධ්‍යම කථන හා නාට්‍ය පාසල, ලන්ඩන්*
*2024 ජූනි*

8. **දේවත්වයෙන් පරිහානියට (Divine to Diminishing): මානුෂීය වැඩසටහන හරහා ගුරුවරුන්ගේ වෙනස්වන භූමිකාව විශ්ලේෂණය කිරීම යන මාතෘකාව යටතේ වන සාරාංශයේ සම-කර්තෘ**
*AMPACK 2024, ආසියා පැසිෆික් වෛද්‍ය අධ්‍යාපන සමුළුව*
*2024 ජනවාරි 15-21*

## 4.3 නවෝත්පාදන සහ නිර්මාණාත්මක කාර්යයන්

### 4.3.1 පර්යේෂණ, නිර්මාණාත්මක කෘති සහ දැනුම ව්‍යාප්තිය සඳහා වූ මධ්‍යස්ථානයේ කාර්යසාධනය

පර්යේෂණ, නිර්මාණාත්මක කෘති සහ දැනුම ව්‍යාප්තිය සඳහා වූ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය පුරා නිර්මාණශීලිත්වය, සහයෝගීතාවය සහ දැනුම බෙදා ගැනීම අවධාරණය කරන විවිධාකාරයෙන් බලපාන ක්‍රියාකාරකම්වල නියැලී විශේෂ අවස්ථා බහුල වසරක් ගත කර තිබේ. සුවිශේෂී සිදුවීම් අතර 2024 දෙසැම්බර් 18 වන දින පැවති නත්තල් කැරොල් සැමරුම ද විය. මෙම අවස්ථාව සිසුන්, පීඨය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය උත්සව අසිරියෙන් ප්‍රබෝධමත් කළේය. මෙම උත්සවය පුද්ගල දක්ෂතා එළිදැක්වීමට මූලාරම්භයක් විය. මෙය අනධ්‍යයන කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීමට සහ ඔවුන්ගේ සැඟවුණු කුසලතා ප්‍රදර්ශනය කිරීමට, අනධ්‍යයන සේවකයින්ගේ චිත්ත ධෛර්යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලදී. මෙයට සතියකට පැය දෙකක කාලයක් නිර්මාණාත්මක කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා කැප කිරීම, කාර්ය මණ්ඩලයට නිර්මාණාත්මක ප්‍රකාශනයේ යෙදීමට, මිත්‍ර සම්බන්ධතා ගොඩනඟා ගැනීමට සහ ඔවුන්ගේ සමස්ත යහපැවැත්ම වැඩිදියුණු කිරීමට අවස්ථාවක් ලබා දීම ඇතුළත් විය. මෙම ක්‍රියාකාරකම් මගින් අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ සුපුරුදු චර්යාවෙන් විවේකයක් ලබා ගැනීමටත්, විශ්වවිද්‍යාලය තුළ ප්‍රජාව පිළිබඳ හැඟීමක් ඇති කිරීමටත්, ඔවුන් සවිබල ගැන්වීමටත්, ඔවුන්ගේ කාර්ය ජීවිත සමතුලිතතාවය වර්ධනය කිරීමටත් ඉඩ සැලසුණි.

බටහිර සංගීත අධ්‍යයනාංශයේ දායකත්වයෙන් පීඨයේ සිසුන් ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද මෙම කැරොල් ප්‍රසංගය සංගීතය මුසුවූ සමූහ සැමරුම් පිරි ආනන්දජනක සැදෑවක් විය. බටහිර සහ උතුරු ඉන්දියානු සංගීත අධ්‍යයනාංශවල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන මනෝජ් සංජීව මහතා සහ රවීන්ද්‍ර අලගියවන්න මහතා මෙම අවස්ථාවට සහාය දැක්වූ අතර, නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නැටුම් අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ඒ. ඩී. ජගත් පද්මසිරි මහතා තම නර්තන ශාස්ත්‍රය සහ වේශ නිරූපණ විශේෂඥතාවයෙන් උත්සවය ප්‍රභාමත් කළේය. මෙම සැමරුම සංවිධානය කිරීමේදී ආචාර්ය තරංග දන්දෙනිය මහතා සහ මධ්‍යස්ථානයේ කණ්ඩායම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළහ.

මධ්‍යස්ථානය විසින් වසර පුරාම පර්යේෂණ සහ නිර්මාණාත්මක කෘති පෝෂණය කිරීම සහ ව්‍යාප්තිය කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. එමඟින් අධ්‍යයන කතිකාව සහ සහයෝගීතාවය දිරිමත් කිරීම සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. මෙම ආරම්භක පියවර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පරිසරය වැඩිදියුණු කිරීම සහ නිර්මාණාත්මක ප්‍රකාශනය සහ දැනුම හුවමාරුව සඳහා වේදිකාවක් සැපයීම යන දෙකම අරමුණු කර ගෙන තිබේ.

මෙම මධ්‍යස්ථානය අන්තර් විෂය පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කළ අතර, ගෝලීය වශයෙන් දැවෙන ගැටලුවලට විසඳුම් සොයන ව්‍යාපෘති සඳහා පීඨයට සහ සිසුන්ට සහයෝගයෙන් වැඩ කළ හැකි පරිසරයක් නිර්මාණය කළේය. පුළුල් අධ්‍යයන ප්‍රජාවට දායක වීමට විශ්වවිද්‍යාලයේ කැපවීම ශක්තිමත් කරමින්, පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම සඳහා එය තවදුරටත් සහාය දැක්විය.

### 4.3.2 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය

2021 ජනවාරි 13 වන දින ආරම්භ කරන ලද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය ශ්‍රී ලංකාවේ පිළිගත් අධ්‍යයන ප්‍රකාශන වේදිකාවක් දක්වා වේගයෙන් වර්ධනය වී ඇත. උසස් තත්ත්වයේ, දිගුකාලීන අධ්‍යයන ප්‍රකාශනය සඳහා ස්ථානයක් සපයමින් දේශීය අධ්‍යයන ප්‍රකාශන ක්ෂේත්‍රයේ හිඩැස පිරවීම සඳහා මෙම මුද්‍රණාලය නිර්මාණය කරන ලදී. එහි ගමන්මගේදී ශාස්ත්‍රීය දැනුම සහ සංස්කෘතික උරුමය වර්ධනයට දායක වන කෘති නිෂ්පාදනය කිරීමේදී විද්වතුන්, පර්යේෂකයින් සහ කතුවරුන්ට සහාය වීම අරමුණු කර ගෙන ඇත.

**විශේෂ අවස්ථා**

1. **ප්‍රකාශන:**

   - 2024 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය විවිධ මාතෘකා සහ අධ්‍යයන ක්ෂේත්‍ර සඳහා සැලකිය යුතු දායකත්වයක් ප්‍රදර්ශනය කරමින් අධ්‍යයන කෘති 18 ක් සාර්ථකව ප්‍රකාශයට පත් කර ඇත.

   **2024 වර්ෂයේ සුවිශේෂී ප්‍රකාශන**

   රංජිත් ප්‍රනාන්දු මහතා විසින් රචිත "සංගීත විද්‍යාව" - සංගීත අධ්‍යයන ක්ෂේත්‍රයේ නවතාවයෙන් යුතු කෘතියකි.

   2024 රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේදී හොඳම මුල් නාට්‍ය පිටපත (ඉංග්‍රීසි) සම්මානය දිනාගත් ආචාර්ය තරංග දන්දෙණිය විසින් රචිත "The God King Drama" කතුවරයාට සහ එළිදැක්වීම යන දෙකටම සැලකිය යුතු ජයග්‍රහණයකි.

2. **කර්මාන්ත හඳුනාගැනීම:**

   - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය 2024 දී ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමයේ නිල සාමාජිකයෙකු බවට පත් වූ අතර, ජාතික ප්‍රකාශන කර්මාන්තය තුළ එහි පැවැත්ම තහවුරු කළේය.
   - **කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය 2024:** සැප්තැම්බර් 27 සිට ඔක්තෝබර් 6 දක්වා පැවති මෙම කීර්තිමත් ප්‍රදර්ශන අවස්ථාවට මුද්‍රණාලය දෙවන වරට සහභාගී වූ අතර එහිදී අපි අපගේ ප්‍රකාශන පුළුල් පාඨක පිරිසකට ඉදිරිපත් කළෙමු. එහිදී කර්මාන්ත වෘත්තිකයන් සමඟ ජාලගතව වටිනා ප්‍රසිද්ධියක් ලබා ගත්තෙමු.
   - ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද පොත් පරිත්‍යාග ව්‍යාපාරයට ද අපි දායක වූ අතර සාක්ෂරතාවය සහ දැනුම ව්‍යාප්තියට සහාය වීම සඳහා අපගේ කැපවීම තවදුරටත් තහවුරු කළෙමු.

3. **දැනුම බෙදාදීමේ ග්‍රන්ථ මාලාව :**

   - අධ්‍යයන දැනුම වඩාත් ප්‍රවේශ විය හැකි කිරීම සඳහා අපගේ මෙහෙවරට අනුකූලව, පුළුල් ප්‍රජාව සමඟ අධ්‍යයන දැනුම බෙදා ගැනීම සඳහා නිර්මාණය කර ඇති අඩු වියදම් පොත් මාලාවක් නිර්මාණය කිරීමට සහභාගී වන ලෙස අපි පීඨයට සහ කථිකාචාර්යවරුන්ට ආරාධනා කළෙමු. බොහෝ කථිකාචාර්යවරුන් අත්පිටපත් ඉදිරිපත් කළ අතර මෙම මුලපිරීම අපගේ ප්‍රකාශන උපාය මාර්ගයේ වැදගත් කොටසක් ලෙස අඛණ්ඩව වර්ධනය වේ.

4. **මාධ්‍ය ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය:**

- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ අධ්‍යක්ෂවරයා විසින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනියේ "සාහිත්‍ය අස්වැන්න" වැඩසටහන මෙහෙයවන ලද අතර එය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශිත කෘති ප්‍රවර්ධනය කිරීම සඳහා උපකාරී වී ඇත. මෙම වැඩසටහන කතුවරුන්, විද්වතුන් සහ සාමාන්‍ය ජනතාවට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය විසින් නිකුත් කරන ලද පොත් සහ ප්‍රකාශන සමඟ සම්බන්ධ වීමට වේදිකාවක් වශයෙන් කටයුතු කරයි.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය 2024 දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර ප්‍රකාශන සහ මූල්‍ය වර්ධනය අතින් පමණක් නොව කර්මාන්ත සහභාගීත්වය සහ මාධ්‍ය සම්බන්ධතා අතින් ද සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. සුවිශේෂී කෘති ප්‍රකාශනය, ජාතික උත්සව සඳහා අපගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ දැනුම හුවමාරු කරගැනීමේ සංකල්පය දියත් කිරීමත් සමග සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය ශ්‍රී ලාංකික අධ්‍යයන ප්‍රකාශ අංශයේ ප්‍රධාන ආයතනයක් බවට පත්වීමට හොඳින් ගමන් කරමින් සිටියි. ඉදිරි කටයුතු සැලසුම් කිරීමේ දී අපගේ ප්‍රකාශන උත්සාහයන් තවදුරටත් පුළුල් කිරීම, වැඩි සහයෝගීතාවයක් ඇති කිරීම සහ අධ්‍යයන හා සාහිත්‍ය ප්‍රජාවන් තුළ අපගේ කාර්යයේ බලපෑම වැඩි කිරීම අපගේ අරමුණයි.

## 4.3.3 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනී නාලිකාව

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 2022 දී සාඩම්බරයෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනී නාලිකාව ආරම්භ කළ අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම විශ්වවිද්‍යාලකට හිමිකම් කියන රූපවාහිනී නාලිකාව ලෙස ඉතිහාසයට එක් විය. PEO TV (නාලිකාව 123) සහ YouTube ඔස්සේ විකාශනය වන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ඉතිහාසයේ සැලකිය යුතු සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් රටේ අධ්‍යාපනික හා සංස්කෘතික අංශවල කඩඉමක් ලෙස කෙටි කාලයක් තුළ ස්ථාපිත වී තිබේ.

ශ්‍රී ලංකාවේ කලාව, සංස්කෘතිය සහ ශාස්ත්‍රීය කතිකාවේ දෘශ්‍යතාව ඉහළ නැංවීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමේ නියැළී සිටියි. සාමාන්‍ය රූපවාහිනියේ සෞන්දර්යය, කලාව සහ ශාස්ත්‍රීය සාකච්ඡා වැනි විෂයයන් සඳහා ලබා දී ඇති සීමිත විකාශන කාලය හඳුනා ගනිමින් මෙම නාලිකාව කලාව, සංස්කෘතිය සහ ශාස්ත්‍රීය ප්‍රවර්ධනය සඳහා කැපවූ වේදිකාවක් ලෙස සේවය කරයි. එය ශාස්ත්‍රීය ප්‍රජාව තුළ ගැඹුරු සම්බන්ධතා පෝෂණය කරන අතරම නිර්මාණාත්මක කර්මාන්තය සමෘද්ධිමත් වීමට සැලකියයුතු අවකාශයක් සපයයි. කලා හා සංස්කෘතික අංශයට ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා නාලිකාවේ මෙහෙවර ගැඹුරින් මුල් බැස තිබේ. එය විද්වතුන්, කලාකරුවන් සහ අධ්‍යාපනඥයින්ගෙන් නවෝත්පාදන, පර්යේෂණ සහ කලාත්මක නිර්මාණ ප්‍රචාරණය සඳහා වේදිකාවක් සපයයි. ඒ තුළින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාරිනී නාලිකාව ශ්‍රී ලංකාවේ කලාවේ නිර්මාණකරුවන් සහ පුළුල් මහජනතාව අතර පාලමක් ලෙස ක්‍රියා කරන අතර ජාතික සංස්කෘතික සංවාදයට දායකත්වය සපයමින් ජාතියේ ප්‍රමුඛ කලාකරුවන් සහ විද්වතුන් පෝෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම නැවත තහවුරු කරයි.

විකාශන වේදිකාවක් වීමට අමතරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය සිසුන් සඳහා අත්‍යවශ්‍ය පුහුණු මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත. නවීන තාක්ෂණික පහසුකම් වලින් සමන්විත එය මාධ්‍ය නිෂ්පාදනයේ ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලබා දෙයි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සිසුන් 200 කට අධික සංඛ්‍යාවක් මේ තුළින් ලැබෙන ප්‍රායෝගික පුහුණුවෙන් ප්‍රතිලාභ ලබා ඇත. තවද, කැලණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය ඇතුළු අනෙකුත් ආයතනවල සිසුන් සඳහා මෙම නාලිකාව වටිනා සීමාවාසික පුහුණු අවස්ථා ලබා දෙන අතර කලා හා මාධ්‍ය ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අතර සහයෝගීතාවය සහ වෘත්තීය සංවර්ධනය මෙමඟින් පෝෂණය කරයි.

රූපවාහිනී නාලිකාවේ වැඩසටහන් විවිධ විෂයයන් ආවරණය කරමින් ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ අධ්‍යාපනික අන්තර්ගතයන් ප්‍රදර්ශනය කරයි. කලා ලෝක, අරුණානන්ද, අර්ථ, මහාචාර්ය

හෝරාව, ගීතාර්ථ, තක්සලාව, සෞන්දර්ය සහ කලා පලස වැනි වැඩසටහන් ශ්‍රී ලාංකික කලාව, සංස්කෘතිය සහ අධ්‍යාපනයේ විවිධ පැතිකඩ පිළිබිඹු කරයි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය රාජ්‍ය නාට්‍ය උළෙල ඇතුළු ප්‍රධාන ජාතික උත්සව ද ආවරණය කරමින් එහි ජාතික පැවැත්ම සහ බලපෑම වැඩි දියුණු කරයි.




මෙම වැඩසටහන් වටිනා අන්තර්ගතයන් සපයනවා පමණක් නොව සිසුන්ට, අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ විද්වතුන්ට සම්බන්ධ වීමට, දායක වීමට සහ සහයෝගයෙන් කටයුතු කිරීමට වේදිකා නිර්මාණය කරයි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනී නාලිකාව 2025 වර්ෂයේ දී කලාව, සංස්කෘතිය සහ අධ්‍යාපනය පිළිබඳ උසස් ජාතික සංවාදයක් සමඟින් නව මුහුණුවරකින් එහි වැඩසටහන් නැවත දියත් කිරීමට අපේක්ෂා කරන අතර ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයට දීර්ඝ කාලීන බලපෑමක් ඇති කරනු ඇත.

### 4.3.4 විශ්වවිද්‍යාලීය ව්‍යාපාරික සම්බන්ධක ඒකකය (University Business Linkage (UBL) Cell)

විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකය 2024 දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර උපායමාර්ගික ව්‍යාපෘති සහ ආරම්භක පියවර රැසක් මඟින් ශාස්ත්‍රීය හා කර්මාන්ත අතර පරතරය පියවීමට කටයුතු කරයි. මෙම වසරේදී, විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය පුළුල් ප්‍රජාව සමග විශ්වවිද්‍යාලයේ සම්බන්ධතා ශක්තිමත් කිරීම, නිර්මාණාත්මක කලාවන් ප්‍රවර්ධනය කිරීම සහ සිසුන්ට සැබෑ ලෝක අත්දැකීම් ලබා ගැනීමට වටිනා අවස්ථා ලබා දීම කෙරෙහි අවධානය යොමු කර තිබේ.

මෙම වසරේ විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය වෙතින් කැපී පෙනෙන දායකත්වයක් වූයේ විශ්වවිද්‍යාලයේම රූපවාහිනී නාලිකාවක් වන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය සඳහා සහය දැක්වීමයි. වාණිජ හවුල්කරුවෙකු ලෙස විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය මෙම රූපවාහිනී නාලිකාව ප්‍රවර්ධනය කිරීමට සහයෝගය දැක්වූ අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය හා කලාත්මක ප්‍රදානයන් වෙත පුළුල් ලෙස නිරාවරණය කිරීමට ඉඩ සලසයි. මෙම හවුල්කාරිත්වය විශාල ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා වීමට, විශ්වවිද්‍යාල සිසුන්ගේ ක්‍රියාකාරකම් සහ කුසලතා ප්‍රදර්ශනය කිරීමට සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වැඩසටහන් සහ සංකල්පවල දෘශ්‍යතාව ඉහළ නැංවීමට උපකාරී වී ඇත. ඊට සමගාමීව විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය ශ්‍රී ලංකාවේ නාට්‍ය කර්මාන්තයේ වර්ධනයට අඛණ්ඩව සහාය දක්වා තිබේ. www.drama.lk වේදිකාව ඔස්සේ විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය නාට්‍ය නිෂ්පාදන සජීවීව විකාශනය කිරීමට සහ අලෙවිකිරීමට පහසුකම් සපයා ඇත. තවමත් සංවර්ධනය වෙමින් පවතින මෙම සංකල්පය මඟින් දේශීය නාට්‍යයේ ප්‍රවේශය පුළුල් කිරීමට උත්සාහ දරන අතර එහි සාර්ථකත්වය සහතික කිරීම සඳහා වාණිජ හවුල්කාරිත්වයන් සුරක්ෂිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය ක්‍රියාකාරීව කටයුතු කරයි. විශ්වවිද්‍යාලයීය පොත්හල යනු සිසුන්ට අධ්‍යයන පොත් සහ ලිපි ද්‍රව්‍ය ලබා ගැනීමට පහසු ප්‍රවේශයක් සැපයීම අරමුණු කරගත් විශ්වවිද්‍යාල

ව්‍යාපාරික සම්බන්ධක ඒකකය හි මූලික සංකල්පයකි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් නර්තන ප්‍රසංග මගින් ප්‍රවර්ධනය කරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය නර්තන කණ්ඩායම සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය අඛණ්ඩව සහයෝගය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සමෘද්ධිමත් සංස්කෘතික උරුමය ප්‍රදර්ශනය කරනවා පමණක් නොව විවිධ ප්‍රේක්ෂක කණ්ඩායම් සමග සම්බන්ධව ඉදිරිපත් කිරීම් සිදු කිරීමට සිසුන්ට අවස්ථා ලබා දෙයි. මෙම මුලපිරීම් වලට අමතරව, විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට සහ වෘත්තීය ලෝකයට නිරාවරණය වීමට ඉඩ සලසන සීමාවාසික පුහුණු අවස්ථා ලබා දීමෙන් ශිෂ්‍ය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර තිබේ. මෙම සීමාවාසික පුහුණුව සිසුන්ට ඔවුන්ගේ අනාගත වෘත්තීන් සඳහා අවශ්‍ය කුසලතා ලබාගැනීමට උපකාර වන අතරම විශ්වවිද්‍යාලය සහ විවිධ කර්මාන්ත අතර සබඳතා වර්ධනය කිරීමට ද උපකාරී වේ.

එමෙන්ම විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය විසින් ඉන්දියාවේ සිසුන් සමඟ දෙදින සංස්කෘතික හුවමාරු වැඩසටහනක් සඳහා පහසුකම් සපයන ලදී. ඉන්දියානු සහ ආසියානු නර්තන අධ්‍යයනාංශය සහ උඩරට නර්තන අධ්‍යයනාංශය සමඟ සහයෝගීත්වයෙන් සංවිධානය කරන ලද මෙම වැඩසටහනට වැඩමුළු, සංස්කෘතික ප්‍රසංග සහ අවස්ථා කළමනාකරණ පැවරුමක් ඇතුළත් විය. මෙම සංකල්පය ඔස්සේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සහ ආරාධිත විශ්වවිද්‍යාල යන දෙඅංශයේම සිසුන්ට සහ විශ්ව විද්‍යාලවලට පැමිණෙන සිසුන්ට හරස් සංස්කෘතික ඉගෙනීමේ නිරත වීමට සහ නර්තනයේ සහ අවස්ථා කළමනාකරණයේ උසස් සම්ප්‍රදායන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.

සමස්තයක් ලෙස 2024 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකයේ උත්සාහයන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සහ පුළුල් ප්‍රජාව අතර සම්බන්ධතාවය ශක්තිමත් කර ඇති අතර සිසුන් වෙත අගනා අවස්ථා ලබා දෙමින් සහ විශ්වවිද්‍යාලයේ දෘශ්‍යතාව සහ කලාවන් සමඟ සම්බන්ධ වීම වැඩි දියුණු කර තිබේ. විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර තබමින් විශ්වවිද්‍යාලයේ සහ එහි සිසුන්ගේ වර්ධනයට සහාය වන සහයෝගීතා සහ හවුල්කාරිත්වයන් පෝෂණය කිරීමට කැපවිය.

## 4.4 විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකය

### 4.4.1 තත්ත්ව සහතික මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය ආයතනික සමාලෝචන නිර්දේශ මත පදනම්ව පුළුල් ප්‍රතිපත්ති සහ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි (SOPs) මාලාවක් සකස් කර ඇත. පාලනය සහ කළමනාකරණය, ඉගැන්වීම සහ ඉගෙනීම, පර්යේෂණ සහ නව නිපැයුම්වල කාර්යක්ෂමතාව සහ අධ්‍යයන වැඩසටහන්වල සමස්ත ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් 2024 වසර වන විට කෙටුම්පත් කරන ලද නව ප්‍රතිපත්ති 42 ක්, අතුරු ව්‍යවස්ථා 2 ක් සහ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි 20 ක් කෙටුම්පත් කරන ලදී. දැනුවත් කිරීමේ වැඩමුළු හරහා ශිෂ්‍ය ප්‍රජාව අතර මෙම ප්‍රතිපත්ති, අතුරු ව්‍යවස්ථා සහ සම්මත මෙහෙයුම් කාර්ය පටිපාටි පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමට මූලික පියවර ගනු ලැබේ.

මීට අමතරව, 2023 වසරේ හොඳම ශිෂ්‍යත්වලාභියා සඳහා වන උපකුලපති සම්මාන ප්‍රදානය දියත් කර ඇති අතර, අධ්‍යයන සහායක, පරිපාලන සහ අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා හඳුනාගැනීමේ ක්‍රියාවලීන් අවසන් වෙමින් පවතී.

### 4.4.2 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

තත්ත්ව සහතිකකරණය ක්‍රියාවලීන් හා භාවිතයන්ට පමණක් සීමා නොවේ, නමුත් මානව ප්‍රාග්ධනයට. අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට සහ උසස් අධ්‍යාපනයේ විකාශනය වන ඉල්ලීම්වලට අනුකූලව සිටීමට අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයේ තීරණාත්මක වැදගත්කම විශ්වවිද්‍යාලය හඳුනා ගනියි. 2024 වර්ෂයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය යටතේ කාර්ය මණ්ඩලයේ වෘත්තීය කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වටිනා දැනුම, මෙවලම් සහ උපාය මාර්ගවලින් සන්නද්ධ කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. මෙම සැසි කාර්ය මණ්ඩලයට විශේෂඥ පහසුකම් සපයන්නන් සමඟ සම්බන්ධ වීමට ඉඩ සැලසූ අතර ඔවුන්ගේ කාර්යයේ විවිධ අංශවල ඔවුන්ගේ කුසලතා ඔපමට්ටම් කිරීමට උපකාරී විය. සහජීවනයෙන් යුතු සදාචාරාත්මක වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කරන අතරම වැඩ පිළිවෙත්, කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ සමස්ත යහපැවැත්ම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු විය.

**පවත්වන ලද වැඩමුළු**

01. ඔබේ පුස්තකාලයෙන් සහ අනෙකුත් මාර්ගගත මූලාශ්‍රවලින් තොරතුරු සෙවීම පිළිබඳ වැඩමුළුව, 2024.05.21
02. අධ්‍යයන ලිවීමේදී යොමුකිරීම් හැඳින්වීම පිළිබඳ වැඩමුළුව, 2024.05.31
03. යොමුකිරීම් කළමනාකරණය සඳහා ඩිජිටල් මෙවලම් යොදාගැනීම පිළිබඳ වැඩමුළුව, 2024.06.14
04. සාර්ථක සාහිත්‍ය සමාලෝචනයක් සිදුකරන ආකාරය පිළිබඳ වැඩමුළුව, 2024.07.26
05. අලුතින් බඳවා ගත් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව, 2024.08.16 (දැනට ක්‍රියාත්මක වෙමින් පවතී)
06. නව තොරතුරු තාක්ෂණ දැනුමෙන් කාර්ය මණ්ඩලය සන්නද්ධ කිරීම 2024.09.11
07. "විශ්වවිද්‍යාල ශිෂ්‍ය උපදේශකයින්ගේ කාර්යභාරය" පිළිබඳ වැඩමුළුව
08. අධ්‍යයන හා අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා 2025.12.12 දින පැවති පුද්ගල සහ වෘත්තීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා විශේෂ පාඩම් පිළිබඳ වැඩමුළුව
09. සියලුම පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා "ආශාවෙන් ජීවත් වන්න" යන මාතෘකාව පිළිබඳ සිව් දින වැඩමුළු මාලාව: ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා, 2024





## 4.5 ජාතික සහ ජාත්‍යන්තර දායකත්ව සහ සහයෝගීතා

### 4.5.1 ජාත්‍යන්තර සහයෝගීතා

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අර්ථාන්විත ජාත්‍යන්තර සහයෝගීතා හරහා සිය ගෝලීය පැවැත්ම පුළුල් කරමින්, අධ්‍යයන, කලාත්මක සහ සංස්කෘතික හුවමාරු පෝෂණය කරයි. දෘශ්‍ය හා රංගන කලාවන් තුළ සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ නවෝත්පාදනය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම වැඩි දියුණු කිරීමේදී මෙම හවුල්කාරිත්වයන් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි.

- **ඉරාන චිත්‍රපට උළෙල**: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ඉරාන සංස්කෘතික මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් ඉරාන චිත්‍රපට උළෙල පැවැත්වීම මඟින් සිසුන්ට සහ ආචාර්ය මණ්ඩලයට ගෝලීය සිනමා සම්ප්‍රදායන්ට නිරාවරණය වීම සහ හරස් සංස්කෘතික අගය කිරීම පෝෂණය කිරීම.

- **පුස්තකාල ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම:** කීර්තිමත් ඉන්දියානු සංගීතඥයෙකු වන ආචාර්ය සුබ්‍රමනියම්, සංගීත සහ රංග කලා අධ්‍යයන කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය සම්පත් සැලකිය යුතු ලෙස පොහොසත් කරමින්, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට වටිනා පුස්තකාල ද්‍රව්‍ය එකතුවක් නොමසුරුව පරිත්‍යාග කරන ලදී.

- **පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ආරාධිත පීඨය:** විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර විද්වතුන් සහ කලාකරුවන් ආරාධිත පීඨයක් ලෙස පිළිගන්නා ලද අතර එමඟින් අධ්‍යයන කතිකාව වැඩි දියුණු කර සෞන්දර්ය කලාවන් තුළ විශේෂිත විෂයයන් පිළිබඳ විශේෂඥතාව බෙදා ගනු ලැබේ.

- **අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය සුරක්ෂිත කිරීම සඳහා ආසියා-පැසිෆික් උසස් අධ්‍යාපන ජාලයේ සාමාජිකත්වය (APHEN-ICH):** අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් (ICH) සංරක්ෂණය කිරීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයෙහි සුවිශේෂී දායකත්වය හඳුනා ගනිමින් APHENICH හි සාමාජිකත්වය සහතික කර තිබේ. මෙම අනුබද්ධතාව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපාධි විෂයමාලාවේ වැදගත්කම සහ සම්ප්‍රදායික කලා සහ සංස්කෘතික ප්‍රකාශන ආරක්ෂා කිරීමේ එහි කාර්යභාරය පිළිගනු ලැබේ.

- **සාම්ප්‍රදායික සංගීත සංරක්ෂණය**: සාම්ප්‍රදායික සංගීතය සංරක්ෂණය කිරීම: ඕස්ට්‍රේලියාවේ සිටින ශ්‍රී ලාංකික විදේශිකයෙකු වන දානපතියෙකු සමඟ සහයෝගීත්වයෙන් විශ්වවිද්‍යාලය මඩකලපුව කලාපයට සහ පුත්තලමට ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් සිදු කළ අතර සංගීත පීඨයේ සිසුන්ට දේශීය සංගීත සම්ප්‍රදායන් පිළිබඳ ප්‍රායෝගික නිරාවරණයක් ලබා දුන්නේය. මෙම ආරම්භය තවදුරටත් වැඩිදියුණු වූයේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය සහ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය අතර සහයෝගී වේදිකාගත රංගනයක් මගින් සංස්කෘතික හුවමාරුව සහ අධ්‍යයන හවුල්කාරිත්වය ශක්තිමත් කරමිනි. පර්යේෂණ, රංගනයන් සහ අධ්‍යයන වැඩසටහන් හරහා ශ්‍රී ලංකාවේ පොහොසත් සංගීත උරුමය පුනර්ජීවනය කිරීම සහ වැඩි දෘශ්‍යතාවක් ගෙන ඒම මෙම සංකල්පයේ අරමුණයි.

මෙම ජාත්‍යන්තර සහයෝගීතාවයන් තුළින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය දෘශ්‍ය හා ප්‍රාසාංගික කලාවේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස සිය භූමිකාව ශක්තිමත් කරමින් දේශීය සම්ප්‍රදායන් ගෝලීය කලාත්මක හා ශාස්ත්‍රීය ජාලයන් සමඟ සම්බන්ධ කරයි.

### 4.5.2 කර්මාන්ත සහයෝගීතාවයන්

2024 සැප්තැම්බර් 02 වන දින විශ්වවිද්‍යාලය ජාතික ශිල්ප සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම තුළින් සැලකිය යුතු හවුල්කාරිත්වයකට එළඹුණි. මෙම සහයෝගීතාවය විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL) හරහා පවත්වනු ලබන සෙරමික් කලා සහ නිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව කෙරෙහි අවධානය යොමු කරයි. මෙම අවබෝධතා ගිවිසුම අධ්‍යයන හා කාර්මික අංශ අතර සමීප සබඳතා වර්ධනය කිරීම අරමුණු කරයි, සිසුන්ට ශිල්ප කර්මාන්තයට වටිනා අවබෝධයක් සහ ප්‍රායෝගික නිරාවරණයක් ලබා දෙයි. මෙම හවුල්කාරිත්වය අධ්‍යයන හා කර්මාන්ත අතර හිදැස පියවන විශේෂිත වැඩසටහන් ඉදිරිපත් කිරීමට විශ්වවිද්‍යාලයේ කැපවීම වැඩි දියුණු කරමින් නිර්මාණාත්මක හා සැලසුම් අංශවල විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය කුසලතා සිසුන්ට ලබා දෙයි.

### 4.5.3 සමාජ සංහිඳියාව සඳහා වන මධ්‍යස්ථානය

විවිධ ප්‍රජාවන් අතර සාමය, එකමුතුකම සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාලය විසින් **සමාජ සංහිඳියාව සඳහා වූ මධ්‍යස්ථානය** ස්ථාපිත කරන ලදී. මේ යටතේ විශ්වවිද්‍යාලය ස්වාමි විවේකානන්ද විද්‍යාලයේ සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සිසුන් සමඟ සහයෝගයෙන් තෛපොංගල් උත්සවය සැමරීය. තෛපොංගල් දිනයේදී පැවති මෙම උත්සවය උසස් සම්ප්‍රදායන් සහ සංස්කෘතික වැදගත්කම විදහා දක්වන ප්‍රීතිමත් සංස්කෘතික උත්සවයක් විය. ආයතන දෙකෙහිම සිසුන් එක්ව තෛපොංගල් උත්සවයෙන් පිළිඹිබු වන කරන කෘතඥතාව, සමෘද්ධිය සහ එකමුතුකමේ ජවය පිළිබිඹු කරමින් ආකර්ශනීය සංස්කෘතික රංගනයක් ඉදිරිපත් කළහ. මෙම සැමරුම සහභාගී වූ ආයතනවල විවිධත්වය ඉස්මතු කළා පමණක් නොව, සිසුන් අතර මනා සංස්කෘතික හුවමාරුවක් සහ අන්‍යෝන්‍ය ගෞරවයක් ද ඇති කළ අතර, විශ්වවිද්‍යාලයේ සජීවී ප්‍රජාව උද්යෝගිමත් කළේය. මෙම උත්සවය ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික උරුමය සැමරීමට සහ විශ්වවිද්‍යාලය පුරා එකමුතුකම සහ සමගිය පිළිබඳ හැඟීමක් ප්‍රවර්ධනය කිරීමට අපූරු අවස්ථාවක් විය.

### 4.6 මූල්‍ය තිරසරභාවය

විශ්වවිද්‍යාලය එහි විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL) සහ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය (FGS) වැඩසටහන් හරහා මූල්‍ය ස්ථාවරත්වය ළඟා කර ගැනීමට කැපවී සිටින අතර එමඟින් ආදායම උත්පාදනය කරන අතරම අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පුළුල් කරයි. මීට අමතරව, විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය සිසුන් සඳහා අරමුදල් සහ ප්‍රායෝගික අවස්ථා සුරක්ෂිත කරමින් කර්මාන්ත සහයෝගීතාවන් ශක්තිමත් කරයි. මෙම මූලික පියවර සාමූහිකව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය තිරසරභාවය සහ අධ්‍යයන වර්ධනය වැඩි දියුණු කරයි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ විශ්වවිද්‍යාල කාර්යසාධනය අනුගතවීම

ඉහත දක්වා ඇති කාර්යසාධනය පහත පරිදි තිරසාර සංවර්ධන ඉලක්කවලට සම්බන්ධ කළ හැකිය;

### තිරසර සංවර්ධන අරමුණු අංක 3: නිරෝගී බව සහ යහපැවැත්ම

විශ්වවිද්‍යාලය විවිධ සංකල්ප තුළින් සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ශාරීරික හා මානසික යහපැවැත්ම සක්‍රියව ප්‍රවර්ධනය කරයි:

**ශාරීරික අධ්‍යාපන ඒකකය සහ ක්‍රීඩා සංවර්ධනය:** සමස්ත යහපැවැත්ම පෝෂණය කිරීම සඳහා ශාරීරික ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම.

**අන්තර් විශ්වවිද්‍යාල සහ පීඨ මට්ටමේ ක්‍රීඩා තරඟ:** කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, ඔරොත්තු දීමේ හැකියාව සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් වැඩි දියුණු කිරීම.

**මානසික යහපැවැත්ම සඳහා මූලික පියවර:** උපදේශනය සහ මානසික සෞඛ්‍ය සම්පත් හරහා සහාය ලබා දීම.

**ඉදිරිපත්කිරීම් සඳහා අවස්ථාව ලබාදීම:** නිර්මාණාත්මක කණ්ඩායම් ක්‍රියාකාරකම් හරහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බලගැන්වීම, චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීම සහ සමබර කාර්ය - ජීවිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.

### තිරසර සංවර්ධන අරමුණු අංක 4: ගුණාත්මක අධ්‍යාපනයක්

විශ්වවිද්‍යාලය පහත සඳහන් ආරම්භක පියවර ඔස්සේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ ජීවිත කාලය පුරාම ඉගෙනීම පෝෂණය කිරීමට කැපවී සිටී:

පර්යේෂණ, නිර්මාණාත්මක කෘති සහ දැනුම ව්‍යාප්තිය: අන්තර් විෂය පර්යේෂණ වේදිකා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ හරහා අධ්‍යයන සහයෝගීතාව සහ දැනුම හුවමාරුව ප්‍රවර්ධනය කිරීම.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය: ප්‍රවේශ විය හැකි අඩු වියදම් ප්‍රකාශන හරහා අධ්‍යයන කටයුතු ව්‍යාප්ත කිරීම.

වෘත්තීය මාර්ගෝපදේශ සහ උපදේශනය: වෘත්තීය සැලසුම්කරණය, කුසලතා සංවර්ධනය සහ කර්මාන්ත නිරාවරණය සඳහා සිසුන්ට සහාය වීම.

**සිද්ධි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව:** වෘත්තීය සුදුසුකම් වැඩි දියුණු කිරීම සඳහා ව්‍යුහගත අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීම.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CGEE):** ආරක්ෂිත සහ සාධාරණ ඉගෙනුම් පරිසරයක් තුළ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

**පර්යේෂණ සහ ප්‍රකාශන වැඩිදියුණු කිරීම:** සහයෝගීතාවයන් සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සඟරා දායකත්වයන් හරහා අධ්‍යයන පර්යේෂණ ශක්තිමත් කිරීම.

**ICH ජාත්‍යන්තර පර්යේෂණ සාරාංශ පොත ප්‍රකාශයට පත් කිරීම:** සංස්කෘතික උරුමයන් පිළිබඳ පර්යේෂණ දියුණු කිරීම.

**පර්යේෂණ දැනුම සංවර්ධනය පිළිබඳ වැඩමුළු:** පර්යේෂණ අරමුණු කරගත් අධ්‍යයන සංස්කෘතියක් ඇති කිරීම.

විශ්වවිද්‍යාලය හරස් සංස්කෘතික ඉගෙනීමේ වැදගත්කම, ඇතුළත් කිරීම් පෝෂණය කිරීම සහ විවිධ සම්ප්‍රදායන් සහ වටිනාකම් පිළිබඳ සිසුන්ගේ අවබෝධය පුළුල් කිරීම ද අවධාරණය කරනු ලබයි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 5: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය (CGEE):** විශ්වවිද්‍යාලය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, අන්තර්ගතකිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සහ ස්ත්‍රී පුරුෂ භාවයට සංවේදී ප්‍රතිපත්ති සඳහා පෙනී සිටීම

## තිරසර සංවර්ධන අරමුණු අංක 8: සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

විශ්වවිද්‍යාලය පහත සඳහන් දෑ තුළින් සිසුන්ගේ රැකියා හැකියාව සහ වෘත්තීය සාර්ථකත්වය වැඩිදියුණු කිරීමට කැපවී සිටියි:

**උපාධි රැකියා සමීක්ෂණ:** රැකියා සූදානම වැඩි දියුණු කිරීම සඳහා රැකියානියුක්තිය පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම.

**පීඨ හරහා සීමාවාසික අවස්ථා:** කර්මාන්ත අවශ්‍යතා සමඟ ශාස්ත්‍රීය ක්ෂේත්‍රය සම්බන්ධ කිරීම සඳහා ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලබා දීම.

**ව්‍යවසායකත්වය සහ සමාජ කුසලතා පාඨමාලා:** ශ්‍රම බලකායට ඇතුළු වීමට හෝ තමන්ගේම ව්‍යාපාර ස්ථාපිත කිරීමට අවශ්‍ය කුසලතා සිසුන් තුළ ඇති කිරීම.

**සංස්කෘතික හුවමාරු වැඩසටහන්:** අනාගත වෘත්තීය අපේක්ෂාවන් වැඩි දියුණු කරන ජාත්‍යන්තර අත්දැකීම් සිසුන්ට ලබා දීම.

**කර්මාන්ත සහයෝගීතා:** අධ්‍යයන වැඩසටහන් කර්මාන්ත අවශ්‍යතා සමඟ අනුගතකිරීමෙන්, මෙම හවුල්කාරිත්වය දක්ෂ ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමට, ආර්ථික වර්ධනය සහ රැකියා සූදානම පෝෂණය කිරීමට සහයෝගය දක්වයි.

## තිරසර සංවර්ධන අරමුණු අංක 9: කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්

**ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂණය සහ ඩිජිටල් ගබඩාව:** සංස්කෘතික උරුම සම්පත් සංරක්ෂණය කිරීමට සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට තාක්ෂණය භාවිතා කිරීම.

**චිත්‍රපට එකතුව සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ලේඛනාගාරය:** ඓතිහාසික හා අධ්‍යාපනික සම්පත් වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 10: අඩු අසමානාත්මතා

අසමානතාවයන් අඩු කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කරනු ලබන්නේ:

**නිර්මාණාත්මක සිදුවීම්වලට අන්තර්ගත කිරීම:** ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබාදීම ආරම්භ කිරීමෙන් නිර්මාණාත්මක විශ්වවිද්‍යාල උත්සව අවස්ථා සඳහා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය ඇතුළත් වන අතර එමඟින් විවිධත්වය සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරයි.

**හරස් සංස්කෘතික ඉගෙනීම:** සංස්කෘතික හුවමාරු වැඩසටහන් විවිධ සම්ප්‍රදායන් සමඟ සිසුන් සම්බන්ධ කර ගැනීමට පහසුකම් සපයයන අතර අන්තර්ගතකිරීම පෝෂණය කර අසමානතාවයන් අඩු කරයි.

**වෘත්තීය උපදේශන සහ සහාය සේවා:** සියලුම සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය ජීවිතයේ සාර්ථක වීමට සමාන අවස්ථා ලබා දීම.

**මානසික යහපැවැත්ම සහ වෘත්තීය උපදේශනය:** පුද්ගලික සහ වෘත්තීය අභියෝග ජය ගැනීමට සහාය ලබා දීම.

**තෛපොංගල් උත්සවය:** විවිධ සංස්කෘතික හා ජනවාර්ගික පසුබිම්වල සිසුන් අතර අන්‍යෝන්‍ය ගෞරවය සහ අවබෝධය දිරිමත් කිරීමෙන් සමාජ අන්තර්ගතකිරීම ප්‍රවර්ධනය කිරීම සහ අසමානතාවයන් අඩු කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 11: තිරසර නගර සහ ප්‍රජාවන්

විශ්වවිද්‍යාලය පහත සඳහන් ක්‍රමවේද ඔස්සේ සංස්කෘතික තිරසරභාවයට දායකත්වය සපයයි:

**අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ පර්යේෂණ:** සංස්කෘතික තිරසරභාවය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලාංකික සංගීත උරුමය, සාම්ප්‍රදායික රංගනයන් සහ චාරිත්‍ර වාරිත්‍ර අධ්‍යයනය කිරීම.

**ජන සංගීතය සහ ප්‍රජා ගතිකත්වය පිළිබඳ ප්‍රකාශන:** දැනුවත්භාවය ඉහළ නැංවීම සහ සාම්ප්‍රදායික සංස්කෘතික භාවිතයන් සංරක්ෂණය කිරීම.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය රූපවාහිනියේ ජාතික සහභාගීත්වය:** දේශීය කලාව, සංස්කෘතිය සහ අධ්‍යාපනයේ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම, තිරසාර සංස්කෘතික සංවර්ධනයට සහ ප්‍රජා සහභාගීත්වයට දායකත්වය සැපයීම

## තිරසර සංවර්ධන අරමුණු අංක 16: සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන

විශ්වවිද්‍යාලය විසින් සාමය ගොඩනැගීමට සහ අන්තර් සංස්කෘතික සහයෝගීතාවයට සහාය වෙමින්, එකමුතුකම සහ සමෘද්ධිය ප්‍රවර්ධනය කරන උත්සව සමරනු ලැබේ.

## තිරසර සංවර්ධන අරමුණු අංක 17: තිරසර සංවර්ධනය සඳහා පාර්ශවකරණයන්

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී හවුල්කාරිත්වයේ වැදගත්කම විශ්වවිද්‍යාලය හඳුනා ගනියි:

**බාහිර ආයතන සමඟ සහයෝගීතාවය**: වඩා හොඳ අධ්‍යයන හා ක්‍රීඩා අවස්ථා ලබා දීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වීම.

**ආරාධිත තරඟාවලි සහ තරඟ:** අනෙකුත් අධ්‍යයන ආයතන සමඟ හවුල්කාරිත්වයන් හරහා විශ්වවිද්‍යාල ජාල ශක්තිමත් කිරීම.

**ජාත්‍යන්තර පර්යේෂණ කටයුතු:** අධ්‍යයන සහභාගීත්වය වැඩි කිරීම සඳහා ගෝලීය සඟරා සහ සම්මන්ත්‍රණ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ:** ගෝලීය පර්යේෂණ සහයෝගීතාවය සහ දැනුම හුවමාරුව වැඩි දියුණු කිරීම.

ස්වාමි විවේකානන්ද විද්‍යාලය සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර සහයෝගීතාවය, සාමය, සංස්කෘතික විවිධත්වය සහ තිරසර සංවර්ධන අරමුණු ඉදිරියට ගෙන යාම සඳහා හුවමාරු කරගත් දැක්මක් ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යයන ආයතන එක්සත් විය හැකි ආකාරය පිළිබඳ ප්‍රධාන උදාහරණයකි. මෙම සහයෝගීතාවය සිසුන්ට සහ සමාජයට ප්‍රතිලාභ ලබා දෙන දිගුකාලීන, තිරසාර හවුල්කාරිත්වයන් ගොඩනැගීමේ වැදගත්කම අවධාරණය කරයි.

තිරසර සංවර්ධන අරමුණු සමඟ මෙම අනුකූලභාවය, අධ්‍යාපනය, පර්යේෂණ සහ ප්‍රජා සහභාගීත්වය තුළින් ගෝලීය ඉලක්ක කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමට විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරයි.

## 6. විගණන කමිටු වාර්තාව - 2024

**විගණන කමිටු රැස්වීම්වල සංයුතිය**

පාලක සභාව සහ ලේඛකාධිකාරී විසින් පත් කරන ලද පාලක සභික තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ පහත නිලධාරීන් විගණන කමිටු සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

| | | |
|---|---|---|
| ටි.ධර්මරාජා මහතා | - | සභාපති/ පාලක සභික |
| මහාචාර්ය නිමල් කීර්ති දංගල්ල මහතා | - | සාමාජික/ පාලක සභික |
| ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා | - | සාමාජික/ පාලක සභික |
| ඩී.එන්.ගුරුසිංහ මිය, ලේඛකාධිකාරී (වැ.බ) (2024.03.31 දින දක්වා) | - | සාමාජික/ ලේඛකාධිකාරී |
| පී.එස්.ජී.පී.නානායක්කාර මිය, ලේඛකාධිකාරී (2024.04.01 දින සිට 2024.09.01 දින දක්වා) | | |
| ආචාර්ය චානි ඉඹුල්ගොඩ (2024.09.02 දින සිට) | | |

__නිරීක්ෂක__

ඒ.කේ.ඒ.චන්ද්‍රිකා මිය - විගණන අධිකාරී

**ඉටුකරන ලද කාර්යයන්**

1. සමාලෝචිත වර්ෂයේ විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම .

**2.** ජාතික විගණන කාර්යාලය විසින් යොමු කරන ලද විගණන විමසුම් නිරීක්ෂණය කර අනාගතයේදී එවැනි තත්වයක් ඇති නොවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**3.** 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් සහ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අඩංගු එක් එක් විගණන විමසුම හෝ නිරීක්ෂණය සම්බන්ධයෙන් කාල රාමුව සමඟ වගකිවයුතු පාර්ශ්වයන් විසින් ගනු ලැබූ/ ගත යුතු පියවර පිළිබඳ වාර්තාව පරීක්ෂා කර අවශ්‍ය නිර්දේශ සමඟ සභාවට ඉදිරිපත් කරන ලදී.

සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය
(2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

| | සටහන් | 2024<br>රු. | 2023<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| හුවමාරු නොවන ගණුදෙනු වලින් ලැබෙන ආදායම - පුනරාවර්ථන | | | |
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 1,413,411,642 | 1,341,500,000 |
| ක්‍රීඩා සඳහා විශේෂ ප්‍රදානය - U.G.C | | 700,000 | - |
| ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 49,240,650 | 42,772,000 |
| AHEAD ප්‍රදාන පුනරාවර්ථන වියදම් සඳහා | | - | 29,112,045 |
| *හුවමාරු නොවන ගණුදෙනු වලින් මුළු ආදායම - පුනරාවර්ථන* | | 1,463,352,292 | 1,413,384,045 |
| හුවමාරු වන ගණුදෙනු වලින් ලැබෙන ආදායම - *පුනරාවර්ථන* | | | |
| පොළී ආදායම | 3 | 7,745,393 | 5,939,450 |
| විවිධ ආදායම | 3.01 | 21,829,451 | 24,755,124 |
| *හුවමාරු වන ගණුදෙනු වලින් මුළු ආදායම - පුනරාවර්ථන* | | 29,574,843 | 30,694,574 |
| ආදායම - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | 2,101,829 | 1,833,987 |
| ආදායම - CODL | | 16,725,081 | 20,231,967 |
| ආදායම - UBL | | 3,369,521 | - |
| ආදායම - VAPA Press | | 1,374,868 | - |
| ආදායම - VAPA TV | | 7,013,476 | - |
| මුළු ආදායම - පුනරාවර්ථන | | 1,523,511,910 | 1,466,144,573 |
| මෙහෙයුම් වියදම් - පුනරාවර්ථන | | | |
| සේවක වැටුප් | 4.01 | 1,131,642,211 | 1,012,385,776 |
| ගමනාගමන වියදම් | 4.02 | 955,146 | 286,999 |
| සැපයුම් | 5 | 23,978,252 | 36,932,316 |
| නඩත්තු වියදම් | 6 | 41,414,298 | 30,570,865 |
| ගිවිසුම්ගත සේවා | 7 | 177,821,532 | 220,875,023 |
| වෙනත් පුනරාවර්ථන වියදම් | 8.01 | 33,314,550 | 49,715,217 |
| මහපොළ ශිෂ්‍යත්ව | 8.02 | - | - |
| ශිෂ්‍යාධාර | 8.03 | 53,936,000 | 42,772,000 |
| සේවා කළ නොහැකි ස්ථාවර වත්කම් අපහරණය කිරීමේදී වූ පාඩු | | 6,732 | 95,017 |
| යෝග්‍යතා පරීක්ෂණ වියදම් | | - | 1,953,990 |
| පාරිතෝෂිත දීමනාව | 24 | 80,845,334 | 96,401,950 |
| අනෙකුත් ඒකක වියදම් | 8.04 | 10,656,521 | 33,842,192 |
| *මෙහෙයුම් වියදම්* | | 1,554,570,575 | 1,525,831,346 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ වියදම් | | 724,529 | 1,050,156 |
| CODL වියදම් | | 6,416,229 | 6,732,631 |
| UBL වියදම් | | 2,621,090 | - |
| VAPA PRESS වියදම් | | 1,699,064 | - |
| VAPA TV වියදම් | | 2,560,527 | - |
| *මුළු මෙහෙයුම් වියදම්* | | 1,568,592,014 | 1,533,614,133 |
| කාල සීමාව සඳහා පුනරාවර්ථන අතිරික්තය/ඌනතාවය | | (45,080,104) | (67,469,560) |
| හුවමාරු නොවන ගණුදෙනු වලින් ලැබෙන ආදායම - ප්‍රාග්ධන | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 177,509,149 | 225,000,000 |
| ත්‍යාග, පරිත්‍යාග, භාණ්ඩ වර්ග - දේශීය | 29 | 91,200.00 | 400,795.00 |
| ත්‍යාග, පරිත්‍යාග, භාණ්ඩ වර්ග - විදේශීය | 29 | - | 2,696,350 |
| AHEAD ප්‍රදාන ප්‍රාග්ධන වියදම් සඳහා | | 4,807,620 | 12,291,151 |
| විශේෂිත අරමුදල් වලින් මාරු කරන ලද අරමුදල් (VC අරමුදල) | | - | 1,558,772 |
| *හුවමාරු නොවන ගණුදෙනු වලින් මුළු ආදායම - ප්‍රාග්ධන* | | 182,407,969 | 241,947,067 |
| මුළු මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන | | | |
| ක්ෂය වීම් හා ක්ෂය කිරීම් | | 230,719,260 | 232,790,621 |
| පුනරාවර්ථන වියදම් - ප්‍රාග්ධන නොවන ස්වභාවය | | 9,635,412 | 7,249,029 |
| ප්‍රාග්ධන වියදම් - ප්‍රාග්ධන නොවන ස්වභාවය | | 380,635 | - |
| *මුළු මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන* | | 240,735,307 | 240,039,650 |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/ඌනතාවය | | (58,327,338) | 1,907,417 |
| කාල සීමාව සඳහා මුළු අතිරික්තය/ඌනතාවය | | (103,407,441) | (65,562,142) |

කාල සීමාව සඳහා පුනරාවර්ථන, ප්‍රාග්ධන, FGS සහ CODL අතිරික්තය හෝ ඌනතාවය, පහත දැක්වෙන පරිදි කාල සීමාව සඳහා මුළු අතිරික්තය/ඌනතාවය තුළ ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| කාල සීමාව සඳහා පුනරාවර්ථන අතිරික්තය/ඌනතාවය - පුනරාවර්ථන සමුච්චිත අරමුදලට මාරු කිරීම | (61,643,440) | (81,752,726) |
| කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/ඌනතාවය - ප්‍රාග්ධන සමුච්චිත අරමුදලට මාරු කිරීම | (58,327,338) | 1,907,417 |
| කාල සීමාව සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) අතිරික්තය/ඌනතාවය | 1,377,300 | 783,831 |
| කාල සීමාව සඳහා CODL අතිරික්තය/ඌනතාවය | 10,308,853 | 13,499,336 |
| කාල සීමාව සඳහා UBL අතිරික්තය/ඌනතාවය | 748,431 | - |
| කාල සීමාව සඳහා VAPA PRESS අතිරික්තය/ඌනතාවය | (324,196) | - |
| කාල සීමාව සඳහා VAPA TVඅතිරික්තය/ඌනතාවය | 4,452,949 | - |
| | (103,407,441) | (65,562,142) |

පිටු අංක 05 සිට 22 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 23 සිට 39 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් වේ.

**සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**
**2024.12.31 දිනට**
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

| | සටහන් | 2024<br>රු. | 2023<br>(නැවත ප්‍රකාශිත)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ආයෝජන | 10 | 4,504,039,877 | 4,639,312,225 |
| දේපල පිරියත සහ උපකරණ | 20 | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 1,541,876 | 2,312,813 |
| ප්‍රාග්ධන - කෙරී ගෙන යන වැඩ | 21 | 8,592,301 | 8,592,301 |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 17 | 2,759,624 | 2,759,621 |
| | | **4,516,933,678** | **4,652,976,961** |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 12 | 212,059,296 | 53,725,341 |
| ලැබිය යුතු දේ | 13 | 3,265,907 | 14,434,248 |
| කෙටි කාලීන ආයෝජන (C.O.D.L.) | 20 | 91,780,293 | 82,867,045 |
| තොග | 14 | 7,740,726 | 8,592,103 |
| ඉදිරියට කළ ගෙවීම් | 15 | 3,142,067 | 4,228,601 |
| අත්තිකාරම් | 16 | 101,457 | 10,085 |
| කාර්යය මණ්ඩලය සදහා ණය හා අත්තිකාරම් | 18 | 45,161,655 | 46,843,824 |
| බාහිර පාර්ශවයන් වෙත වූ තැන්පතු | 19 | 1,603,696 | 1,083,696 |
| | | **364,855,097** | **211,784,943** |
| **මුළු වත්කම්** | | **4,881,788,776** | **4,864,761,904** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සදහා වෙන් කිරීම | 24 | 231,324,530 | 153,311,251 |
| | | **231,324,530** | **153,311,251** |
| විලම්භිත ආදායම - CODL & FGS | 30 | **3,829,113** | **3,437,458** |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 22 | 79,800,282 | 45,204,434 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 23 | 14,406,261 | 46,126,043 |
| පාරිතෝෂික සදහා වෙන් කිරීම | 24 | 7,699,020 | 20,612,340 |
| තැන්පතු හා රදවා ගැනීම් | 25 | 8,469,369 | 19,198,338 |
| කෙටි කාලීන වෙන් කිරීම් | 26 | 1,316,230 | 3,914,590 |
| | | **111,691,162** | **135,055,745** |
| **මුළු වගකීම්** | | **346,844,805** | **291,804,453** |
| **ශුද්ධ වත්කම්** | | **4,534,943,971** | **4,572,957,451** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| සමුච්චිත අරමුදල පුනරාවර්ථන | | (209,493,793) | (147,850,353) |
| සමුච්චිත අරමුදල ප්‍රාග්ධන | | 2,402,770,273 | 2,461,097,611 |
| සීමා කළ අරමුදල් (විශේෂිත අරමුදල්) | 27 | 42,707,889 | 38,169,340 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 28 | 2,210,560,740 | 2,149,157,473 |
| සමුච්චිත අරමුදල ප්‍රාග්ධන පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | 4,830,063 | 3,440,273 |
| සමුච්චිත අරමුදල CODL | | 76,202,008 | 66,453,498 |
| සමුච්චිත අරමුදල UBL | | 3,402,394 | 2,653,962 |
| සමුච්චිත අරමුදල VAPA Press | | (324,196) | - |
| සමුච්චිත අරමුදල VAPA TV | | 4,288,595 | (164,353) |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | **4,534,943,971** | **4,572,957,450** |

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 106 (1) හා 107 (11) වගන්ති, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කර ඇත.

W. M. W.වන්නිනායක (මුල්‍යාධිකාරි) ආචාර්ය C.V ඉඹුල්ගොඩ (ලේඛකාධිකාරි)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ අතර පාලක සභාව වෙනුවෙන් 2025 පෙබරවාරි මස 27 දින අත්සන් කරන ලදී.

**මහාචාර්ය රොහන් නෙත්සිංහ (උප කුලපති)**

……………………………………………………………….. ……………………………………………………………

ආචාර්ය සී පතිරාජ (පාලක සභා සාමාජික) ටී. ධර්මරාජා (පාලක සභා සාමාජික)

**පිටු අංක 05 සිට 22 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 23 සිට 39 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් වේ.**

සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධය හා ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

රුපියල්

| | සමුච්චිත අරමුදල පුනරාවර්තන | සමුච්චිත අරමුදල ප්‍රාග්ධන | සීමා කළ අරමුදල් (විශේෂිත අරමුදල්) සටහන අංක 27 | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය අරමුදල | C.O.D.L. අරමුදල | U.B.L අරමුදල | VAPA Press අරමුදල | VAPA රූපවාහිනී අරමුදල | ප්‍රත්‍යාගණන අතිරික්තය | මුං එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **01.01.2023 දිනට ශේෂය (කලින් වාර්තා කළ පරිදි )** | **(65,892,765)** | **2,452,908,227** | **33,698,010** | **2,678,739** | **53,682,152** | **-** | **-** | **-** | **2,149,157,473** | **4,626,231,836** |
| | | | | | | | | | | |
| පසුගිය වසර වලට අදාළ ගැලපීම් -(සටහන්) | (204,862) | 6,281,965 | - | - | - | - | - | - | - | 6,077,103 |
| පසුගිය 2023 වසරට අදාළ ගැලපීම් - සටහන 31 | (13,041,316) | (12,670,744) | - | - | (20,500) | 2,653,962 | - | (164,353) | - | (23,242,951) |
| 2023 වර්ෂය තුළ ලැබුනු අරමුදල් | - | - | (1,337,569) | - | - | - | - | - | - | (1,337,569) |
| වර්ෂය තුළ ලැබුනු අරමුදල් | - | - | 5,808,899 | (22,297) | (727,990) | - | - | - | - | 5,058,612 |
| වසරේ අතිරික්තය | (68,711,410) | 14,578,162 | - | 783,831 | 13,519,836 | - | - | - | - | (39,829,581) |
| **31.12.2023 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)** | **(147,850,353)** | **2,461,097,611** | **38,169,340** | **3,440,273** | **66,453,498** | **2,653,962** | **-** | **(164,353)** | **2,149,157,473** | **4,572,957,451** |
| | | | | | | | | | | |
| **31.12.2024 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)** | **(147,850,353)** | **2,461,097,611** | **38,169,340** | **3,440,273** | **66,453,498** | **2,653,962** | **-** | **(164,353)** | **2,149,157,473** | **4,572,957,450** |
| මෝටර් වාහන ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | - | - | - | - | - | - | 61,403,267 | **61,403,267** |
| වර්ෂය තුළ ලැබුනු අරමුදල් | - | - | 4,538,549 | 12,490 | (560,343) | - | - | - | - | **3,990,696** |
| වසරේ අතිරික්තය | (61,643,440) | (58,327,338) | - | 1,377,300 | 10,308,853 | 748,431 | (324,196) | 4,452,949 | - | **(103,407,441)** |
| **31.12.2024 දිනට ශේෂය** | **(209,493,793)** | **2,402,770,273** | **42,707,889** | **4,830,063** | **76,202,008** | **3,402,394** | **(324,196)** | **4,288,595** | **2,210,560,740** | **4,534,943,971** |

සටහන **A (මූල්‍ය ප්‍රකාශන 2023)**

1. 2022 වසරේ VAPA මුද්‍රණාලයේ අවසන් තොගය වැරදි ලෙස සටහන් කිරීම නිවැරදි කිරීම. (204,862)

1. 2015.01.01 වසරට පෙර හඳුනා නොගත් රඳවා ගැනීමේ ශේෂ 6,281,965

පිටු අංක 05 සිට 22 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 23 සිට 39 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් වේ.

## සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය
## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

| | සටහන් | 2024 | 2023 (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | රු. | රු. |
| වර්ෂය සඳහා සම්පූර්ණ අතිරික්තය | | (103,407,441) | (65,562,142) |
| **මුදල් නොවන අයිතම සඳහා ගැලපීම** | | | |
| පෙර වසර වලට අදාළ ගැලපීම් | | - | 6,097,603 |
| ක්ෂය වීම් | | 229,948,322 | 232,011,206 |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමේ අලාභ | | 6,732 | 95,017 |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | | 770,938 | 779,415 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | | 80,845,334 | 96,401,950 |
| **කාරක ප්‍රාග්ධන ගැලපීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | **208,163,884** | **269,823,049** |
| **කාරක ප්‍රාග්ධන ගැලපීම්** | | | |
| තොග වැඩිවීම්/අඩුවීම් | | 851,377 | 1,313,720 |
| ලැබිය යුතු මුදල් වැඩිවීම්/අඩුවීම් | | 11,168,341 | 7,094,093 |
| කෙටි කාලීන ආයෝජන මුදල් වැඩිවීම්/අඩුවීම් | | (8,913,249) | (46,774,037) |
| පෙර ගෙවුම් වැඩිවීම්/අඩුවීම් | | 1,086,534 | 41,411,267 |
| අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | | (91,372) | 31,265 |
| කාර්ය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | | 1,682,169 | 1,298,239 |
| බාහිර පාර්ශවයන් වෙත වූ තැන්පතු වැඩිවීම්/අඩුවීම් | | (520,000) | (200,000) |
| ගෙවිය යුතු අනෙකුත් දෑ වැඩිවීම්/අඩුවීම් | | (31,719,782) | (100,936,453) |
| තැන්පතු හා රඳවා තබා ගැනීම් වැඩිවීම්/අඩුවීම් | | (10,728,969) | (43,146,764) |
| කෙටි කාලීන ප්‍රතිපාදන වැඩිවීම්/අඩුවීම් | | (2,598,360) | 1,300,000 |
| උපචිත වියදම් වැඩිවීම්/අඩුවීම් | | 34,595,848 | 6,078,981 |
| විලම්භිත ආදායම වැඩිවීම්/අඩුවීම් | | 391,655 | (1,059,141) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්** | | **203,368,078** | **136,234,219** |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් ගෙවා ඇත. | | (15,745,373) | (27,577,707) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **187,622,699** | **108,656,512** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (33,279,440) | (97,171,176) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ආදායම | | - | - |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | | - | - |
| කෙරී ගෙන යන වැඩ ප්‍රාග්ධන කටයුතු අත්පත් කර ගැනීම / (මාරු කිරීම) | | - | - |
| ප්‍රාග්ධන අත්තිකාරම් අත්පත් කර ගැනීම / (මාරු කිරීම) | | - | 6,733,838 |
| ආයෝජන | | - | 5,632,847 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(33,279,440)** | **(84,804,491)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| විශේෂිත අරමුදලේ වැඩිවීම/අඩුවීම | | 4,538,549 | 5,378,321 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ අරමුදල් වැඩිවීම්/අඩුවීම් | | 12,490 | (22,297) |
| වි.දු.අ.කේ. අරමුදල් වැඩිවීම්/අඩුවීම් | | (560,343) | (748,490) |
| UBL අරමුදල් වැඩිවීම්/අඩුවීම් | | | 2,653,962 |
| VAPA Press අරමුදල් වැඩිවීම්/අඩුවීම් | | | - |
| VAPA TVඅරමුදල් වැඩිවීම්/අඩුවීම් | | | (164,353) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **3,990,696** | **7,097,143** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම** | | **158,333,955** | **30,949,164** |
| **වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 12 | 53,725,341 | 22,776,177 |
| **වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 12 | **212,059,296** | **53,725,341** |

පිටු අංක 05 සිට 22 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 23 සිට 39 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයක් වේ.

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති.

### 1. පොදු

### 1.1 වාර්තා කරණු ලබන ඒකකය.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයකි. ප්‍රධාන පරිපාලන කාර්යාලය සහ ප්‍රධාන මෙහෙයුම් පවත්වාගෙන යන ස්ථානය පිහිටුවා ඇත්තේ කොළඹ 7 ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 21 දරන ස්ථානයේය.

### 1.2 ප්‍රධාන කර්තව්‍යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය.

ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමින් සෞන්දර්ය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශයන්ගෙන් උසස් අධ්‍යාපනය ලබාදීම, එම ක්ෂේත්‍රයේ දැනුම හා හැකියාවන් අන් අයට ලබාදීම සහ එම ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතුවල නියැලීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සාර්ථකව නිමකරන විද්‍යාර්ථයින්ට උපාධි සහ සහතිකපත් ප්‍රදානය කිරීම ද විශ්වවිද්‍යාලයේ තවත් එක් ප්‍රධාන කාර්යභාරයකි.

### 1.3. නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2025 පෙබරවාරි මස 27 වන දින පාලක සභාවේ බලය ලැබී ඇත.

### 1.4 වාර්තාගත කාලච්ඡේදය.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලච්ඡේදය 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා වේ.

### 2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS)අනුව අනුගත වේ. නමුදු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත නොමැති අවස්ථා වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ සටහන් වලින් සමන්විත වේ.

### 2.2 ගණනය කිරීමේ පදනම.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. දේපල පිරියත හා උපකරණ සාධාරණ අගය පදනම් කර ගණනය කිරීම හැර මූල්‍ය ප්‍රකාශනවලට උද්ධමන සාධක ගැලපීම් සිදුකර නොමැත.

### 2.3 සංසංදනාත්මක සැසඳීම

ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම් ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වේ. අවශ්‍ය අවස්ථාවලදී සැසඳුම් අගයන් ප්‍රවර්තන වර්ෂයේ වෙනස්වීම් වලට ගලපා ඉදිරිපත් කර ඇත.

**2.4 ප්‍රමාණාත්මක බව**

සෑම ප්‍රමාණාත්මක හා සමාන අයිතම මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන්නේ නම් හා එක සමාන නොවන ස්වභාවයේ අයිතම වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

**2.5 හිලව් කිරීම්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) මගින් අවසරය දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව්කර කපා හැර නොමැත.

**2.6 අඛණ්ඩ පැවැත්ම**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සැලකිල්ලට ගෙන ඇත. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට අපේක්ෂා කල හැකි ඉදිරි අනාගතයක් සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ ඇති සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලය ඈවරකිරීමක්, මෙහෙයුම් නවතා දැමීමක් පුරෝකථනය නොකරයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් ඇත යන පදනම අනුගමනය කර ඇත.

**2.7 ගිණුම්කරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම්**

ගිණුම්කරණ කාලච්ඡේදයට පසුව ඇති සියලුම ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අවස්ථාවන් හිදී සුදුසු ගැලපීම් හා අනාවරණය කිරීම් සිදුකර ඇත.

**2.8 ක්‍රියාකාරී හා වාර්තාකරණ මුදල් ඒකකය**

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති අයිතම මනිනු ලබන්නේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ආර්ථික පරිසරයේ භාවිතා කරන මුදල් වලිනි ( ව්‍යවහාරික මුදල් ) මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඉදිරිපත් කර ඇත.

**2.9 විදේශ විනිමය වලින් කරන ලද ගනුදෙනු සහ ශේෂයන්**

විදේශ විනිමය මගින් කරන ලද ගනුදෙනු දිනයන්හිදී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් ව්‍යවහාරික මුදල් බවට පරිවර්තනය කර ඇත. එවැනි ගනුදෙනු නිරවුල් කිරීම මගින් ලැබෙන ලාභ සහ පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වාර්තා කර ඇත.

**2.10 ආසන්න අගයට වැටයීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසරය දී ඇති පරිදි වෙනත් අකාරයකින් දක්වා නොමැති නම් මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නම රුපියලට වටයා ඇත.

**2.11 දේපල පිරියත හා උපකරණ**

**2.11.1** දේපල පිරියත හා උපකරණ එහි පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත අගයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි කරන පාඩු අඩුකල අගයට පෙන්වා ඇත. පහත සඳහන් අනුපාතයන්ට අනුව සරල මාර්ග ක්‍රමයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995.10.05 දින දරණ චක්‍රලේඛ අංක 649 ට අනුව ක්ෂය කරනු ලැබේ.

| වත්කම් ප්‍රභේදය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| යන්ත්‍ර සහ පිරියත | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පුස්තකාල පොත් හා වාරසඟරා | 20% |
| මෝටර් වාහන | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ (ක්‍රීඩා භාණ්ඩ ඇතුලුව) | 20% |
| උපාධි ලෝගු හා රංගවස්ත්‍රාභරණ | 20% |

ක්‍රීඩා උපකරණ ආරම්භයේ සිට කාර්‍යාල උපකරණ ලෙජර ගිණුම යටතේ ගිණුම්ගත කර ඇති අතර ඉහත සඳහන් පරිදි ක්ෂය වීම උපකරණවලින් 20%ක ක්ෂයවීම් අනුපාතය මත ක්ෂය ගණනය කිරීම සිදු කරන ලදී.කෙසේ වෙතත් 2016 වසරේ සිට ක්‍රීඩා උපකරණ ප්‍රමාණය තොරතුරු භාවිතයේ පහසුව සඳහා වෙනම ලෙජර ගිණුමක වාර්තා කර ඇති අතර ක්‍රීඩා උපකරණ ක්ෂයවීම් අනුපාතිකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 649 යටතේ ලබා නොදීම නිසා කාර්‍යාල උපකරණ 20% අනුපාතය යටතේ ක්ෂය වී ඇත.(1995.10.05 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ 649)

**2.11.2 දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම**

දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති සමහර අයිතම අගයන් 2010.06.30 දිනට ප්‍රත්‍යාගණිත අගයට වේ.

**ඉඩම් හා ගොඩනැගිලි**

සියලු ඉඩම් ප්‍රත්‍යාගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. වසර 10ට වැඩි සියලු ගොඩනැගිලි 2010.06.30 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ ලියාපදිංචි තක්සේරුකරුවකු විසින් මෙම ප්‍රත්‍යාගණනය කර ඇත. සාධාරණ අගය වෙළඳපල වටිනාකම මත තීරණය කර ඇත.

නේවාසිකාගාර 2ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ආධාර ලෙස විශ්වවිද්‍යාලය වෙත ලබාදෙන ලදී. මෙම වටිනාකම 2017 නොවැ.01 දින සිට ක්‍රමක්ෂය කිරීමට පටන්ගෙන ඇත.

දෘෂ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිලි සහ බිම් සැලසුම්කරණය සහ සංගීත පීඨය සහ පොදු පහසුකම් සඳහා ගොඩනැගිලි 2021.12.15 සහ 31.03.2022 යන දිනවලදී අවසන් කර ඇති අතර දැනට එම ගොඩනැගිලි භාවිතා කරමින් පවතී. පහත මුළු ඉදිකිරීම් පිරිවැය 2022 වර්ෂයේදී වැඩ කරමින් පවතින ප්‍රාග්ධන ගිණුමෙන් අදාල වත්කම් ගිණුමට මාරු කර දේපල,පිරියත සහ උපකරණ යටතේ ක්ෂය වී ඇත.(PPE- සටහන 10)

| | රුපියල් |
|---|---|
| දෘෂ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිලි සහ බිම් සැලසුම්කරණය | 404,320,716.00 |
| සංගීත පීඨය සහ පොදු පහසුකම් සඳහා ගොඩනැගිලි | 565,651,995.00 |
| මුළු පිරිවැය | 969,972,712.00 |

2022.12.31 දිනට ඉහත ගොඩනැගිලි සඳහා හිඟ ගෙවීම් රුපියල් 124,079,264.99 ප්‍රාග්ධණීකරණය කර ඇත. 2024.12.31 දිනට වර්ෂය තුළ හිඟ ගෙවීම් සඳහා පොලී හිමිකම් පෑම සිදුකරන ලද අතර ගෙවන ලද පොලිය ප්‍රාග්ධනීකරණය කරන ලදී.

**පොත්පත් හා වාර සඟරා**

2005.12.31 දිනට ප්‍රථම මිල දී ගත් පොත් පත් හා වාර සඟරා ප්‍රත්‍යාගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත්තේ පහත සඳහන් පදනම අනුව වේ.

| පොත් පත් මිල දී ගත් කාල පරාසය | ප්‍රත්‍යාගණන පදනම |
|---|---|
| 01-01-1999 -31-12-2005 | 80% |
| 01-01-1990 -31-12-1998 | 70% |
| 1989-12-31 පෙර | 60% |

සුදුසුකම් ලත් ස්වාධීන උපදේශකවරයෙක් හා වරලත් ගණකාධිකාරිවරයෙක් එක් ව මෙම කාර්යය කරනු ලැබ ඇත.

**ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ**

පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ පහත සඳහන් පදනමට අනුව ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත.

| මිල දී ගත් කාල පරාසය | ප්‍රත්‍යාගණන පදනම |
|---|---|
| 1991-01-01 සිට 31-12-2000 | 80% |
| 31-12-1990 ට පෙර | 60% |

**කාර්යාල උපකරණ , විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ , උපාධි ලෝගු සහ රංග වස්ත්‍ර**

කාර්යාල උපකරණ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සහ උපාධි ලෝගු හා රංග වස්ත්‍ර පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල පහත සඳහන් පදනමට අනුව ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත.

| මිල දී ගත් කාල පරාසය | ප්‍රත්‍යාගණන පදනම |
|---|---|
| 1996-01-01 සිට 2005-12-31 | 75% |
| 2005-12-31 ට ප්‍රථම | 50% |

පිරිවැය හඳුනාගත නොහැකි කාර්යාල උපකරණ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සහ උපාධි ලෝගු සහ රංග වස්ත්‍ර ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම් අනුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම කාර්යය වරලත් ගණකාධිකාරිවරයෙකු සහ සුදුසුකම්ලත් ස්වාධින උපදේශකවරයෙකු විසින් ඒකාබද්ධව කරනු ලැබ ඇත.

**මෝටර් වාහන**

සියලුම මෝටර් වාහන 2024.02.15 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද අගය වන රු.64,100,000.00 ලෙස දක්වා තිබේ. සාධාරණ අගය තක්සේරු කර ඇතිතේ වෙළඳපල වටිනාකම හා භෞතික පිරික්සුම පදනම් කර ගනිමිනි. සිලෝන් ඔටෝමොබයිල් ඇසෝශියේශන්(ලංකා මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. අංක WP KJ-3863 දරන ටොයෝටා ලෑන්ඩ් කෲස ප්‍රාඩෝ (2010) ජීප් රථය පරිත්‍යාගයක් ලෙස මුදල් සහ ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබී තිබුණි. පාලක සභාව මෙම රථය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වෙත පැවරීම අනුමත කළ අතර එය විශ්වවිද්‍යාලීය ස්ථාවර වත්කම් ලේඛණනයට ඇතුළත් කරන ලදී. ඒ අනුව ඔටෝමොබයිල් ඇසෝශියේශන්(ලංකා මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. මෙම රථයේ අළුත්වැඩියා පිරිවැයද ඇතුළත් කරමින් එහි අගය රු.21,000,000.00 ක් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර ඇත.

**2.11.3 සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් (ශූනය වටිණාකමැති වත්කම්)**

වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයොජනවත් ආයුකාලය යටතේ පිරිසෙයින් එක් එක් වාර්ෂික වාර්ථා කිරීම් දිනයේදී සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අපේක්ෂණයන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම්, අදළ වෙනස්කම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 2011/03 හා 2014/03 මගින් විශ්වවිද්‍යාල පද්ධතියට අදල කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 7හි ඡේද අංක 65 ප්‍රකාරව, ප්‍රමිති අංක 03 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස දක්විය යුතුය. විගණකාධිපතිවරයාගේ විස්තරාත්මක විගණන වාර්ථාවේ ඡේද අංක 1.4.2 "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති" යන කොටසෙහි සඳහන් කර ඇති අයුරින්, එම ප්‍රමිතිය ප්‍රකාරව, දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් මත ඇස්තමේන්තු දෝෂයක් ඇතිවී තිබේ.

ඒ අනුව, ශූන්‍ය අගය සහිත ඒවාද ඇතුළු ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය ආරම්භ කරන ලද අතර 2024.12.31 දින වන විටත් ක්‍රියාත්මකව පැවතුණි. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කෙරෙමින් පවතින බැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 7 හි 91 ඡේදය ප්‍රකාරව 2024.12.31 දිනට රු.742,035,590.45 ක් වූ සම්පූර්යෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල සාරාංශයක් පහත අනාවරණය කෙරේ.(ශූන්‍ය වටිනාකමැති වත්කම්වල විස්තරාත්මක ලැයිස්තුවත් පරිශ්ඨ තුල දී තිබේ.)

| ප්‍රභේද අංකය | වත්කම් ප්‍රභේදය | මුල් පිරිවැය රුපියල් |
| --- | --- | --- |
| 3 | කාර්යාල උපකරණ | 240,485,750.38 |
| 4 | පිරියත සහ යන්ත්‍රෝපකරණ | 1,908,694.89 |
| 5 | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 334,430,419.84 |
| 6 | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 85,352,621.41 |
| 7 | පුස්තකාල පොත් හා වාරසඟරා | 55,194,159.53 |
| 9 | ක්‍රීඩා භාණ්ඩ | 4,748,390.00 |
| 9 | මෘදුකාංග පැකේජ | 360,000.00 |
| 14 | උපාධි ලෝගු හා රංගවස්ත්‍රාභරණ | 19,555,554.40 |
| | එකතුව | **742,035,590.45** |

ශුන්‍ය වත්කම් ප්‍රමාණය රු. 742,035,590.45 ක් වන අතර විකල්ප ගිණුම්කරණ ක්‍රමය අනුගමනය කෙරේ.

**2.11.4**

2015,2016 හා 2017 වර්ෂයන්හිදී ශුන්‍ය වටිනාකමැති වත්කම් සඳහා කරන ලද රු.16,157,917.84 ක් වූ ක්ෂය අධි-ප්‍රතිපාදන 2018 වර්ෂයේ ගිණුම් පොත් තුළ පහත පරිදි ගැලපුම් කර තිබේ.

| වත්කම් ප්‍රභේදය | ක්ෂය (රුපියල්) |
| --- | --- |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 10,760,353.72 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 805,316.93 |
| පුස්තකාල පොත් හා වාරසඟරා | 874,428.14 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 21,995.45 |
| ගොඩනැගිලි | 194,260.66 |
| උපාධි ලෝගු හා රංගවස්ත්‍රාභරණ | 1,205,076.96 |
| කාර්යාල උපකරණ | 2,296,486.10 |
| | **16,157,917.84** |

ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත පැකේජ දෙකක් තුළ පවත්වා ගෙන ගොස් තිබේ. ස්ථාවර වත්කම් දත්ත 2015 වර්ෂය දක්වා එක් පැකේජයක් (පැරණි පැකේජය) තුළද,2016 වර්ෂයේ සිට ඉදිරියට නව පැකේජය තුලද ලේඛනගත කර ඇත. පැරණි පැකේජයේ සියලුම දත්ත 2018 වර්ෂය තුල නව පැකේජයට අන්තර්ග්‍රහනය කර ඇති අතර පැකේජය පැරණිතම මිලදී ගත් දිනයේ සිට ක්‍රියාත්මක කර ඇත. මෙයද ඉහත සඳහන් කරන ලද ක්ෂය අධි-ප්‍රතිපාදනය සඳහා බලපෑම් වී තිබේ.

**2.11.5** 2020 වර්ෂයේදී ක්‍රීඩා භාණ්ඩවල පිරිවැයෙහි වටිනාකම වන රු.714,167.00 ක අගය 'කාර්යාලීය උපකරණ වෙතින් ක්‍රීඩා භාණ්ඩ වෙත මාරු කරනු ලැබූ අතර, ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත ක්ෂය 'කාර්යාලීය උපකරණවල සමුච්චිත ක්ෂය වෙතින් ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත වටිනාකම' වෙත මාරු කරන ලදී.

**2.11.6** ස්ථාවර වත්කම් ලේඛණයේ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාණ්ඩ 07ක් යටතේ සේවා කළ නොහැකි ස්ථාවර වත්කම් අයිතම 12,570ක් සඳහා බැහැර කිරීමේ පාඩු රු. 16,061,374 ක ස්ථාවර වත්කම් වල මුල් වටිනාකම රු.285,407,719.33ක් ලෙස, **2023.12.31** දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇත. මෙම කාරණය විගණකාධිපතිවරයාගේ 2023 අවසන් විගණන වාර්තාවේ සඳහන් කර ඇති බැවින්, බැහැර කරන ලද ස්ථාවර වත්කම් 12,570ක ලැයිස්තුව 2024 වාර්ෂික තොග සමීක්ෂණ කමිටුව මගින් පරීක්ෂා කොට සත්‍යාපනය කරන ලදී. බැහැර කරන ලද ස්ථාවර වත්කම් 12,570 ක විශ්ලේෂණයේ සාරාංශය මූල්‍ය කමිටුවට ඉදිරිපත් කර පහත තීරණ සඳහා පාලක සභා නිර්දේශය සහ අනුමැතිය ලබාගෙන ඇත.

01. 2023 ස්ථාවර වත්කම් ලේඛණයෙන් බැහැර කරන ලද අයිතම ලෙෂ තහවුරු කිරීම.

| අයිතම කාණ්ඩය | අයිතම ගණන | මුල් පිරිවැය | පොත් වටිනාකම | හේතු |
|---|---|---|---|---|
| බැහැර කිරීම | 295 | 1,489,582.50 | 10,872.16 | වාර්ෂික BOC-2024, මණ්ඩලය මගින් තහවුරු කරන ලද්දේ, මෙම බැහැර කිරීම කර ඇති බවයි. |
| ක්‍රීඩා භාණ්ඩ | 600 | 1,466,485.13 | | මේ සියල්ල ක්‍රීඩා උපාංග (උදා:ටෙනිස් බෝල,බැඩ්මින්ටන් පිත්ත, ආදිය) වන අතර පොත් වටිනාකම් ශුන්‍ය වේ. |
| පරිභෝජන ලැයිස්තුව | 101 | 70,875.00 | | මේ සියල්ල බෙර සඳහා භාවිතා කරන හම් වේ. භෞතිකව නොමැති අතර කල් පවතින බව අඩුය. වසර 6කට පෙර මිලදී ගත් අතර පොත් වටිනාකම් ශුන්‍ය වේ. |
| ඉවත් කරන අයිතම FAR | 111 | 25,875.00 | | සියලුම 110ක අයිතම කුඩා වටිනාකමක් ඇති(රුපියල් 500.00 ට අඩු) අයිතම වේ. ඉන් අයිතම 96ක් රංග වස්ත්‍රාභරණ වල උපාංග (උදා- පච්චවඩම්, පොහොට්ටු පෙති, පූන නූල, උරමා පටි ආදිය) සහ අයිතම 14ක් සාමාන්‍ය පුටු වේ.මේවා අඩු කල්පැවැත්මක් වන අතර භෞතිකව නොමැත. සමහරක් වසර 11 කට පෙර මිලදී ගෙන ඇති අතර සමහරක් වසර 6කට පෙර මිලදී ගන ඇත.1 අයිතමයන් පමණක් වන මේස විදුලි පංකාවක් අස්ථානගත වූ අයිතමයක් ලෙස සටහන් කර ඇත. පොත් වටිනාකම් ශුන්‍ය වේ. |
| මෘදුකාංග සහ පරිගණක උපාංග | 24 | 540,282.30 | 81,944.04 | මෘදුකාංග බලපත්‍රය වසර 1ක කාලයක් සඳහා වලංගු වන අතර මේවා කල් ඉකුතු වි ඇත. පරිගණක උපාංග ස්ථාවර වත්කම් නොවේ. |
| විදුලි උපකරණ | 26 | 106,040.30 | 2,198.98 | විදුලි උපාංග ස්ථාවර වත්කම් නොවේ. |
| හඳුනානොගත් අයිතම-මුල් වටිනාකම රු.5000/-ට සමාන සහ අඩු | 4,169 | 9,290,739.46 | - | මේ සෑම එකකම මිල රු.5000/ට අඩු වන අතර පොත් වටිනාකම් ශුන්‍ය වේ. මෙයින් 3085 ක් වසර 11 ට පෙර, 1055 ක් වසර 6කට පෙර සහ 31ක් වසර 5කට පෙර මිලදී ගන්නා ලදී.බොහෝ ඒවා ස්ථාවර වත්කම් ස්වභාවයක් නොගන්නා අතර අඩු කල්පවතින ඒවා වේ. |
| | **5,326** | **12,969,705.00** | **95,015.00** | |

විශ්ව විද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛණයෙහි වන අයිතම සම්පූර්ණ සත්‍යාපන ක්‍රියාවලියක් මගින් භෞතිකව පැවැත්ම තහවුරු කරන තෙක් හෝ බැහැර කරන තෙක් භෞතිකව පවත්නා බවට තහවුරු කරන ලද අයිතම හා භෞතිකව පවතින බවට තහවුරු කර නොහැකි අයිතම 2023 වර්ෂයෙහි ස්ථාවර වත්කම් ලේඛණයෙහි නැවත එකතු කිරීමට කටයුතු කරන ලදී.

| අයිතම කාණ්ඩය | සටහන | අයිතම ගණන | මුල් පිරිවැය | පොත් වටිනාකම | අයිතම ගණන | මුල් පිරිවැය | පොත් වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| ලබා ගත හැකි | 1 | 1682 | 68,492,734.19 | 6,447,830.96 | 1070 | 41,322,636.42 | |
| | | | | | 612 | 27,170,097.77 | 6,447,830.96 |
| මාරුවීම් | 2 | 470 | 13,570,355.69 | 379,834.22 | 302 | 12,065,841.61 | |
| | | | | | 168 | 1,504,514.08 | 379,834.22 |
| විදුලි පංකා | 3 | 701 | 6,946,961.31 | 548,296.01 | 395 | 2,953,141.51 | |
| | | | | | 306 | 3,993,819.80 | 548,296.01 |
| ඉන්වෙන්ටරි නොවන අයිතම (සවිකිරීම්, විදුලි සංදේශ අයිතම, අන්තර්ජාල සහ ඒ ආශ්‍රිත අයිතම) | 4 | 116 | 16,225,438.36 | 3,455,540.68 | 70 | 6,602,481.10 | |
| | | | | | 46 | 9,622,957.26 | 3,455,540.68 |
| හඳුනානොගත් අයිතම-මුල් වටිනාකම රු.5000/-ට වැඩි | 5 | 3125 | 164,249,774.04 | 4,875,857.66 | 2670 | 145,443,360.35 | |
| | | | | | 455 | 18,806,413.69 | 4,875,857.66 |
| හඳුනානොගත් අයිතම-මුල් වටිනාකම රු.5000/-ට සමාන සහ අඩු | 6 | 1150 | 2,952,751.05 | 258,972.04 | 1150 | 2,952,751.05 | 258,972.04 |
| | | **7244** | **272,438,014.64** | **15,966,331.57** | **7244** | **272,438,014.64** | **15,966,331.57** |

සටහන : 1 මෙම අයිතමවල භෞතිකව පැවැත්ම තහවුරු කර ඇත.

2 මෙම අයිතමවල භෞතික පැවැත්ම අඛණ්ඩ සත්‍යාපන ක්‍රියාවලිය මගින් තහවුරු කිරීමට කටයුතු කරනු ලැබේ.

4 මෙම සවිකිරීම් පවතින ගොඩනැගිල්ලට සවි කර ඇති අතර භෞතික පැවැත්ම තහවුරු කර ඇත.

3,5, සහ 6 භෞතිකව පැවැත්ම / නොපැවතීම, සත්‍යාපන ක්‍රියාවලියක් මගින් තහවුරුකිරීමට කටයුතු කරනු ලැබේ.

ස්ථාවර වත්කම් ලේඛණයේ ඇති සියලුම වත්කම් දෙපාර්තුමේන්තු, අංශ, ඒකක මගින් සත්‍යාපනය කර ඇත.

2.12 <u>**කෙරීගෙන යන වැඩ (ප්‍රාග්ධන**</u>)

වාර්තා කරන දිනට සම්පූර්ණ නොකරන ලද දේපල පිරියත හා උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන වැඩ මූලධන ලෙස දැක්වේ. කෙරීගෙන යන වැඩ මත දරන ලද පිරිවැය භාවිතයට ගන්නා විට දේපල පිරියත හා උපකරණ වෙත මාරු කරනු ලැබේ.

මුළු වියදම රු. 969,972,712.00 ක් වූ ඉදිකිරීම් 2022 වර්ෂයේ ප්‍රාග්ධන වැඩ කරමින් පවතින ගිණුමෙන් ගොඩනැගිලි වත්කම් ගිණුමට මාරු කරන ලදී.

2021 වර්ෂයේදී වැරදි ලෙස වාර්ථා කරන ලද ප්‍රාග්ධන වැඩ කරමින් පවතින ගිණුමෙන් පහත අයිතම සඳහා අදාල රු.23,286,880.00 ක සම්පූර්ණ මුදල ඉවත් කර ඇත.2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ (Restate) කිරීම සිදු කර ඇත.

| | |
|---|---|
| ඊ-කළමනාකරණ පද්ධතිය සංවර්ධනය | 10,789,000.00 |
| යටිතල පහසුකම් අළුත්යකරණය සහ උපස්ථ ක්‍රියාත්මක කිරීම | 10,982,953.00 |
| IT Lab Horton වෙත මූලික ජාල උපකරණ | 1,514,925.87 |
| මුළු එකතුව | 23,286,880.00 |

**2.13 අස්පෘශ්‍ය වත්කම්**

පිරිවැය නිශ්චිතව මැනිය හැකි පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කර දක්වනු ලැබේ. මෙම පිරිවැය එළදායී ජීව කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

**2.14 මූල්‍ය වත්කම්**

**ආයෝජන**

ස්ථාවර තැන්පතු ආයෝජන මගින් නිරූපනය කරයි. මෙම ආයෝජනයන් "ආයෝජන" මූල්‍ය වාර්තා කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 09 ට අනුව ගිණුම්ගතකර ඇත.

**2.15 ජංගම වත්කම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල වර්ෂය තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන හෝ උපයෝජනය වෙතැයි අපේක්ෂා කරන ඒවා වන අතර, වාර්තා කරන දිනයේ සිට මාස දොළහක් තුල සිදුවන සිදුවීම් වේ.

**2.16 තොග**

ඉන්වෙන්ටරි පිරිවැය ප්‍රකාශය කර ඇති අතර පළමුවෙන් ඇතුල්වෙන අයිතම පළමුවෙන් පිටතට FIFO පදනම මත තීරණය වේ. ඉන්වෙන්ටරි ප්‍රධාන වශයෙන් ලිපි ද්‍රව්‍ය සහ අමතර කොටස් වලින් සමන්විත වේ. ඉන්වෙන්ටරි ඇත්තේ පරිභෝජනය සඳහා වන අතර නැවත විකිණීම සඳහා නොවේ.

ඉන්වෙන්ටරි අයිතමවල සෙමින් චලනය වන අයිතම (උදා:පොත්) රු.1,092,714.11 ක් සහ චලනය නොවන අයිතම රු.67,066.68 ක් ඇතුළත් වේ. මූල්‍ය රෙගුලාසි අංක 102 සහ රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිය 9 ට අනුව ප්‍රධාන ගබඩාවල ප්‍රකාශනවලින් වටිනාකම අඩු කිරීමේ හෝ පාඩු සිදුවීමේ සම්භාවිතාවක් නොමැති බැවින්, ප්‍රතිපාදන කිසිවක් සිදුකර නොමැත.නඩත්තු අංශයේ ඉන්වෙන්ටරි වෙන වෙනම ගණනය කෙරේ.

VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ පොත් තොගය මිල වටිනාකමට අනුව ඉන්වෙන්ටරියේ ඇතුලත් වේ. VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ පොත් තබාගෙන සිටින්නේ විකුණා මුදල් ඉපයීමේ අරමුණිනි්ය.

**2.17 සේවකයන්ට ලබා දුන් අත්තිකාරම් හා ලැබිය යුතු දේ.**

සේවකයන්ට ලබාදුන් අත්තිකාරම් හා ලැබිය යුතු ශේෂය උත්සව අත්තිකාරම් හා පොත් සඳහා වන දීමනාවෙන් සමන්විත වේ.

**2.18 මුදල් හා මුදල් සමාන දේ.**

මුදල් හා මුදල් සමාන දේ මගින් නිරූපණය වන්නේ ජංගම ගිණුම් ශේෂය සහ ඉතිරි කිරීමේ ගිණුම් වල ශේෂයන් වේ. අතේ ඇති මුදල්, හා කෙටිකාලීන ඉහල ද්‍රවශීලී ආයෝජන එනම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කල හැකි වටිනාකම සුළු අවධානමකට යටත් ද වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන ද යන්නට අතැති මුදල් හා බැංකුවේ ඇති තැන්පතු ද අදාළ වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කරනු ලබන්නේ වක්‍ර ක්‍රමය මත පදනම්වය.

**2.19 සේවක ප්‍රතිලාභ**

**පාරිතෝෂික සඳහා වෙන් කිරීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක LKAS 19 පරිදි වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන සියළු සේවක භවතුන් වෙනුවෙන් විශ්‍රාමික පාරිතෝෂිත සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙම වෙන් කිරීම් බාහිර අරමුදලක ආයෝජනය කර නොමැත.2019.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ 05/2019 අනුව පාරිතෝෂික වෙන්කිරීම් පසුගිය වසර වලට සාපේක්ෂව විශාල ලෙස ඉහල ගොස් තිබේ. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන අධ්‍යයන දීමනාව සහ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන මාසික හිලව් දීමනාව (MCA) පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීම සඳහා සලකා බලන ලදී.

පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා ගලපන ලද වට්ටම් අනුපාතය සලකා බලා ඇති අතර, ගලපන ලද වට්ටම් අනුපාතය ලබා ගැනීම සඳහා බැදුම්කර ප්‍රතිලාභය ගෙවීම පැහැර හැරීම ගලපා ඇත.

**2.20 වගකීම් සහ වෙන්කිරීම්**

**ජංගම වගකීම්**

ජංගම වගකීම් ඒවායේ පොත් අගයට සඳහන් කර ඇත.

**වෙන් කිරීම්**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට ඇති වර්තමාන බැඳීම් (නෛතික) පවතින අවස්ථාවන්හිදී වෙන් කිරීම් හඳුනාගෙන වාර්ථා කර ඇත.

**අවිනිශ්චිත වගකීම් හා අවිනිශ්චිත වත්කම්**

අවිනිශ්චිත වගකීමක් යනු ක්‍රියාදාමයේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් මත සිදුවන සිදුවීම හඳුනා නොගත් වර්තමාන වගකීම් වන අතීත සිදුවීම් වලින් පැනනැගිය හැකි සිදුවීමකි. වගකීම පියවීම සඳහා සම්පත් ගලා යාමක් අවශ්‍ය වනු ඇත.
නිශ්චිතව මැනිය නොහැකි වගකීම් ඇති අවස්ථාවන්හිදී අවිනිශ්චිත වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙලිදරව් කරයි.

අවිනිශ්චිත වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුවීම් වලින් පැන නැගිය හැකි වත්කමකි. විශ්වවිද්‍යාලයේ අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා අතර, නිශ්චිත නොවන එහි පැවැත්ම අනාවරණය කරයි.

**2.21 ආදායම් හඳුනාගැනීම**

රජයේ පුනරාවර්ථන ආධාර මුදල් පදනම් මත ගිණුම් ගත කෙරේ. ශිෂ්‍යයින් ගෙන් අය කරනු ලබන පාඨමාලා ගාස්තු ඒවා එකතු කරන අවස්ථාවේ දි ගිණුම් ගත කෙරේ. ආයෝජන කටයුතු මත ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ස්වයං මූල්‍ය පදනම මත පවත්වාගෙන යනු ලබන පාඨමාලා වෙනුවෙන් ශිෂ්‍යයන්ගෙන් අයකරනු ලබන පාඨමාලා ගාස්තු අදල පරිදි මූල්‍ය ප්‍රකාශ වල පාඨමාලා කාලය පදනම් කර ගෙන විලම්භනය කරනු ලැබේ.

**මූල්‍ය ආදායම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 අනුව පොලී අනුපාතය භාවිතා කරමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

**2.22 වියදම් හඳුනා ගැනීම**

මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දැක්වෙන වියදම් එකී වියදම් වල ස්වභාවය පදනම් කරගෙන වෙන වෙනම දක්වා ඇත. වසරේ අතිරික්තය ගණනය කිරීමේ දි ප්‍රථම උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් දරණ ලද සියළු වියදම් රජයේ පුනරාවර්ථන ආධාර වලින් අඩුකර පෙන්වා ඇත.

**2.23 නිශ්චිත අරමුදල් (සීමා සහිත)**

මෙම අරමුදල් පීඨ මණ්ඩල, සෙනෙට් සභාව, මූල්‍ය කමිටුව සහ කවුන්සිලයේ අනුමැතිය ඇතිව නිශ්චිත අරමුණු සඳහා ස්ථාපිත කර ඇත. මෙම අරමුදල්වල මෙහෙයුම් මෙහෙයවීම සඳහා අතුරු නීති සහ UGC චක්‍රලේඛ ඇත. එබැවින්, මෙම අරමුදල් එදිනෙදා මෙහෙයුම් අරමුදල් එරෙහිව මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දක්වා ඇත.
වසර තුල ශිෂ්‍යත්ව අරමුදල්වල සමුච්චිත පොලියෙන් ශිෂ්‍යත්ව ගෙවනු ලැබේ.තවද, අනෙකුත් අරමුදල්වලින් දරනලද වියදම් වසර අවසානයේ අදළ අරමුදල් ගිණුමට අය කෙරේ.

**2.24 විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL)**

විශ්වවිද්‍යාලය - විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL) නමින් හැඳින්වෙන වෙනම ඒකකයක් ස්වයං මූල්‍යය පදනමක් මත පවත්වාගෙන යයි.මෙම ඒකකය සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර ඉන් අනතුරුව ඒවා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කෙරේ.
කොමිෂන් සභා චක්‍රලේඛ 932 අනුව CODL අරමුදල භාවිතා කිරීම සඳහා CODL විසින් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඇත. ඒ සඳහා අරමුදල් වියදම් ප්‍රමාණය අරමුදල් අදායම් ගිණුමට මාරු කරනු ලැබේ.වසර තුළ අරමුදල් වියදම් රු.560,343.98.00 කි.

CODL හි ආදායම පහත පරිදි කාල පදනම අනුව වෙසන් වී ඇත.(පාඨමාලාව 2023 හා 2024 ආරම්භ වූ පාඨමාලා සම්පූර්ණ කිරීමට අවශ්‍ය මාස ගණන)

| අධ්‍යයන වැඩසටහන | ඉදිරියට ගෙනා වෙනත් ආදයම් | වසරතුල පාඨමාලා වලින් ලද ආදායම් | එකතුව | වෙනත් ආදයම් | |
|---|---|---|---|---|---|
| චිත්‍ර:පාඨමාලාව 2022/23 | 725,100 | 240,000 | 965,100 | - | |
| පෙරදිග සංගීතය :පාඨමාලාව 2022/23සහ 2023/24 | 18,136 | - | 18,136 | - | |
| නර්ථනය:පාඨමාලාව 2023/24 | 2,591,643 | 1,850,000 | 4,441,643 | - | |
| චිත්‍ර:පාඨමාලාව 2024/25 | 1045 | 5,182,090 | 5,183,135 | 3,455,423 | මාස 08 ඉදිරියට |
| නර්ථනය:පාඨමාලාව 2024/25 | - | 354,100 | 354,100 | 354,100 | |
| සෙරමික් කලාව:පාඨමාලාව 2024/25 | - | 19,590 | 19,590 | 19,590 | |
| එකතුව | 3,349,459 | 9,840,280 | 13,189,739 | 3,829,113 | |

**2.25 පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය**

ස්වයං මූල්‍ය පදනම මත පශ්චාද් උපාධි පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාලයට වෙනම පීඨයක් ඇත.මෙම පීඨය සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉන් අනතුරුව ඒවා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමග ඒකාබද්ධ කෙරේ. කොමිෂන් සභා චක්‍රලේඛ 932 අනුව, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ අරමුදල භාවිතා කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඇත. ඒ සඳහා අරමුදල් වියදම් ප්‍රමාණය අරමුදල් ආදයම් ගිණුමට මාරු කරනු ලැබේ.වසර තුල අරමුදල් වියදම් රු.5,009.83 කි.

පහත සඳහන් පරිදි සිදු කළ යුතු ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ආදයම වෙනස් වී ඇත.(විභාග සඳහා වියදම් දැරීමට සිදුවේ).

| වෙනත් ආදයම් | වෙනත් ආදයම් | වසර තුල පාඨමාලා වලින් ලද ආදායම් | එකතුව | වෙනත් ආදයම් |
|---|---|---|---|---|
| දර්ශනපති | - | 345,500 | 345,500 | - |
| දර්ශන විශාරද | - | 485,000 | 485,000 | - |
| කෙටි පාඨමාලා 3 | - | 96,000 | 96,000 | - |
| කෙටි පාඨමාලා 4 | - | 717,500 | 717,500 | - |
| එකතුව | | 1644,000 | 1644,000 | |

**2.26 මූලධන / සංවර්ධන ආධාර යටතේ ලද විශේෂ ආධාර ගිණුම්ගත කිරීම.**

මහා භාණ්ඩාගාරයෙන් විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මූලධන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රථමයෙන් වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කෙරේ. මෙම මුදල් පුනරාවර්තන ස්වභාවයේ කටයුතු සඳහා වැය කරන විට එම මුදල් මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ පුනරාවර්තන වියදම් සේ දක්වනු ලබයි.

**2.27 ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා ලැබෙන මූලධන ආධාර ගිණුම් ගත කිරීම.**

මූලධන වියදම් සේ සැලකිය හැකි වියදම් පමණක් ප්‍රාග්ධනීත කරනු ලබන අතර අනෙකුත් වියදම් මූල්‍ය කාර්ය සාධක වාර්තාවේ වියදම් ලෙස දක්වා ඇත.

**2.28 සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ ප්‍රතිපත්තියක් ලෙස විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාල පහසුකම් LEARN ආයතනයෙන් ලබා ගනිමින් පවතී.

අප විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ආචාර්ය අනූෂා ජයසිරි LEARN සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කරමින් සිටී.එම කථිකාචාර්යවරිය විසින් මෙම සමාගමට සපයන සේවය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් හෝ එම සමාගම විසින් කිසිදු පාරිශ්‍රමිකයක් ගෙවනු නොලැබේ.

## 2.29 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලද දළ මුදල් ලැබීම් සහ දළ මුදල ගෙවීම් හඳුනාගෙන ඇති SLPSAS 2ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කර ඇත.මුදල් සහ සමානාත්මතාවයන් කෙටි කාලීන, ඉතා ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්ථනය කළ හැකි අතර වටිනාකමේ වෙනස්වීම් වල නොසැලකිය යුතු අවදානමකට යටත් වේ.

## 2.30 විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇති සහ විශ්වවිද්‍යාලය සතුව ඇති ඉඩම් අයිතිය පිළිබඳ විස්තර

| ඉඩම | වත්මන් තත්වය |
|---|---|
| අංක 21 ඇල්බට් චන්ද්‍රවංකය | 2017 අප්‍රේල් මස 27 වන දින, රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදාන අංක 4/10/41274 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත. |
| අංක 21/1 ඇල්බට් චන්ද්‍රවංකය | 2013 නොවැම්බර් 19 වන දින රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදාන අංක 4/3/9908 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත. |
| අංක 46, හෝර්ටන් පෙදෙස | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. |
| අංක 146 අනගාරික ධර්මපාල මාවත,දෙහිවල | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. |
| අංක 137 වලව්වත්ත,රාජගිරිය | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. |

## 2.31 ගිවිසුම් කඩකිරීම පිළිබඳ විස්තර

නම: එස්.එම්.කොට්ටගොඩ මහතා
වත්මන් තත්වය : බේරුම්කරණය 2020.09.29 දින දැනුම් දී ඇත. බැඳුම්කර වටිනාකම වාරික 48 කින් නිම කිරීමට කවුන්සිලය අනුමත කර ඇති අතර පියවීමේ ගිවිසුමට අනුව 2022 ජූනි මාසයේ සිට මාසික වාරික ගෙවනු ලැබේ. අර්ථසාධක අරමුදල් නිකුතුවෙන් රුපියල් 1,057,456.30 ක් අයකරගෙන ඇති අතර 2022 සහ 2023 වසර සඳහා ලැබුණු මුළු වාරික රුපියල් 2,035,577.03 ක් අයකරගෙන ඇත. මින් රු.2,305,055.77 ක් ආයෝජනය කර ඇත. ලැබියයුතු මුදල රුපියල් 1,904,257.62ක් ලෙස 2023 ගිණුම් පොත්වල සටහන් කර ඇති අතර එය රුපියල් 1,116,300.06 ක් ලෙස 2024.12.31 ගිණුම් වල නැවත ප්‍රකාශ කර ඇත.

නම: පී.කේ.ඩබ්.එම්. විජේගුණසේකර මිය
වත්මන් තත්වය: ප්‍රධාන ණයගැතියාට සහ ඇපකරුවන්ට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DMR/1853/2019 සහ DMR/1852/2019 යටතේ නඩු පවරා ඇත. ප්‍රධාන ණයගැතියා විසින් බේරුම් කිරීම යෝජනා කර අනුමැතිය සඳහා 2020.12.17 දින පැවති 178 වැනි විශ්වවිද්‍යාල සභාව වෙත යොමු කර ඇත. කාර්යය ඉදිරියට කෙරෙමින් පවතී. අයකරගතයුතු මුදල රුපියල් 1,271,568.00ක් වන අතර අර්ථසාධක අරමුදලින් අයකරගත හැකි මුදල රුපියල් 148,438.31 කි.

**2.32 වෙනත්**

**2.32.01 VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය**

කවුන්සිලයේ 180 වන රැස්වීමේදී අනුමැතිය ඇතිව ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක මුද්‍රිත පොත් ප්‍රකාශයට පත් කිරීම සඳහා VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය නමින් වෙනම ඒකකයක් 2021 දී ස්ථාපිත කර ඇත. VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය මගින් එම පොත් මුද්‍රණය කර ඇති අතර මුද්‍රිත පොත් තොග විශ්වවිද්‍යාල ගබඩාව වෙත ලැබී ඇත.ගණුදෙනු VAPA මුද්‍රණාල ගිණුමේ සටහන් කර ඇති අතර මුද්‍රිත පොත්වල ශේෂය ඉන්වෙන්ටරිය යටතේ පෙන්වා ඇති (රු.1,863,043.31)කි. VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ ගණුදෙනු 2022 වර්ෂයේදී වාර්ථා කිරීමට සැලසුම් කර තිබුණද, 2023 වසරේ වෙනම ගිණුම් පොත්වල සටහන් කර ඇත.

**2.32.02 VAPA රූපවාහිණී**

"VAPA රූපවාහිණී නාලිකාව 2022 දී පාලක සභාවේ අනුමැතිය ඇතිව ආරම්භ කරන ලද අතර එය පුළුල් පරාසයක අධ්‍යාපනික සහ විනෝදාස්වාද වැඩසටහන් විකාශනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදී. VAPA රූපවාහිණී හි මූලික අධ්‍යාපනික පරමාර්ථය වන්නේ දෘශ්‍ය සහ ප්‍රාසාංගික කලාවන්හි විෂය-විශේෂිත දැනුම සහ භාවිතයන් වැඩිදියුණු කිරීමයි. නාලිකාව විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම්- ඉගෙනීමේ ක්‍රියාවලියේ මෙන්ම දැනුම හා කුසලතා ප්‍රජාව වෙත බෙදා හැරීමේ අංගයකි.එය සතියේ දිනවල පෙරවරු7.00 සිට පස්වරු.7.00 දක්වා ක්‍රියාත්මක වේ.සති අන්තයේ උදේ 7.00 සිට රාත්‍රී 9.00 දක්වා ක්‍රියාක්මක වේ. මෙහි උපාධි අපේක්ෂනයින්ට ස්ථානිය අභ්‍යන්තර පුහුණුව ලබා දේ.VAPA රූපවාහිණී හි ගනුදෙනු විශ්වවිද්‍යාල ගිණුම් පොත්වල සටහන් කර ඇත.

**2.31.03 AHEAD ව්‍යාපෘතිය**

විශ්ව විද්‍යාලයේ (UVPA) මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්‍යාලය (OTS) 2018 අප්‍රේල් 1 වන දින උසස් අධ්‍යාපන ව්‍යාපෘති සංවර්ධන වේගවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලදී. AHEAD ව්‍යාපෘතිය යටතේ (UVPA) හි ව්‍යාපෘති තුනක් මුලින් ආරම්භ කරන ලදී. පසුව 2021 ජූලි මාසයේදී UVPA වෙත තවත් නව ව්‍යාපෘති පහක් පිරිනැමීමෙන් පොයොසත් කිරීම,ඉගෙනීම, ඉගැන්වීම, තක්සේරු කිරීම සහ ඉංග්‍රීසි භෂා කුසලතා වැඩිදියුණු කිරීම (ELTA/ELSE) යටතේ ප්‍රදන පුළුල් කරන ලදී. විශ්ව විද්‍යාලයේ ස්ථිර කාර්‍යය මණ්ඩලයෙන් අධ්‍යාක්ෂක නියෝජ්‍ය අධ්‍යාක්ෂක(ප්‍රසම්පාදන) සහ නියෝජ්‍ය අධ්‍යාක්ෂක(මුදල්) ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකු අර්ධකාලීන පදනමින් සේවයේ යොදවා ඇත. ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී සහ ව්‍යාපෘතිය ලේකම් කොන්ත්‍රාත් පදනම මත පූර්ණ කාලීනව,බාහිරව කුලියට ගන්නා ලදී.ලෝක බැංකුවේ උපදෙස් අනුව මෙම පත්වීම් සිදු කර ඇත. මුලදී ව්‍යාපෘති කාර්‍ය මණ්ඩලයේ වැටුප් සහ දීමනා ව්‍යාපෘතිය මගින් ගෙවන ලදී.පසුව අර්ධ කාලීන නිලධාරීන්ගේ දීමනා 2022 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි UVPA විසින් ගෙවන ලදී.

OMST හි උපදෙස් මත ලංකා බැංකු නිදහස් චතුරශ්‍ර ශාඛාවේ වෙනම ජංගම ගිණුමක් පවත්වාගෙන යන ලදී. 2023 දෙසැම්බර් 31 දිනට මෙම ජංගම ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොමැත. ව්‍යාපෘතියේ ප්‍රාග්ධන හා පුනරාවර්ථන වියදම් දැරීමට OMST විසින් ඉහත ඉහත ජංගම ගිණුමට වරින් වර තොග වශයෙන් ප්‍රදාන නිකුත් කරන ලදී.

2023 දෙසැම්බර් 31 වැනි දින දක්වා ව්‍යාපෘතිය කාල සීමාව තුළ මිලදීගත් සියලුම ස්ථාවර වත්කම් නැවත සලකා බැලීමේදී ගිණුම්පොත්වල සටහන්කර ඇති අතර ක්ෂයවීම් ගණනය කර ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන නැවත ඉදිරිපත් කරන ලදී. තවද 2022 සහ 2023 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්ථන වියදම් සටහන් කර ඇත.සියලුම ව්‍යාපෘති අවසන් කිරීමේ කටයුතු අවසන් කිරීමට ඇති බැවින් ව්‍යාපෘතියේ අවසන් දිනය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

**2.32.04 විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතාවය - UBL**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) චක්‍රලේඛ අංක 10/2016ට අනුකූලව, අධ්‍යයන-කර්මාන්ත සහයෝගීතාවය වැඩි දියුණු කිරීම, පර්යේෂණ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සහ විවිධ ව්‍යාවසායක ක්‍රියාකාරකම් හරහා දැනුම ව්‍යාප්තියට සහයවීම සඳහා AHEAD ව්‍යාපෘතියෙහි මූල්‍ය අනුග්‍රහය ඇතිව විශ්වවිද්‍යාල ව්‍යාපාර

සම්බන්ධතාවයක් (UBL) *විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත බර ඇත. නවෝත්පාදනය, පර්යේෂණ වාණිජකරණය සහ* ප්‍රජා සහභාගිත්වය පෝෂණය කිරීම තුලින් විශ්වවිද්‍යාලය සහ කර්මාන්තය අතර පවතින පරතරය පියවීම UBL හි මූලික අරමුණ වේ.

2023.07.20 දින උපකුලපතිවරයාගේ අධීක්ෂණය යටතේ පැවති 200 වන රැස්වීමේදී විශ්වවිද්‍යාල පාලක සභාව විසින් UBL හිමෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම අනුමත කරන ලදී. මූල්‍ය ස්වාධීනත්වය සහ දිගුකාලීන තිරසාරභාවය සහතික කරමින් 2023 සිට UBL ක්‍රියාකාරකම් තමන්ගේ අරමුදල් හරහා පවත්වාගෙන යනු ලබයි. මූල්‍ය වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම සඳහා 2023 මූල්‍ය වර්ෂයේ UBL ක්‍රියාකාරකම් සඳහා වෙනම මූල්‍ය ගිණුම් පවත්වාගෙන ගොස් ඇත.

2.33

**සංසන්දනයන් නැවත ප්‍රකාශ කිරීම**

ගිණුම් පොත්වල ගොඩනැගිලි වත්කම් සඳහා වැට් බදු අයකර ගැනීමේ වටිනාකම ගිණුම්ගත කිරීම සහ පෙර වසරේ ගනුදෙනු වාර්තා කිරීම හේතුවෙන් පෙර වසරවල දෝෂ නිවැරදි කිරීම් සහ ශුද්ධ වත්කම්/ කොටස් වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශන 2024 ජනවාරි 1 වන දිනට සකස් කර ඇත. වැරදි ප්‍රකාශය සැලකිය යුතු බැවින් එය දෝෂ නිවැරදි කිරීම පිළිබිඹු කරයි.

| විස්තරය | | ගැලපීම් | 2022 ජනවාරි 01 දින අනාවරණය කළ පරිදි | |
|---|---|---|---|---|
| සමුච්චිත අතිරික්තය / ඌනතාවය (සමුච්චිත පුනරාවර්ථන අරමුදල) | (134,809,037) | (13,041,316) | (147,850,353) | 31.1 |
|---|---|---|---|
| **29** | **පරිත්‍යාග** | **2024** | **2023** |
| | | | **(නැවත ප්‍රකාශිත)** |
| | | රු. | රු. |
| | පරිත්‍යාග - VAPA මුද්‍රණාලය | 91,200 | 400,795 |
| | පරිත්‍යාග ( AHEAD ) | - | 2,696,350 |
| | | **91,200** | **3,097,145** |

| | | | |
|---|---|---|---|
| **30** | **උපලබ්ධි ආදායම** | **2024** | **2023** |
| | | | **(නැවත ප්‍රකාශිත)** |
| | | රු. | රු. |
| | උපලබ්ධි ආදායම - CODL | 3,829,113 | 3,349,458 |
| | උපලබ්ධි ආදායම - FGS | - | 88,000 |
| | | **3,829,113** | **3,437,458** |

**සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය**
**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය ප්‍රකාශ වලට සටහන්**
**(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)**

| | | | | |
|---|---|---|---|---|
| **31** | **පෙර වසර ගැලපීම්** | | | |
| **31.1** | **පෙර වසර ගැලපීම් - පුනරාවර්තන සමුච්චිත අරමුදල** | | | |
| | වාර්තා ගත කළ 2024.01.01 දිනට ශේෂය | | | (134,809,037) |
| | **<u>පෙර වසර ගැලපීම් 2023</u>** | ජර්නල සටහන් | | |
| i. | 2023 දී නර්තන රඟහල ආදායම රු. 185,000 ට අඩුවෙන් වාර්තා කිරීම නිවැරදි කිරීම, ආදායමට එරෙහිව වියදම් ගිණුම්කරණය | 392 | 185,000 | |
| ii. | වාර්තා නිවැරදි කිරීම ව්‍යාපෘතිය සම්ප්‍රදායික ව්‍යාපෘති ආදායම රු.358,000 ට අඩුවෙන් ගෙන ඒම, 2023 වසරේ ගිණුම් ආදායමට ප්‍රතිවිරුද්ධ වියදම් අඩු කිරීම. | 391 | 358,000 | |
| iii. | 2023 වසර සඳහා නර්තන රංග ශාලාවේ වියදම ගණනය කිරීම නිවැරදි කිරීම. | 392 | (185,000) | |
| iv. | 2023 වසර සඳහා Project Bring Tradition ව්‍යාපෘතියේ වියදම ගණනය කිරීම නිවැරදි කිරීම. | 391 | (358,000) | |
| v. | 2023 වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා අඩුවෙන් සටහන් කිරීම නිවැරදි කිරීම - (යොමුව 31.5) | 305 | (28,287,108) | |
| vi. | 2023 වර්ෂය සඳහා රක්ෂණ වියදම් වාර්තා කිරීම පිළිබඳ නිවැරදි කිරීම. | 346 | (1,836,125) | |
| vii. | 2023 දී වියදම් ලැබිය යුතු ගිණුමට UBL ගිණුම් වාර්තා කිරීම ලෙස සටහන් කිරීම නිවැරදි කිරීම. | 371 | 1,438,580 | |
| viii. | VAPA මුද්‍රණ BOC ගිණුමේ 2023 වසරේ ආදායම VAPA මුද්‍රණ ගිණුම් වෙන වෙනම වාර්තා කිරීමක් ලෙස වාර්තා කිරීම නිවැරදි කිරීම. | 372 | (341,819) | |
| ix. | 2023 දී VAPA TV හි ආදායම VAPA TV ගිණුම් වෙන වෙනම වාර්තා කිරීමක් ලෙස නිවැරදි කිරීම. | 373 | (182,625) | |
| x. | 2023 දී VAPA TV හි වියදම් VAPA TV ගිණුම් වෙන වෙනම වාර්තා කිරීම ලෙස නිවැරදි කිරීම. | 373 | 346,978 | |
| xi. | 2023 දී බාහිර කථිකාචාර්ය ගෙවීම | | (3,000) | |
| xii. | UBL හි 2023 වසරේ ආදායම UBL ගිණුම් වෙන වෙනම වාර්තා කිරීමක් ලෙස වාර්තා කිරීම නිවැරදි කිරීම. | 317 | (645,710) | |
| xiii. | 2023 දී VAPA මුද්‍රණාලයේ වියදම් VAPA මුද්‍රණාල ගිණුම් වෙන වෙනම වාර්තා කිරීමක් ලෙස නිවැරදි කිරීම. | 318 | (593,689) | |
| xiv. | උපාධි තැන්පතු ලැබීම් | | 614,889 | |
| xv. | විශේෂ දීමනා වල විශේෂ අත්තිකාරම් සටහන් කිරීම නිවැරදි කිරීම. | 307 | 3,211 | |
| xvi. | ආසන්න සංඛ්‍යාවට වැටයීම නිවැරදි කිරීම | | 25 | |
| xvii. | ආසන්න සංඛ්‍යාවට වැටයීම නිවැරදි කිරීම | | 18 | |
| xviii. | 2023 දී VAPA මුද්‍රණ සහ VAPA TV හි වියදම් VAPA මුද්‍රණ සහ රූපවාහිනී ගිණුම් වෙන වෙනම වාර්තා කිරීමක් ලෙස නිවැරදි කිරීම | 335 | 197,315 | |
| xix. | IMAC පරිගණක අලුත්වැඩියා ගාස්තු ආපසු ගෙවීම | | 281,413 | |
| xx. | 2023 විගණන විමසුමට අනුව 2023 දී වාර්තා කරන ලද බැහැර කිරීම නිවැරදි කිරීම, අයිතම 5326 ක් බැහැර කිරීම - (යොමුව: 31.4 | | 15,966,330 | |
| | | | | (13,041,316) |
| | **2023.01.01 දිනට නිවැරදි කරන ලද ශේෂය - නැවත සකස් කරන ලදී.** | | | **(147,850,353)** |
| **31.2** | **සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනය සඳහා පෙර වසරේ ගැලපීම්** | | | |
| | වාර්තා කර ඇති පරිදි 2024.01.01 දිනට ශේෂය | | | 2,473,768,355 |
| | **2023 වර්ෂය සඳහා පෙර වසර ගැලපීම්** | | | |
| i. | ප්‍රාග්ධන අත්තිකාරම්වල වැට් ප්‍රමාණය අයකර ගැනීම හේතුවෙන් ගොඩනැගිලි ගිණුම් ප්‍රාග්ධනීකරණය සඳහා ක්ෂයවීම් වාර්තා කිරීම නිවැරදි කිරීම. - (යොමුව: 31.3) | | (659,705) | |
| ii. | 2023 දී බැහැර කිරීමේ ගැලපුම් අහිමි වීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට සිදු වූ වෙනස්කම් - (යොමුව: 31.4) | | (12,011,039) | (12,670,744) |
| | **2023.01.01 දිනට නිවැරදි කරන ලද ශේෂය - නැවත සකස් කරන ලදී.** | | | **2,461,097,611** |

**31.3** **ගොඩනැගිලි වත්කම් වලට ගැලපීම**

| විස්තරය | ගොඩනැගිලි වත්කම් ගිණුම (සටහන B) | ප්‍රාග්ධන අත්තිකාරම් ගිණුම (සටහන C) | | සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනය JE/332 | සමුච්චිත ක්ෂයවීම් JE/395 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන අත්තිකාරම්වල වැට් බදු ප්‍රමාණය අයකර ගැනීම සහ පොලී සහ ශේෂ ගෙවීම හේතුවෙන් ගොඩනැගිලි ගිණුම් ප්‍රාග්ධනීකරණය කිරීම. | | | ජර්නල සටහන් | | |
| 1 පොදු පහසුකම් සහ සංගීත පීඨ ගොඩනැගිල්ල | 4,262,549 | (4,262,549) | JE/344 | - | |
| 2 දෘශ්‍ය කලා පීඨ ගොඩනැගිල්ල | 2,714,204 | (2,714,204) | JE/342 | - | 649,384 |
| 3 දෘශ්‍ය කලා පීඨ ගොඩනැගිල්ල | 10,273,477 | - | JE/355 | - | - |
| 4 සංගීත පීඨ අදියර IV අදියර II | (303,988) | 303,988 | JE/323 | - | - |
| 5 සංගීත පීඨ අදියර IV අදියර II | 20,357,659 | - | JE/355 | - | - |
| 6 සංගීත පීඨ අදියර IV අදියර II | 50,752 | (50,752) | JE/343 | - | - |
| 7 ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම | - | (10,321) | | 10,321 | - |
| මුළු වටිනාකම | **37,354,652** | **(6,733,838)** | | **10,321** | **649,384** |

**31.4** **ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා ගැලපීම - මුළු අයිතම**

| විස්තර කිරීම | කාර්යාල උපකරණ | පිරියත හා යන්ත්‍රෝපකරණ | ඉගැන්වීමේ උපකරණ | ගෘහ භාණ්ඩ සහ උපාංග | පුස්තකාල පොත් | ක්‍රීඩා අයිතම | උපාධි ලෝගු හා වස්ත්‍රාභරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පෙර වසරේ බැහැර කිරීමේ එකතු කිරීම - JE/377 | 77,491,605 | 583,053 | 143,079,045 | 53,791,589 | 714,670 | 697,417 | 9,050,341 | 285,407,719 |
| පෙර වසර (2023) සඳහා බැහැර කිරීම - JE/375 | (1,989,059) | (48,053) | (3,114,453) | (7,105,899) | - | (697,417) | (14,825) | (12,969,705) |
| | **75,502,546** | **535,000** | **139,964,592** | **46,685,690** | **714,670** | **-** | **9,035,516** | **272,438,014** |
| | | | | | | | | |
| බැහැර කිරීමේ එකතු කිරීම සඳහා පෙර වසරේ ක්ෂයවීම - JE/378 | 72,585,199 | 583,053 | 140,534,757 | 45,412,241 | 714,670 | 697,417 | 8,819,037 | 269,346,374 |
| බැහැර කිරීම සඳහා පෙර වසරේ ක්ෂයවීම් - JE/376 | (1,904,731) | (48,053) | (3,111,831) | (7,097,833) | - | (697,417) | (14,825) | (12,874,690) |
| ක්ෂයවීම බැහැර කිරීමේ එකතු කිරීම සඳහා 2023 වසර JE/393 | 5,129,639 | 373 | 3,665,280 | 3,019,347 | - | - | 196,400 | 12,011,039 |
| සමුච්චිත අක්‍රියකරණයට වෙනස්කම් | **75,810,108** | **535,373** | **141,088,206** | **41,333,754** | **714,670** | **-** | **9,000,612** | **268,482,723** |
| 2023 දී බැහැර කිරීමේ ගැලපුම් අහිමි වීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට සිදු වූ වෙනස්කම් | | | | | | | | 15,966,330 |
| 2023 දී බැහැර කිරීමේ ගැලපුම් අහිමි වීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට සිදු වූ වෙනස්කම් | | | | | | | | 12,011,039 |
| 2023 දී බැහැර කිරීමේ ගැලපීම් හේතුවෙන් සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට සිදු වූ ශුද්ධ වෙනස්කම් | | | | | | | | **3,955,291** |

**31.5** **පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන**

| | 2023 වාර්තා කරන ලදී | 2023 (නැවත ප්‍රකාශය) | | නිවැරදි කිරීම |
|---|---|---|---|---|
| | රු. | රු. | | රු. |
| 2023.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන | 150,326,884 | 173,923,589 | | 23,596,706 |
| 2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය වන විට පවතින මුළු ප්‍රතිපාදනය | 82,212,041 | 77,521,640 | JE/314 | (4,690,402) |
| 2023.12.31 වසර සඳහා ප්‍රතිපාදන යටතේ | 68,114,843 | 96,401,950 | | 28,287,107 |
| | | | | |
| 2023 වර්ෂයේදී ගෙවීමට අපේක්ෂිතයි (වත්මන්) | - | 20,612,340 | | |
| පසුකාලීන කාල පරිච්ඡේදයට අදාළ (වත්මන් නොවන) | 150,326,884 | 153,311,250 | | |
| 2023.12.31 දිනට ප්‍රතිපාදන ඉදිරියට ගෙන යන ලදී. | 150,326,884 | 173,923,590 | | |

**31.6**

| | |
|---|---|
| 2024.01.01 දිනට සමුච්චිත අරමුදල (වාර්තා කරන ලදී) | 65,913,655 |
| 2024 දී ආපසු ගෙවන ලද 2023 වර්ෂයේ අයදුම්පත් ගාස්තු සඳහා ගැලපීම. | 20,500 |
| 2024.01.01 දිනට සමුච්චිත අරමුදල (නැවත පිහිටුවන ලදී) | 65,893,155 |

## 2024.12.31 දිනට පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන

**ගණනය කිරීම**

i මාසික වැටුප = මූලික වැටුප + C.O.L.A. + අධ්‍යයන දීමනාව හෝ MCA (පාරිතෝෂිතයට අදාළ වැටුප)
ii කාර්ය මණ්ඩල පිරිවැටුම = ද්‍රව්‍යමය නොවේ
iii පොලිය 11.47 % = භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවන ලද පොලිය

| **% වාර්ෂික සාමාන්‍ය වැටුප බඳවා ගන්නන්** | | | | | |
|---|---|---|---|---|---|
| | **වැටුප්** | **ජීවන වියදම් දීමනාව** | අධ්‍යයන දීමනාව හා මාසික හිලව් දීමනාව | එකතුව % | අ.වා.සා.වැටුප |
| අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය | 2% | 1% | 1.50% | 4.50% | **0.045** |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1.50% | 1% | 0.45% | 2.95% | **0.030** |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 2% | 1% | 0.45% | 3.45% | **0.035** |

**සූත්‍රය**
අතීත සේවය*වැටුප්*R(අනාගත සේවය/2)

R = 1+%අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප බඳවා ගන්නන් (EAASI)/1+% ගැලපුම් කළ වට්ටම් අනුපාතය

| **කාර්ය මණ්ඩල කාණ්ඩය** | **R** | **1+අ.වා.සා.වැටුප%** | **1+ITB%** | **R** |
|---|---|---|---|---|
| අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය | 1.045/1.1147 | 1.045 | 1.1147 | **0.9375** |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1.030/1.1147 | 1.030 | 1.1147 | **0.9240** |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 1.035/1.1147 | 1.035 | 1.1147 | **0.9285** |

## 2024.12.31 දිනට පාරිතෝෂිත ප්‍රතිපාදන (සාරාංශය)

| | |
|---|---|
| අධ්‍යයන (නර්තන සහ නාට්‍ය) | 74,356,033.51 |
| අධ්‍යයන(සංගීතය) | 72,779,663.61 |
| අධ්‍යයන(දෘශ්‍ය කලා) | 44,423,688.82 |
| අධ්‍යයන සහායක IT + අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය | 23,062.06 |
| විධායක කාර්ය මණ්ඩලය | 12,147,361.57 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(සංගීතය) | 4,826,786.20 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(දෘශ්‍ය කලා) | 371,068.19 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(නර්තන සහ නාට්‍ය) | 2,702,277.34 |
| ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි | 20,121,940.49 |
| සුළු කාර්ය මණ්ඩලය | 7,271,668.44 |
| **2024.12.31 සඳහා මුළු ප්‍රතිපාදනය** | **239,023,550.23** |

| | | | | |
|---|---|---|---|---|
| | 2024.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන | | | **239,023,550.23** |
| | 2023/12/31 දිනට ශේෂය | | 173,923,589.37 | |
| (-) | **2024 කාලය තුළ සිදු කරන ලද ගෙවීම (2024.12.31 දක්වා)** | | 15,745,372.68 | |
| | I.S.ඩයස් | 527,618.00 | | |
| | K.P.D.කුලතුංග | 541,714.25 | | |
| | K.M.P.මදුරංග | 619,886.25 | | |
| | D.W.A.රංගදේව | 1,859,299.50 | | |
| | W.A.A.M.වික්‍රමසිංහ | 5,471,186.80 | | |
| | H.H.ලියනආරච්චි | 655,178.00 | | |
| | W.A.K.J.වලහපිටිය | 780,140.25 | | |
| | K.A.S.ප්‍රියලාල් | 350,109.38 | | |
| | R.A.S.P.රූපසිංහ | 1,483,416.00 | | |
| | R.A.ගුණපාල | 3,456,824.25 | | |
| | 2024.12.31 දිනෙන් අවසන් වන වර්ෂය වන විට පවතින මුළු ප්‍රතිපාදනය) | | | 158,178,216.69 |
| | **2024.12.31 වර්ෂය සඳහා ප්‍රතිපාදන යටතේ** | | | **80,845,333.54** |
| | **2024 වර්ෂයේදී ගෙවීමට අපේක්ෂිතයි (වර්තමාන)** | | | **7,699,020.35** |
| | **පසුකාලීන කාල පරිච්ඡේදයට අදාළ (වත්මන් නොවන)** | | | **231,324,529.88** |
| | | | | **239,023,550.23** |

***2023.12.31 දිනට පාරිතෝෂික ප්‍රතිපාදන (නිවැරදි කරන ලදී)***

**ගණනය කිරීම**

i මාසික වැටුප = මූලික වැටුප + C.O.L.A. + අධ්‍යයන දීමනාව හෝ MCA (පාරිතෝෂිතයට අදාළ වැටුප)

ii කාර්ය මණ්ඩල පිරිවැටුම = ද්‍රව්‍යමය නොවේ

iii පොලිය 12.70 % = භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ගෙවන ලද පොලිය 2023 දෙසැම්බර් 29

**% වාර්ෂික සාමාන්‍ය වැටුප බඳවා ගන්නන්**

| | **වැටුප්** | **ජීවන වියදම් දීමනාව** | අධ්‍යයන දීමනාව හා මාසික හිලව් දීමනාව | **මුළු %** | අ.වා.සා.වැටුප |
|---|---|---|---|---|---|
| අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය | 2% | 1% | 1.50% | 4.50% | **0.045** |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1.50% | 1% | 0.45% | 2.95% | **0.030** |
| අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | 2% | 1% | 0.45% | 3.45% | **0.035** |

**සූත්‍රය**

අතීත සේවය*වැටුප්*R^අනාගත සේවය/2

R = 1+%අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප බඳවා ගන්නන් (EAASI)/1+% ගැලපුම් කළ වට්ටම් අනුපාතය

| **කාර්ය මණ්ඩල කාණ්ඩය** | **R** | **1+අ.වා.සා.වැටුප%** | **1+ITB%** | **R** |
|---|---|---|---|---|
| අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය | 1.045/1.1270 | 1.045 | 1.1270 | **0.9272** |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1.030/1.1270 | 1.030 | 1.1270 | **0.9139** |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 1.035/1.1270 | 1.035 | 1.1270 | **0.9184** |

**2023.12.31 දිනට පාරිතෝෂිත ප්‍රතිපාදන (සාරාංශය)**

| | |
|---|---|
| අධ්‍යයන (නර්තන සහ නාට්‍ය) | 51,035,597.26 |
| අධ්‍යයන(සංගීතය) | 52,929,581.29 |
| අධ්‍යයන(දෘශ්‍ය කලා) | 23,700,745.18 |
| අධ්‍යයන(Library) | 5,964,138.51 |
| අධ්‍යයන(E.L.T.U.) | 1,020,764.50 |
| අධ්‍යයන (I . T ) | 1,727,439.69 |
| අධ්‍යයන සහායක IT + අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය | 171,082.89 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 11,199,761.06 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(සංගීතය) | 3,166,672.06 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(දෘශ්‍ය කලා) | 262,744.42 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය(නර්තන සහ නාට්‍ය) | 1,644,410.28 |
| ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි | 16,057,240.31 |
| සුළු කාර්ය මණ්ඩලය | 5,043,411.92 |
| **2024.12.31 සඳහා මුළු ප්‍රතිපාදනය** | **173,923,589.37** |

| | | | |
|---|---|---|---|
| | 2023.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන | | **173,923,589.37** |
| | 2022/12/31 දිනට ශේෂය | 105,099,346.77 | |
| (-) | **2023 කාලය තුළ සිදු කරන ලද ගෙවීම (2023.12.31 දක්වා)** | 27,577,707.27 | |

| | | |
|---|---|---|
| | S.අලුත්ගේ | 508,952.38 |
| | I.රූපසිංහ | 1,245,527.62 |
| | S.රාජපක්ෂ | 574,847.50 |
| | W.M.A.I.විජේකෝන් | 139,578.13 |
| | N.G.Y.P.K.ගමගේ | 326,211.88 |
| | A.D.I.A.එරන්දනී | 278,436.38 |
| | R.S.ජයලත් | 402,016.88 |
| | දුමිත් ඉන්දික | 1,389,248.40 |
| | P.D.R.ප්‍රනාන්දු | 7,773,088.05 |
| | K.A.H.A.B. රත්නසේකර | 6,399,558.85 |
| | S.P.සුමතිපාල | 5,284,432.00 |
| | L.L.R.N.ආරියදාස | 484,714.50 |
| | D.K.M.C.M.B.නවරත්න | 281,331.25 |
| | K.G.C.S.සෙනවිරත්න | 121,996.88 |
| | A.D.A.S.සිල්වා | 456,641.50 |
| | B.G.R.T.කුලතුංග | 320,010.00 |
| | G.S.S.ආරියදාස | 281,331.30 |
| | D.M.H.දිසානායක | 469,958.62 |
| | M.N.D.D.E.සොයිසා | 121,090.65 |
| | S.D.P.N.K.ගුණසේන | 718,734.50 |

| | |
|---|---|
| 2023.12.31 දිනෙන් අවසන් වන වර්ෂය වන විට පවතින මුළු ප්‍රතිපාදනය) | 77,521,639.50 |
| **2023.12.31 වර්ෂය සඳහා ප්‍රතිපාදන යටතේ** | **96,401,949.87** |
| **2023 වර්ෂයේදී ගෙවීමට අපේක්ෂිතයි (වර්තමාන)** | **20,612,339.56** |
| **පසුකාලීන කාල පරිච්ඡේදයට අදාළ (වත්මන් නොවන)** | **153,311,249.81** |
| | **173,923,589.37** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/B/UVPA/2024/FA/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 ජුනි 09 දින.

උපකුලපති,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ජී.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 01. ලේකම් - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම් - මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/B/UVPA/2024/FA/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 ජූනි 09 දින

උපකුලපති

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය හා 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1979 අංක 11 දරන සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.742,035,590 ක් දේපල පිරියත, උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයේ පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංගීත හා නර්ථන පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම ප්‍රමාද වීම මත 2023 සහ 2024 වර්ෂවල කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද ප්‍රමාද ගාස්තු රු.40,750,130 ක් විශ්වවිද්‍යාලය විසින් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව ගොඩනැගිලි ගිණුමේ ශේෂය එම අගයෙන් හා වර්ෂයේ අතිරික්තය රු.28,734,873කින් හා සමුච්චිත අතිරික්තය රු.11,015,257කින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉතිරි කිරීමේ ගිණුම් 06 ක ශේෂය රු.17,562,844 ක් වුවද ශේෂ සනාථ කිරීම් ලිපි අනුව එම ශේෂය රු.252,296,011 ක් වූයෙන් රු.234,733,167ක නොසැසඳීමක් පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් දීර්ඝ කාලය සිට පැවත එන නිරවුල් නොකල ප්‍රාග්ධන අත්තිකාරම් ගිණුමේ රු.2,759,624 ක් වූ ශේෂයට අදාල උපලේඛන හා විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 විශ්වවිද්‍යාලයේ **2024** වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුලත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන 'පිළිබඳ මාගේ විගණනයට' අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103,104 | 2023 ජූනි මාසයේ අභ්‍යන්තර විගණන වාර්තාව මගින් අනාවරණය වී තිබූ රු.1,097,359 ක් පමණ වටිනා පුස්තකාල පොත් 3,940 ක් අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ·2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) ඡේදය | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති සුභසාධන වැඩසටහන් වෙනුවෙන් සිදුකරන වෙන් කිරීම් නතර කළ යුතු වුවද අනුමැතියකින් තොරව සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,836,125 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇමතූ චක්‍රලේඛ ලිපියේ 05 වන ඡේදය | බැඳුම්කර කඩ කිරීම් තුලින් භාණ්ඩාගාරයට ආචාරවරයෙකුගෙන් අයකරගෙන තිබූ රු.970,068ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) 2022 වර්ෂයේ නර්තන පීඨය වෙනුවෙන් වසර 03 ක් සඳහා බදු පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ලක් සඳහා වසර 02 ක කුලිය ඇතුළුව අනෙකුත් ආරම්භක වියදම් සමඟ එකතුව රු.116,845,954 ක මුදලක් ද කාමර වෙන්කිරීම (Partition), කාපට් දැමීම වැනි ගොඩනැගිල්ල සුදුසු තත්වයට පත් කිරීම සඳහා රු. 28,726,084 ක් ද වැය කර තිබුණි. මෙම ගොඩනැගිල්ල වසරක පමණ පූර්ව උපයෝජනයෙන් පසුව ප්‍රදේශවාසීන් විසින් අධික බෙර ශබ්දය සම්බන්ධයෙන් කරන ලද පැමිණිලි හේතුවෙන් වසර 02 කට පසු ගිවිසුම අවසන් කර තිබුණි. විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාව සම්බන්ධයෙන් නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව මෙම ගොඩනැගිල්ල බද්දට ගැනීම හේතුවෙන් දරන ලද රු. 28,726,084 ක වියදම අනාර්ථික වී තිබුණි. එම ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද රු.1,050,000 ක් වූ Exhaust Fan 27 ක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව ගබඩා කර තිබුණි.

(ආ) ගෙවිය යුතු ශිෂ්‍යාධාර ගිණුමෙහි 2023 වර්ෂයේ සිට පැවත එන රු.4,709,495 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බාහිර පාඨමාලා ආදායම් සඳහා භාවිතා කල ජංගම ගිණුමෙහි වර්ෂාරම්භ දිනට රු.11,095,033ක ශේෂයක් පැවති අතර වර්ෂාවසාන දිනට එම ගිණුමේ ශේෂය රු.22,102,236 ක් වී ඇතත් සුදුසු පරිදි ආයෝජන මාර්ගවල යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පවත්වාගෙන ගොස් තිබුණි.

(ඈ) පෙර වර්ෂයේදී වෙනත් ගෙවිය යුතු වියදම් ලෙස හඳුනාගෙන ඇති රු.11,536,153 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2023 වර්ෂයේ දෙහිවල ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද වායු සමීකරණ යන්ත්‍ර 06ක් භාවිතා කිරීමකින් තොරව ගබඩාකර තිබුණි.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ. බ.)

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
கட்புல ஆற்றுகைக் கலைகள் பல்கலைக்கழகம்
UNIVERSITY OF THE VISUAL & PERFORMING ARTS
21, Albert Crescent, Colombo 07, Sri Lanka
Tel. : +94 112 033 710 Fax : +94 112 696 972
E-mail : info@vpa.ac.lk Web. : www.vpa.ac.lk

INTERNAL AUDIT DIVISION
21, Albert Crescent, Colombo 07, Sri Lanka
Tel. : +94 112 026 785 / 6
Fax : +94 112 696 972
E-mail : int.audit.uvpa@gmail.com

මගේ අංකය : ඔබේ අංකය : දිනය :

My No : UVPA/IA/NAO/2024 Your No. : Date : 2025.07.11

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 07ට වැඩිමනත් වශයෙන් 2023.12.15 දින ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ජාතික විගණන කාර්යාලය වෙත ධාරණ අගය ශුන්‍ය වූ වත්කම් සම්බන්ධයෙන් නිකුත් කරන ලද ක්‍රියාමාර්ග වලට අදාළව, දැනටමත් ධාරණ අගය ශුන්‍ය "0" ලෙස හඳුනාගෙන ඇති අයිතමයන් තවදුරටත් එලෙසම ධාරණ අගය ශුන්‍ය "0" ලෙස පවත්වා ගෙන යා හැකි බවත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් පමණක් ප්‍රමාණවත් බව දක්වා ඇත. ඒ අනුව රු. 742,035,590 ක් වූ ධාරණ අගය ශුන්‍ය "0" වූ වත්කම් සම්බන්ධයෙන් සටහන් අංක 2.11.3 යටතේ හෙළිදරව් කිරීම් සිදුකොට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇත. වටිනාකම ශුන්‍ය නොවූ වත්කම් වල ඵලදායී ජීව කාලය වර්ෂයෙන් වර්ෂයට නැවත සමාලෝචනය කරමින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 07හි ඡේද අංක 35හි වත්කමක පිරිවැය මැනීමේදී, අදාළ වත්කමේ පිරිවැය "ගෙවීම් සාමාන්‍ය ණය කොන්දේසි වලින් ඔබ්බට විලම්භනය කරනු ලබන්නේ නම් මුදලට ගැනුම් මිල හා මුළු ගෙවීම් අතර වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 04 ප්‍රකාරව විකල්ප ක්‍රමය භාවිතා කරන්නේ නම් හැර අදාළ වියදම පොලී වියදම ලෙස හඳුනාගත යුතුය". ඒ අනුව අප විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 04 ප්‍රකාරව අදාළ පොලී වියදම ඉඩ දුන් විකල්ප ක්‍රමය භාවිතා කරමින් රු.40,750,130 ක් වූ ගෙවන ලද පොලී මුදල එම වත්කමේ පිරිවැය ලෙස හඳුනාගෙන ගොඩනැගිල්ලේ පිරිවැය සමග ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කර ඇත.

"To enrich the cultural life of humankind"

තවද මෙම පොළී මුදල කොන්ත්‍රාත් ගිවිසුමේ 14.6 වගන්ති ප්‍රකාරව කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම් ගතව ඇති අතර මහා භාණ්ඩාගාරයේ මුදල් නිසි පරිදි නොලැබීම මත මෙම ප්‍රමාද පොළී මුදල් රු.40,750,130 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට සිදුව ඇත.

ඉහත අංක HED/D/UVPA/2024/FA/02 හා 2025.06.09 දිනැති විගණකාධිපති වාර්තාවෙහි සඳහන් කර ඇති මෙම පොළී වියදම දරණ ලද වර්ෂයට අදාළව වියදමක් ලෙස 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අතීතයට බලපාන පරිදි ගැලපුම් කර ආදායමට එරෙහිව කපා හැර මූල්‍ය ප්‍රකාශනවල හෙළි දරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපි අංක 02/2019 ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ සියලුම ජංගම ගිණුම් රාත්‍රී කාලීන ආයෝජන ගිවිසුම් වලට සම්බන්ධ කළ යුතුවේ. තවද 2017 වර්ෂයේ විගණන වාර්තා මගින් අදාළ ජංගම ගිණුම් ශේෂයන් ආයෝජනය සම්බන්ධයෙන් විමසීම් සිදු කර ආයෝජනය සඳහා උපදෙස් ලබා දී ඇත. මේ අනුව විශ්වවිද්‍යාලයේ සියලුම ජංගම ගිණුම් වලට අදාළව ඉතිරිකිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර අදාළ ආයෝජන සඳහා ලැබෙන පොලී ආදායම පමණක් මෙම ඉතිරිකිරීම් ගිණුම් වල ශේෂය මගින් නිරූපණය වේ. නමුත් බැංකු සනාථන ලිපි වල 2024.12.31 දිනට අදාළ ජංගම ගිණුම් වල පවත්නා ශේෂයන් ඉතිරිකිරීමේ ගිණුම් වලට හුවමාරු වූ පසු ශේෂය දක්වා නිකුත් කරනු ලැබ ඇත. මේ අනුව, රු.17,562,844 ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව ඉතිරි කිරීමේ ගිණුම් 06ක ශේෂය වන අතර බැංකු සනාථන ලිපි අනුව එය රු.252,295,414 ක් වේ. තවද සෑම ඉතිරිකිරීමේ ගිණුමක් වෙනුවෙන්ම වෙන වෙනම සැසඳුම් වාර්තා පිළියෙළ කරනු ලබයි.

ඈ) එකග වේ. මෙම මූලධන අත්තිකාරම් 2009 සිට පැවත එන ශේෂයක් වන අතර මේ වන විට අදාළ ශේෂය පරීක්ෂා කර නිවැරදි කර ඇත.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2.2.2

(අ) පුස්තකාල ප්‍රවේශපත් ලේඛනය 1953 වසරේ සිට ආරම්භ කර පවත්වාගෙනයනු ලබයි (Book Accession Register). වර්තමානය වන විට ස්ථාන ගණනාවකට මාරුකර ඇත. 2024 වර්ෂය දක්වා ශාඛා පුස්තකාල 03 ක් පැවති අතර වර්තමානයේ ප්‍රධාන පුස්තකාලය සහ එක් ශාඛා පුස්තකාලයක් ඇත. ඒ අනුව අදාළ අස්ථානගතවීම් පිළිබඳව වගකිව යුත්තන් පිළිබඳව අධ්‍යයනය කරමින් සිටී.

මේ වන විට 2024 වර්ෂය සඳහා වන තොග සංගණනය UGC Commission Circular 01/2022 චක්‍රලේඛය අනුව සිදු කර ඇති අතර එමගින් එතෙක් කරන ලද සංගණනවල පැවති දුර්වලතා මගහරවා ගැනීමටත් අදාළ චක්‍රලේඛය අනුව හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

(ආ) සියළුම රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා රක්ෂණාවරණයක් රජය මගින් ලබා දෙන අතර විශ්වවිද්‍යාල සඳහාද විවිධ අරමුදල් මගින් රක්ෂණාවරණය සපයනු ලබයි. ඒ අනුව, මෙම විශ්වවිද්‍යාලයද අඛණ්ඩ පරිචයක් ලෙස විශ්වවිද්‍යාල අරමුදලට දායක වන තම සේවකයින් සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ලබා ගනිමින් සිටියි. මෙහිදී විශ්වවිද්‍යාලය විසින් වාරික ගෙවීම සඳහා උපයන ලද අරමුදල් භාවිතා කරනු ලබයි. එම මුදල් ප්‍රමාණවත් නොවන හෙයින් යම් ප්‍රතිශතයක් රක්ෂණ ක්‍රමයට දායක වන සේවකයින් විසින් දරණු ලබයි. 2025 වසරේදී රක්ෂණ ක්‍රමය සඳහා 59% ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය දායක වූ අතර ඉතිරි 41% සේවකයා විසින් දරණු ලැබිය. මෙය උපයාගන්නා අරමුදල් ප්‍රමාණය අනුව විචල්‍යය වේ. 2020.08.28 දින නිකුත් කරන ලද අංක 01/2020 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයේ සහ 2020.10.13 දින නිකුත් කරන ලද අංක 07/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මුල්‍ය චක්‍රලේඛයේ විධිවිධාන යටතේ සේවක වෛද්‍ය රක්ෂණ පහසුකම් සැපයීම සිදු කෙරේ. සලකා බලන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල සේවකයින් හට වෛද්‍ය රක්ෂණ සැපයුම්කරු රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව තෝරා ගනු ලබයි.

මේ සඳහා උපයෝගී කරගෙන ඇත්තේ විශ්වවිද්‍යාලයේ ඇති සන්නිවේදන කුළුනු මාර්ගයෙන් උපයාගෙන ඇති ආදායම වේ. මේ සඳහා නිසි පරිදි මුදල් කමිටු සහ පාලන සභා අනුමැතීන් ලබාගෙන ඇත.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 හි "All receipts on a accounts of the violation of agreements and bonds shall be invested in interest earning asset such as fixed deposits and treasury bill and only the interest earn from such investment should be utilize for disbarment" වගන්ති ප්‍රකාරව බැඳුම්කර කඩකරන ලද ආචාර්යවරුන්ගෙන් අයකර ගන්නා ලද මුදල් පොළී උත්පාදනය කරනු ලබන අරමුදලක තැන්පත් කර පවත්වා ගෙන යනු ලැබිය යුතුය. එබැවින් සමාලෝචිත වර්ෂය තුල දී බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අය කර ගන්නා ලද රු.970,068 ක් වූ මුදල ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කරනු ලැබ ඇත.

2.3 **වෙනත් කරුණු**

(අ) නර්තන හා නාට්‍ය කලා පීඨයේ සිසුන් 400 ක පමණ ප්‍රමාණයක අධ්‍යයන කටයුතු පවත්වාගෙන යනු ලැබුයේ කොහුවල ප්‍රදේශයේ පිහිටා තිබූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් ගොඩනැගිල්ලකය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් එම පරිශ්‍රය නැවත ලබා දෙන ලෙස දිගින් දිගටම ඉල්ලීම් කර තිබුණි. ඒ අනුව මෙම කොහුවල පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලැබූ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබා ගැනීමට පාලක සභාව අනුමත කර තිබුණි. ඒ අනුව අවස්ථා කිපයකදී ගොඩනැගිල්ලක් කුලී පදනමට හෝ මිලට ගැනීමට පුවත් පත් දැන්වීම් මගින් මිල ගණන් කැඳවා ඇත. එහෙත් එම අවස්ථාවන් වලදී ඉදිරිපත් කර තිබූ ලංසු පවතින රෙගුලාසි වලට එකඟ නොවීම, අදාල නියමිත කාල පරාසය තුලදී අදාළ ලේඛන නොතිබීම, නීත්‍යානුකූල හිමිකම් තහවුරු කර ගැනීමේදී රාජ්‍ය ආයතන විසින් ඒවා නුසුදුසු බව දන්වා සිටීම වැනි හේතූන් මත මේ සඳහා සුදුසු තත්වයේ ගොඩනැගිල්ලක් අතරින් තෝරා ගැනීමට හැකියාවක් නොලැබිණි.

කොහුවල පරිශ්‍රය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත කඩිනමින් භාරදෙන ලෙස වරින් වර සිහිකැඳවීම් කර තිබු බැවින් 2021 වසරේදී ඉඩම් හා ගොඩනැගිලි කළමණාකරණ කමිටුව විසින් නැවත වරක් අවශ්‍යතාවය පිළිබඳ පරීක්ෂා කර බලා වර්ග අඩි ප්‍රමාණය වැඩි කර නැවත වරක් 2021 වසරේදී ප්‍රසිද්ධ පුවත් පත් දැන්වීමක් මඟින් මිල ගණන් කැඳවා ඇත. ඒ අනුව ලබාදී ඇති ලංසු අතරින් විශ්වවිද්‍යාලයට වඩා සුදුසු යැයි නිර්දේශ වූ ගොඩනැගිල්ල ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අනුව කුලී පදනම මත ලබාගෙන ඇත.

මෙම ගොඩනැගිල්ලෙහි අධ්‍යයන කටයුතු වසර දෙකකින් පසු පවත්වාගෙන නොයාමට හේතු වූයේ අධික උෂ්ණුසුම් කාලගුණය හා වාතාශ්‍රය ප්‍රමාණවත් නොවීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා භාවිතයේදී ඇති වූ ප්‍රායෝගික ගැටළු මතය.

නර්තන හා නාට්‍ය කලා පීඨයේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා සුදුසු ආකාරයට ශබ්ද ප්‍රතිරෝධක කාමර වෙන්කිරීම් සහ වායු සමන යන්ත්‍ර සවි කිරීමට ගොඩනැගිල්ල අයිතිකරුගෙන් විමසන ලදී. එම කටයුතු ගිවිසුම්ගත මුදලට ඉටුකිරීමට ගොඩනැගිලි හිමිකරු එකඟ නොවූ බැවින් විශ්වවිද්‍යාලය විසින් එම කාර්යයන් ඉටුකර ඇත.

කෙසේ වෙතත් අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය ශබ්ද ප්‍රතිරෝධක කාමර වෙන් කිරීම් සිදු කරන ලද්දේ එම ගොඩනැගිල්ලෙන් ඉවත්වීමේදී ඒවාද ඉවත් කර වෙනත් ස්ථානයකට සවිකිරීමට හැකිවන පරිදිය. වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොතිබූ බැවින්, එම අවස්ථාවේ ඒ වෙනුවට මනා වාතාශ්‍රයක් ලබා ගැනීම සඳහා Exhaust Fan සවි කරන ලදී. ඒ අනුව කුලී එකඟතාව අවසන්වීමෙන් පසු විශ්වවිද්‍යාලය මඟින් සිදු කරනු ලැබූ කාමර වෙන් කිරීම් සහ Exhaust Fan නැවත භාවිතා කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාලය වෙත ගෙනැවිත් ගබඩාකර ඇත.

ඉන් අනතුරුව විශ්වවිද්‍යාලයේ විවිධ අංශ මගින් කරනු ලබන නඩත්තු ඉල්ලීම් වලට අදාළ අලුත්වැඩියා කටයුතු සඳහා එම Partition කොටස් නැවත උපයෝගී කර ගන්නා ලද අතර ඉතිරි ප්‍රමාණය ඉදිරියේදී අලුත්වැඩියා කටයුතු සඳහා භාවිතා කිරීමට ආරක්ෂිතව ගබඩා කර ඇති බැවින් දෙහිවල ගොඩනැගිල්ල බද්දට ගැනීම හේතුවෙන් ශබ්ද ප්‍රතිරෝධක යොදා පත්ති කාමර වෙන්කිරීම, කාපට් දැමීම වැනි කාර්යයන් සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වී නොතිබුණි.

දෙහිවල ගොඩනැගිල්ලේ සවිකර තිබු Exhaust Fan තිහ (30) නඩත්තු අංශය මඟින් ගලවා ප්‍රධාන පරිශ්‍රයේ නඩත්තු අංශ ගබඩාවේ ගබඩා කර ඇත. මේ වන විට ඉන් 03 ක් දෘශ්‍ය කලා පීඨ පරිශ්‍රයේ අවශ්‍යතාව පරිදි සවි කොට ඇති අතර, ඉතිරි ඒවා විවිධ අංශ වලින් ලැබෙන ඉල්ලීම් වලට අනුව සවි කිරීම සඳහා නඩත්තු අංශයේ ගබඩා කොට ඇත.

(ආ) රු.4,709,495 ක් ලෙස ශිෂ්‍යාධාර ගිණුමෙහි සඳහන් මුදල අදාළ ශිෂ්‍යාධාර ලැබිය යුතු ශිෂ්‍යයන් හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම් මේ වන විටත් සිදු කර ඇත.

(ඈ) මෙහි සඳහන් ගිණුම් අංක 84072227 දරණ ගිණුමට ප්‍රේෂණය කරණු ලබනුයේ විශ්වවිද්‍යාලය වෙත සිදුකුරනු ලබන නේවාසිකාගාර ගාස්තු, ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, ආපසු නොගෙවන ලබන ටෙන්ඩර් තැන්පතු, සැපයුම් කරුවන් ලියාපදිංචි ගාස්තු වැනි විවිධ ආදායම් වේ. මේ අනුව ගිණුමේ ඇති ශේෂයද උක්ත රාත්‍රී කාලීන ආයෝජන ගිණුමට අදාළව ඉතිරි කිරීමේ ගිණුම් අංක 86608388 හරහා ආයෝජනය කරනු ලබයි. තවද අදාළ ආයෝජනය මගින් 2024 වසර තුල රු. 862,167 පොලී ආදායමක් උපයා ඇත. වරින්වර ආයාජන ගිණුම් වල ශේෂය පරීක්ෂා කර නව ස්ථාවර තැන්පතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) මෙහි සඳහන් රු.11,536,153 ක් වූ පහත සඳහන් ගිණුම් 07 පෙර වර්ෂයේ සිදුකරන ලද ගෙවිය යුතු වියදම් ලෙස දක්වා ඇත.

| | රු | |
|---|---|---|
| Bursary (Payable/Receivable) Account | 4,709,495 | රු. 4,709,495 ක් ලෙස ශිෂ්‍යාධාර ගිණුමෙහි සඳහන් මුදල අදාළ ශිෂ්‍යාධාර ලැබිය යුතු ශිෂ්‍යයන් හඳුනාගෙන අදාළ නිවැරදි කිරීම් මේ වන විටත් සිදු කර ඇත. |
| Research Symposium | 1,101,643 | ගෙවිය යුතු වියදම් ලෙස දක්වා ඇති මෙම ගිණුම් විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද පර්යේෂණ පරිසංවාද හා සම්මන්ත්‍රණ සඳහා බාහිර පාර්ශවයන් වෙතින් අය කරන ලද මුදල් වේ. එම අදාළ කාර්යයන් සම්බන්ධයෙන් තවදුරටත් ගෙවිය යුතු වියදම් පවතී දැයි හඳුනාගැනීමට අදාළ අංශ හා පීඨ මගින් සනාථන ලිපි මේ වනවිටත් කැඳවා ඇති අතර අදාළ ලිපි ලද පසුව මේ සම්න්ධයෙන් නිස පරිදි කටයුතු කරනු ලැබේ. |
| ISME Conference | 579,610 | |
| ICFM Music Faculty | 169,143 | |
| ICH Research Symposium | 41,260 | |
| "Dead Men Don't Lie" Short Drama | 244,600 | |
| Gratuity Payable | 4,690,402 | විශ්වවිද්‍යාලයේ සේවය කරනු ලැබූ K.L.C. පෙරේරා මිය වෙත ගෙවිය යුතු පාරිතෝෂිත ගෙවීම සඳහා හිමිකම් කිවයුතු ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට අදාළව නීතිමය කටයුතු අවසන්වනතුරු මෙම මුදල ගෙවියයුතු ලෙස රඳවාගෙන ඇත. |

(ඉ) කොහුවල පරිශ්‍රයේදී භාවිතා කරන ලද පැරණි හා භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවති වායු සමීකරණ යන්ත්‍ර දෙකිවල පරිශ්‍රය වෙත රැගෙන ගිය අතර එම වායු සමීකරණ යන්ත්‍ර දෙකිවල පරිශ්‍රයෙන් ඉවත් වීමත් සමඟම අනෙකුත් භාණ්ඩ සමග නර්තන හා නාට්‍ය කලා පීඨ කොළඹ පරිශ්‍රය වෙත රැගෙන එන ලදී. මෙම පැරණි වායු සමීකරණ යන්ත්‍ර තත්ත්ව පරීක්ෂාවට අනුව ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති බව තහවුරු වී ඇත.

මහාචාර්ය රොහාන් නෙත්සිංහ
උපකුලපති

මහාචාර්ය රොහාන් නෙත්සිංහ
උපකුලපති
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07.
ශ්‍රී ලංකාව.